
# ශ්‍රී ලංකා ජාතික ඒකාබද්ධ සූචිය

## ආරම්භය හා විකාශනය
## (1986 - 2007)



Director

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය

# ශ්‍රී ලංකා ජාතික ඒකාබද්ධ සූචිය

## ආරම්භය හා විකාශනය 1986-2007

සම්පාදනය

ප්‍රලේඛන සේවා අංශය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය

© ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය - 2007

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සූචිකරණ දත්ත

ශ්‍රී ලංකා ජාතික ඒකාබද්ධ සූචිය : ආරම්භය හා විකාශනය 1986-2007. - කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2007.
පි. 60 : වගු, රූපසටහන්; සෙ. මී. 30

ISBN 978-955-8383-43-8

i. 025.31 ඩිවි 22
1. ඒකාබද්ධ සූචිය

ii. ග්‍රන්ථ නාමය
2. පුස්තකාල විද්‍යාව

ප්‍රකාශනය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය
අංක 14
නිදහස් මාවත
කොළඹ 07

# පෙරවදන

ජාතික ඒකාබද්ධ සූචියක් පවත්වාගෙන යාම ලෝකයේ ඕනෑම රටක ජාතික පුස්තකාලයකට පැවරෙන වගකීමක් බව ජාත්‍යන්තර වශයෙන් පිළිගෙන ඇත. ඒ අනුව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය මගින් ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය ප්‍රධාන ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙන යනු ලැබේ. ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශ රටවල ද පර්යේෂණ කාර්යයන් හි නියුතු විද්වතුන්ට, සිසු පරපුරට මෙන්ම සාමාන්‍ය පාඨකයාට ද මේ මගින් ලබාගත හැකි ප්‍රයෝජන විශාලය. දැනට අපගේ ජාතික ඒකාබද්ධ සූචිය අන්තර්ජාලයට ද සම්බන්ධ කර ඇති නිසා ලෝකයේ ඕනෑම අයෙකුට මෙයට ප්‍රවේශ විය හැකිය. 1986 දී ආරම්භ කරන ලද ශ්‍රී ලංකා ජාතික ඒකාබද්ධ සූචිය අද වනවිට ලබාගෙන ඇති ප්‍රගතිය පිළිබඳව සතුටුවන අතර මෙම ව්‍යාපෘතිය පිළිබඳව පුස්තකාල ප්‍රජාව දැනුවත් කිරීම සඳහා ග්‍රන්ථයක් සම්පාදනය කිරීම පිළිබඳව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ ප්‍රලේඛන සේවා අංශයේ අංශ ප්‍රධාන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජී. ඩී. අමරසිරි මහතාටත් එම අංශයේ කාර්ය මණ්ඩලයටත් මගේ කෘතඥතාවය පිරිනමමි.

2007 නොවැම්බර් — ඊ. ඒ. සමරසිංහ, සභාපති

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත
කොළඹ 07

## හැඳින්වීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පළමු දශක දෙක තුළ ජාතියට සිදුකළ ප්‍රධාන මෙහෙය ශ්‍රී ලංකාවේ ජාතික ග්‍රන්ථ විඥාපන පාලනයට එමගින් ලබා දුන් දායකත්වය යයි සිතමි. වසර දහස් ගණනක ලිඛිත ඉතිහාසයක් ඇති, ප්‍රධාන භාෂා ගණනාවකින් පොත් පත් ලියැවුණු, 19 වන සියවසේ අවසාන වසර කිහිපයට පෙර ලියැවුණු පොත් පත් ක්‍රමානුකූලව එක් රැස් නොවුණු රටක, ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය අතිශයින් අභියෝගාත්මක කාර්යයක් බවට විවාදයක් නොමැත.

1990 ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ආරම්භ වීමට කලකට පෙර සිට ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ප්‍රකාශයට පත්වෙමින් තිබුණි. විවිධ අංශ පිළිබඳ ප්‍රකට ග්‍රන්ථ නාමාවලී කිහිපයක් විද්වත් පුස්තකාලයාධිපතීන් මෙන්ම වෙනත් පඬිවරුන් ගණනාවක් අතින් සම්පාදනය වී තිබුණි. මෙම වැදගත් එහෙත් හුදෙකලා ප්‍රයත්නයන්ට අමතරව රට තුළ ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය පිළිබඳ සැලසුම්සහගත ක්‍රමානුකූල වැඩසටහනක් ඇරඹීම සහ ක්‍රියාත්මක කරලීම ජාතික පුස්තකාලය ආරම්භවීම සමඟ සිදුවිය.

මේ වන විට සාර්ථකව අවසන් කළ හෝ ආරම්භ කොට ක්‍රමානුකූලව පවත්වාගෙන යනු ලබන පහත සඳහන් ව්‍යාපෘති ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ විඥාපන පාලන ක්ෂේත්‍රයේ ජාතික පුස්තකාලය සිදුකළ මහඟු මෙහෙවරට සාක්ෂි වේ.

- ශ්‍රී ලංකා ජාතික ඒකාබද්ධ සූචිය
- ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය (ප්‍රවර්තන)
- ශ්‍රී ලංකා පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලිය (1737-1962)
- ශ්‍රී ලංකා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව (1998- )
- ශ්‍රී ලංකා පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව (1990 - )
- ශ්‍රී ලංකා සම්මේලන සූචිය (1990 - )
- ශ්‍රී ලංකා පශ්චාත් උපාධි නිබන්ධන අනුක්‍රමණිකාව (1947-2000)
- ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් පිළිබඳ ග්‍රන්ථ නාමාවලිය
- ශ්‍රී ලංකාවේ පරිවර්තන කෘති පිළිබඳ ග්‍රන්ථ නාමාවලිය
- විශේෂ ග්‍රන්ථ නාමාවලී

මෙම සෑම ප්‍රකාශනයක් ම ශ්‍රී ලංකාවේ ප්‍රකාශන ක්ෂේත්‍රයේත්, ඒ අනුව දේශීය ග්‍රන්ථ විඥාපන පාලනයේත් දැවැන්ත අංශයන් නියෝජනය කරනු ලබයි. මෙම ප්‍රකාශනවල ශ්‍රී ලාංකිකයන් විසින් මානව වර්ගයාට දායාද කළ, ශ්‍රී ලංකාවේ සංස්කෘතික හා බුද්ධිමය උරුමය තැන්පත් වී ඇත. මේවා පුස්තකාලවල, පොත් පත් තුළ, වාර සඟරාවල, පුවත්පත්වල, සම්මේලන පත්‍රිකා අතර සැඟවී තිබීම වෙනුවට, හැමට ප්‍රදර්ශනය වන සේ ඉවතට ගෙන, ග්‍රන්ථ විද්‍යාත්මකව පෙළ ගස්වා, පහසුවෙන් පරිශීලනය කළ හැකි සේ විවෘත කරලීම ජාතික ග්‍රන්ථ විඥාපන පාලන ව්‍යාපෘතිය මගින් ජාතික පුස්තකාලය ඉටු කළ ඓතිහාසික කාර්ය භාරය වේ.

මෙම ප්‍රයත්නයේ අනෙක් වැදගත් ලක්ෂණය වනුයේ තමන් සතුව සම්පූර්ණ ශ්‍රී ලංකා ප්‍රකාශන එකතුව නොමැතිව ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය මෙම කාර්යය ඉටු කරලීම වේ. බ්‍රිතාන්‍ය (ජාතික) පුස්තකාලය හෝ ඉන්දීය ජාතික පුස්තකාලයට, අදාළ රටවල ප්‍රකාශිත කුඩු මහත් ප්‍රකාශන එකතුව හෝ එයින් බහුතරයක් හෝ සතුවුවා මෙන්, දැනට ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සතුව අංග සම්පූර්ණ ජාතික එකතුවක් නොමැත. අප කවුරුත් දන්නා පරිදි ප්‍රධාන ශ්‍රී ලංකා එකතුව තවමත් වෙනත් පුස්තකාල, ලේඛනාගාර,

කෞතුකාගාර වැනි ආයතන ගණනාවක් අතරේ විසිර පවතී. මෙබඳු තත්වයක් යටතේ ඒ ඒ ක්ෂේත්‍රවල ග්‍රන්ථ විඥාපන පාලනයට අදාළ ප්‍රකාශන සොයා ගැනීම හා අධ්‍යයනය බෙහෙවින් ආයාසකර කාර්යයක් වේ. ඒ අනුව මෙම ප්‍රයත්නයේ අගය තවදුරටත් වැඩිවන බවට සැකයක් නොමැත.

ජාතික පුස්තකාල කාර්ය මණ්ඩලයේ සෘජු දායකත්වයෙන් සම්පාදනය වූ උක්ත ප්‍රධාන ග්‍රන්ථ විඥාපන ප්‍රකාශනවලට අමතරව, වෙනත් විද්වතුන් ලවා, විශේෂ ක්ෂේත්‍රවල ග්‍රන්ථ නාමාවලී සම්පාදනය කරලීම හෝ ඒ අය විසින් සම්පාදිත ග්‍රන්ථ නාමාවලී ඇතැම් විට සංශෝධන සහිතව ප්‍රකාශයට පත් කරලීම ද මෙම ව්‍යාපෘතියේ ම අංශයක් ලෙස ජාතික පුස්තකාලය මඟින් සිදු කරන ලදී. මේවා අතර ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ නාමාවලී පිළිබඳ ග්‍රන්ථ නාමාවලිය, සිංහල නවකථා, අධ්‍යාපන ප්‍රකාශන, පරිවර්තන ආදි ක්ෂේත්‍ර පිළිබඳ ග්‍රන්ථ නාමාවලී ප්‍රමුඛ වේ. එසේම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල සූචියේ සැලකිය යුතු ප්‍රමාණයක් පළ කිරීම ද මෙයට අයත් වේ.

ශ්‍රී ලංකාවේ ජාතික ග්‍රන්ථ විඥාපන පාලනයේදී තීරණාත්මක වැදගත්කමක් උසුලන තවත් අංශයකට මේ අවදියේ දී ජාතික පුස්තකාලය අත පොවන ලදී. එනම් මෙබඳු කාර්යයක දී අත්‍යාවශ්‍ය සාධිකාර ලේඛන (authority files) සම්පාදනය කිරීමේ බැරෑරුම් කාර්යය වේ. ඒ අනුව අනුරාධපුර යුගයේ සිට වර්තමානය දක්වා සමස්ථ සිංහල සාහිත්‍ය වංශය ම ආවරණය වන සේ කර්තෘ නාම සාධිකාර ලේඛනය (authority list of authors) සම්පාදනය අවසන් කර ඇත. එමඟින් නම් කිහිපයක් හෝ නාම ස්වරූප කිහිපයක් භාවිත කළ ශ්‍රී ලාංකික කතුවරුන්ගේ පුද්ගල නාම සූචිගත කිරීමේදී භාවිත කළ යුතු නාමය පිළිබඳ මහ පෙන්වීමක් ජාතික පුස්තකාලය සිදු කොට ඇත. දෙවන පියවර ලෙස ශ්‍රී ලංකවේ දෙමළ භාෂා ගත්කතුවරුන්ගේ නාම පිළිබඳ සාධිකාර ලේඛනය දැනට සම්පාදනය වෙමින් පවතී. මෙහි අනෙක් ප්‍රධාන අංශය ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත්වූ ග්‍රන්ථ නාම පිළිබඳ සාධිකාර ලේඛනය (authority list of titles) වේ. ඒ අනුව අනුරාධපුර යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා ශ්‍රී ලංකාවේ ලියැවුණු ග්‍රන්ථවල, ග්‍රන්ථ නාම සාධිකාර ලේඛනය දැනට සම්පාදනය කොට අවසන් කර ඇත. මෙම සාධිකාර ලේඛන සම්පාදනය ජාතික ග්‍රන්ථ විඥාපන පාලන ක්‍රියාවලියේ දී ජාතික පුස්තකාලය මඟින් සිදු කර ඇති විශිෂ්ට කාර්යාවලියක් බව නිසැකය.

තම ග්‍රන්ථ විඥාපන පාලන කටයුතුවල උසස් ප්‍රමිතීන් රැක ගැනීමටත්, එහි දී පිළිගත් අන්තර්ජාතික ප්‍රමිතීන් අනුගමනය කිරීම සහතික කරලීම සඳහාත්, ජාතික පුස්තකාලය මීට වසර කිහිපයකට පෙර ජාතික ග්‍රන්ථනාමාවලී සම්පාදන ප්‍රමිති නමින් ප්‍රමිති මාලාවක් සම්පාදනය කරන ලදි. ජාතික ග්‍රන්ථනාමාවලී සම්පාදනයෙහිලා අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය ප්‍රකාශයට පත් කළ ප්‍රමිතීන් මෙන්ම, වෙනත් රටවල අදාළ ප්‍රමිතීන් ද ප්‍රවේශමෙන් අධ්‍යයනය කොට විශේෂ විද්වත් කමිටුවක් මඟින් ශ්‍රී ලංකාවට ගැලපෙන සේ මෙම ප්‍රමිති සම්පාදනය කර ඇත. ජාතික පුස්තකාලයේ ග්‍රන්ථ විඥාපන සේවා උසස් මට්ටමක පවත්වාගෙන යාමට මෙම ප්‍රමිති අතිශයින් ප්‍රයෝජනවත් වී ඇත.

ශ්‍රී ලංකාවේ ජාතික ග්‍රන්ථ විඥාපන පාලනයේ ප්‍රධාන අභියෝගවලින් බහුතරයක් ජාතික පුස්තකාලය බිහිවී පළමු දශක එකහමාර තුළ ආවරණය කිරීම හේතුවෙන් මෙම කරුණු ගැන ජාතික පුස්තකාල කළමනාකරණයේ ආකල්පය පිළිබඳ අදහසක් ඇති කර ගත හැකිය. ජාතික පුස්තකාලයේ ආරම්භක වැඩ පිළිවෙල දියත් කිරීමේදී ප්‍රධාන මතවාද දෙකක් ඉදිරිපත් විය. පළමු වැන්න ජාතික පුස්තකාලයේ මූලික කාර්යය විය යුත්තේ දැනට විසිර පවතින ජාතික පුස්තකාල එකතුව එක් වහලක් යටතට ගෙන, ශක්තිමත් ජාතික පුස්තකාලයක් ගොඩනැඟීමට අවශ්‍ය නීතිමය සහ වෙනත් පියවර ගත යුතුය යන්නයි. එම කාර්යය ඉටු කොට භෞතිකව අංග සම්පූර්ණ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය නිර්මාණය වූ පසු, පුළුල් ජාතික ග්‍රන්ථ විඥාපන පාලනයකට එළඹීම දෙවන පියවර ලෙස ඉටු කිරීම වඩා නුවනට හුරු බව දැක්වුණි. දෙවන මතවාදය වූයේ ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය වැදගත් වුවද, සියලුම අංශවල ග්‍රන්ථ විඥාපන පාලනයට

එක්වර අත නොගසා එක් එක් කොටස්වල, පුළුල් ග්‍රන්ථ විඥාපන පාලන මෙවලම් ගොඩනැංවීම වඩා වැදගත් බව යන්න වේ. ඒ අනුව පළමු දශකය තුළ පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලී ව්‍යාපෘතිය හෝ සමාන ව්‍යාපෘතියක් අඩුපාඩුවකින් තොරව මුලුමනින්ම ආවරණය වූ පසු ඉතිරි අංශද ක්‍රමානුකූලව ඒ ආකාරයට ආවරණය කිරීමත් වැදගත් බව එම තර්කය විය. ආරම්භක අවස්ථාවේ දී අප ජාතික පුස්තකාලය සතුව පුළුල් ග්‍රන්ථ විඥාපන පාලන වැඩපිළිවෙලකට අවශ්‍ය, මූලික පහසුකම් සහ පළපුරුදු වෘත්තීය කාර්ය මණ්ඩලයක් නොසිටීම, පුස්තකාලයාධිපතීන්ගේ සාම්ප්‍රදායික ප්‍රවේශම් සහගතව කටයුතු කිරීමේ පුරුද්ද මෙබඳු වැඩපිළිවෙලකට පක්ෂව ඉදිරිපත් වූ ප්‍රධාන සාධක වූහ.

නමුත් ජාතික පුස්තකාල කළමනාකරණය මෙම මතවාද දෙකම පසෙකලා ජාතික පුස්තකාල ක්ෂේත්‍රයේ අනෙකුත් අංශවල අදාල ක්‍රියාකාරකම් සිදු කරන අතර ම, ජාතික ග්‍රන්ථ විඥාපන පාලනයේ සියලුම ප්‍රධාන අංශ එක්වර හැකි තරම් දුරට ආවරණය කිරීමේ ව්‍යාපෘතියක් දියත් කරන ලදී. එහිදී ප්‍රවර්තන ග්‍රන්ථනාමාවලියේ තත්වය උසස් කරන අතර ම, 1737-1962 කාලය ආවරණය කෙරෙන පූර්වකාලීන ජාතික ග්‍රන්ථනාමාවලී ව්‍යාපෘතියත්, ඊට අමතරව වාර සඟරා ලිපි, පුවත්පත් ලිපි, සම්මන්ත්‍රණ පත්‍රිකා, පශ්චාත් උපාධි නිබන්ධන, පරිවර්තන කෘති යන සියළුම ප්‍රධාන අංශ ආවරණය කරලීමට සැලසුම් කරන ලදී. තමන් සතු පුළුල් ජාතික පුස්තකාල එකතුවක් හෝ අදාළ ක්ෂේත්‍ර පිළිබඳ උසස් පුහුණුවක් හා අත්දැකීම් සහිත වෘත්තීය කාර්ය මණ්ඩලයක් නොමැතිව ගනු ලැබූ මෙම පියවර, සාමාන්‍ය කළමනාකරණ භාෂාවෙන් කිවහොත් විශාල අවදානමක් ගැනීමක් විය. ඉතා ප්‍රවේශමෙන් කළමනාකරණය නොකළහොත් එබඳු පියවරක් සාර්ථකවීම ට වඩා අසාර්ථකවීම ට ඇති ඉඩකඩ වඩාත් වැඩි වේ.

මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කරලීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ ග්‍රන්ථ විඥාපන උපදේශක කමිටුව මෙන්ම තොරතුරු තාක්ෂණ උපදේශක කමිටුව ද විශාල කාර්ය භාරයක් සිදු කරන ලදී. ඒ ඒ කටයුතු පිළිබඳ වෘත්තිය උපදෙස් ලබාදීමත්, අදාළ කාර්යයන් සැලසුම් කරලිමට හා අධීක්ෂණය කරලීමට සහායවීමත් මෙම කමිටු මඟින් ඉටු කරන ලදී. ග්‍රන්ථ විඥාපන පාලන කාර්යයන් ප්‍රධාන වශයෙන් සිදු කරන ලද්දේ ජාතික පුස්තකාලයේ ග්‍රන්ථ විඥාපන සේවා අංශයේ සහ ප්‍රලේඛන සේවා අංශයේ නිලධාරීන් විසිනි. එසේම මෙම කටයුතුවල අඩුපාඩු පෙන්වාදීම, ප්‍රකාශනවල සංස්කරණ කටයුතු ආදිය සඳහා විවිධ ක්ෂේත්‍රවල බාහිර ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපතිවරු ගණනාවක් සහාය වූහ.

ජාතික පුස්තකාල කාර්ය මණ්ඩලය, ආයතනයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ අධීක්ෂණය හා උපදේශක කමිටුවල සහ වෙනත් ජ්‍යෙෂ්ඨ වෘත්තිකයන්ගේ මඟපෙන්වීම යටතේ මෙම ග්‍රන්ථ විඥාපන පාලන කාර්යයන් ඉටු කළ ද, අපේක්ෂා කළ යුතු අන්දමට ඒවායේ අඩුපාඩු හා දුබලතා තිබිය හැකිය. එසේ වුවද අප විශ්වාස කරන අන්දමට වඩා වැදගත් වන්නේ අඩුපාඩු සහිතව හෝ ජාතික ග්‍රන්ථ විඥාපන පාලන ක්‍රියාවලියේ සැලකිය යුතු වපසරියක් ආවරණය කිරීම වේ. දෙවන අදියරේ දී එම අඩුපාඩු සකස් කර ගැනීම එතරම් අපහසු කාර්යයක් නොවනු ඇත.

මෙම ක්‍රියාවලියේ තවත් ප්‍රධාන අංගයක් ලෙස ශ්‍රී ලංකා ජාතික ඒකාබද්ධ සූචි ව්‍යාපෘතිය සැලකිය හැකිය. දැනට ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුස්තකාල සියල්ලම පාහේ ජාතික ඒකාබද්ධ සූචියට දායකවන නමුදු එහි අඩු පාඩු රැසක් දැකිය හැකිය. ඇතැම් ප්‍රධාන පුස්තකාල දායක නොවීම, දායක පුස්තකාල වුවද තම එකතු පිළිබඳ සම්පූර්ණ තොරතුරු ඒකාබද්ධ සූචියට නොඑවීම, එවන ඇතැම් තොරතුරු පුස්තකාල මෘදුකාංගවල නොගැලපීම නිසා ඇතුළත් කළ නොහැකිවීම වැනි දුබලතා මේවා අතර ප්‍රධාන වේ.

ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනයටත්, එය නිරතුරුව යාවත්කාලීන කිරීමටත්, එය අන්තර්ජාලයට සම්බන්ධ කොට පවත්වාගෙන යාමටත් ජාතික පුස්තකාල කාර්ය මණ්ඩලය විශාල මෙහෙයක් කරනු ලැබේ. අන්තර්ජාලයට සම්බන්ධවීම නිසා ශ්‍රී ලංකා ජාතික ඒකාබද්ධ සූචිය අද මුළු ලොවටම විවෘතව ඇත. පසුගිය සමයේ ජාතික ඒකාබද්ධ සූචියේ ඇති ප්‍රකාශන පිළිබඳව ජාතික පුස්තකාලයට සහ එහි දායක පුස්කාලවලට විදේශික පර්යේෂකයන්ගෙන් සහ විදේශ රටවල පර්යේෂණ කටයුතු කරන ශ්‍රී ලාංකිකයන්ගෙන් විමසීම් ලැබීම අනතර්ජාලයට ඇතුළත් කිරීම නිසා එහි පරිශීලනය වැඩිවූ බවට සාධකයකි. දැනට ලැබී ඇති සාක්ෂි අනුව ශ්‍රී ලංකා ජාතික ඒකාබද්ධ සූචිය ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුස්තකාල හා පර්යේෂකයන් අතර ද, විශේෂයෙන් ශ්‍රී ලංකාව ගැන අධ්‍යයන/පර්යේෂණ කරනු ලබන විදේශ රටවල පර්යේෂකයින් හා පුස්තකාල අතර ද සැලකිය යුතු ජනප්‍රියත්වයක් උසුලයි.

එසේ වුව ද නෙදර්ලන්තයේ PICA හෝ ඉන්දියාවේ DELNET වැනි ප්‍රකට ජාතික මට්ටමේ ග්‍රන්ථ විඥාපන මෙවලම් තරමට ශ්‍රී ලංකා ජාතික ඒකාබද්ධ සූචිය ඉදිරියට පැමිණ නැත. සමස්ථයක් ලෙස උසස් මට්ටමේ පර්යේෂණ වල නිරත දේශීය විද්වතුන් සීමිත වීම, මේ නිසා උසස් හා නවීන පුස්තකාල සේවා සැපයීමට පුස්තකාලවලට හා බලධාරීන්ට එල්ල වන පීඩනය අඩුවීම, පර්යේෂකයින් බොහෝ දුරට අන්තර්ජාලය හා එහි ඇති නවීන සෙවුම් යන්ත්‍ර (search engines) භාවිත කිරීම, තම විෂය ක්ෂේත්‍රවලට අදාළ ප්‍රකට ජාත්‍යන්තර අනුක්‍රමණිකා, සූචි වැනි ග්‍රන්ථ විඥාපන ප්‍රකාශන පරිශීලනය, දේශීය ප්‍රකාශන ජාතික ඒකාබද්ධ සූචිය මඟින් හඳුනා ගත්ත ද ඒවා අදාළ පුස්තකාලවලින් ලබා ගැනීමට ඇති දුෂ්කරතා, ජාතික ඒකාබද්ධ සූචිය පිළිබඳ බොහෝ පර්යේෂකයින් නොදැන සිටීම වැනි කරුණු ගණනාවක් ශ්‍රී ලංකා ජාතික ඒකාබද්ධ සූචිය සීමිත වශයෙන් භාවිත වීමට හේතු වී ඇත.

දේශීය පුස්තකාල ක්ෂේත්‍රයේ ද ජාතික ඒකාබද්ධ සූචිය වැනි ජාතික ව්‍යාපෘති කෙරෙහි අපේක්ෂා කළ යුතු තරම් විශාල උනන්දුවක් ද දක්නට නොලැබුණි. ජාතික පුස්තකාලයම වාර්ෂිකව සංවිධානය කළ වැඩමුළු, සම්මන්ත්‍රණ ආදිය හැරුණු විට පුස්තකාල කෙෂත්‍රයේ හෝ වෙනත් ආයතන සංවිධාන මඟින් මේ පිළිබඳව ඒ හා සමාන විමසුමක් පසුගිය කාලය තුළ සිදු කළ බවක් නොපෙනේ. දේශීය පුස්තකාල ක්ෂේත්‍රයට සම්බන්ධ සංවිධාන හා ආයතන පසුගිය දශක දෙක තුළ සංවිධානය කළ සම්මන්ත්‍රණ, සම්මේලන, වැඩමුළු ආදියෙහි තේමාව ලෙස බහුලව යොදාගෙන තිබුනේ පුස්තකාල සේවාව ස්වයංක්‍රීයකරණය, පුස්තකාල සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම හෝ ඊට සම්බන්ධ තේමාවන් වේ. දේශීය පුස්තකාල ක්ෂේත්‍රයේ අත්තිවාරම සහ හදගැස්ම වන ජාතික පුස්තකාල එකතුව සංවිධානය, දේශීය ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය, ජාතික ඒකාබද්ධ සූචිය, පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය වැනි අතිශය වැදගත් අංශ කෙරෙහි ඔවුන්ගේ අවධානය එතරම් යොමුවීමක් නොපෙනේ. සමස්ථයක් ලෙස ජාතික මට්ටමේ පුස්තකාල සංවර්ධනයේ ප්‍රමුඛතා පිළිබඳ අනවබෝධය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ආකර්ශනීය ලක්ෂණ මෙම තත්වයට හේතු වූවා විය හැකිය. එම අංශය පිළිබඳව වුවද විශාල ලෙස සාකච්ඡා වුවද, නව තාක්ෂණය තම පුස්තකාල සේවා වේ ගුණාත්මකබව වර්ධනයට යොදා ගැනීමට හැකි වී ඇත්තේ ද දේශීය පුස්තකාල අතලොස්සකට පමණි.

මෙලෙස දේශීය පුස්තකාල, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඉතා සෙමින් වැළඳගැනීම සහ පුස්තකාල සේවාව නවීකරණය මන්දගාමීව සිදුවීම, ජාතික ඒකාබද්ධ සූචිය වැනි ජාතික ව්‍යාපෘතීනට දැඩි සේ බලපා ඇත. ප්‍රධාන පුස්තකාලවල සූචි පරිගණකගත වී විද්‍යුත් තොරතුරු පුළුල් ලෙස භාවිතා වන පසුබිමක ජාතික ඒකාබද්ධ සූචිය විද්‍යුත් තොරතුරු ජාලයක් ලෙස පවත්වා ගෙනයාම පහසු කාර්යයකි.

අඩුපාඩුකම් තිබුණ ද වර්තමාන ජාතික ඒකාබද්ධ සූචි ව්‍යාපෘතිය, අනාගතයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පදනම් කර ගත් පුළුල් හා නවීන දේශීය තොරතුරු ජාලයක් සඳහා ශක්තිමත් ආරම්භයක් බව නිසැක වේ. විද්‍යා හා තාක්ෂණ, කෘෂිකර්මය වැනි සුවිශේෂ විෂය ක්ෂේත්‍රවල ගොඩනැගෙමින් පවතින විශේෂ ඒකාබද්ධ සූචි සමඟ ද සම්බන්ධ වී එය, නුදුරු අනාගතයේදී ම ප්‍රධාන වශයෙන්ම ශ්‍රී ලාංකික ප්‍රජාවගේ තොරතුරු අවශ්‍යතා සපුරාලන නවීන තොරතුරු ජාලයක් ලෙස වර්ධනය වන බව බව පැහැදිලිය. 1986-2007 කාලය තුළ ජාතික ඒකාබද්ධ සූචියේ ආරම්භය හා වර්ධනය පිළිබඳව විමර්ශනය කෙරෙන මෙම ප්‍රකාශනය එහි අනාගත වර්ධනය සඳහා ඵලදායකවනු ඇතැයි අපේක්ෂා කරමි.

එම් එස් යූ අමරසිරි
අධ්‍යක්ෂ ජනරාල්

2007 නොවැම්බර්
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය
14, නිදහස් මාවත
කොළඹ 07.

# පටුන

පිටුව

පෙරවදන iii

හැඳින්වීම v

ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය කිරීමේ වැදගත්කම හා ප්‍රයෝජන 01
ජී. ඩී. අමරසිරි

ශ්‍රී ලංකා ජාතික ඒකාබද්ධ සූචියේ ආරම්භය හා විකාශනය පිළිබඳ හැඳින්වීමක් 06
ජානකී ප්‍රනාන්දු

ජාතික ඒකාබද්ධ සූචිය සහ අන්තර් පුස්තකාල සහයෝගීතාවය 24
නාලිනී මල්ලව ආරච්චි

ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනයේදී මගේ අත්දැකීම් 29
සුනේත්‍රා කාරියවසම්

ජාතික ඒකාබද්ධ සූචිය පවත්වාගෙන යාමේදී ඇතිවන තාක්ෂණික ගැටළු 44
අමරා නානායක්කාර

ජාතික ඒකාබද්ධ සූචියේ අනාගත සංවර්ධනය සඳහා ගතහැකි ක්‍රියාමාර්ග 49
ජේ. ඒ. අමරවීර

Participating Libraries of the National Union Catalogue of Sri Lanka 58

# ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය කිරීමේ වැදගත්කම හා ප්‍රයෝජන

**ජී. ඩී. අමරසිරි**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ**
**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**

## හැඳින්වීම

ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය ඕනෑම රටක ජාතික පුස්තකාලයකට පැවරෙන ප්‍රධාන කාර්යයකි. ලෝකයේ විවිධ විද්වතුන් ජාතික පුස්තකාල කාර්යයන් විග්‍රහ කිරීමේදී ජාතික ඒකාබද්ධ සූචිය පවත්වාගෙනයාම ප්‍රමුඛ කාර්යයක් වශයෙන් දක්වා ඇත. ලෝකයේ බොහෝ රටවල ජාතික පුස්තකාල විසින් ජාතික ඒකාබද්ධ සූචි පවත්වාගෙන යනු ලබයි. කිසියම් රටක ඇති විවිධ පුස්තකාලවල ඇති පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු එක් ස්ථානයක එක් රැස්කර සූචියක් වශයෙන් පවත්වාගෙන යාම, ඒකාබද්ධ සූචියක් යනුවෙන් සරලව නිර්වචනය කළහැක. කිසියම් රටක් තුළ විවිධ පුස්තකාල විසින් ඒකාබද්ධ සූචීන් පවත්වාගෙන යන බව පෙනේ. විශේෂයෙන් කිසියම් විෂය ක්ෂේත්‍රයකට අදාළව පවත්වාගෙන යන පුස්තකාල ජාල මගින් ඒකාබද්ධ සූචීන් පවත්වාගෙන යනු ලබයි. නමුත් ජාතික ඒකාබද්ධ සූචියක් පවත්වාගෙන යාමේ වගකීම පැවරෙන්නේ රටක ජාතික පුස්තකාලය වෙතය. ජාතික පුස්තකාලය කේන්ද්‍රස්ථානය වශයෙන් ක්‍රියාත්මක වන අතර අනෙකුත් පුස්තකාල මේ සඳහා දායක වේ. කිසියම් රටක පවත්නා සියලුම පුස්තකාලයන්හී ඇති පුස්තකාල සම්පත් පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් ක්‍රමානුකූලව සකස්කරන ලද පොදු ලැයිස්තුවක් ජාතික ඒකාබද්ධ සූචියක් (National Union Catalogue) යනුවෙන් සරලව නිර්වචනය කළහැකිය. ජාතික ඒකාබද්ධ සූචියක් පවත්වාගෙන යාම රටක ජාතික පුස්තකාලයක ප්‍රධාන කාර්යයක් වශයෙන් ජාත්‍යන්තර වශයෙන් පිළිගෙන ඇත.

## ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනයේ වැදගත්කම

ජාතික පුස්තකාලයක කාර්යයන් පිළිබඳ විශ්ලේෂණයන් ඉදිරිපත් කළ විවිධ විද්වතුන් ජාතික ඒකාබද්ධ සූචියක් පවත්වාගෙන යාම ජාතික පුස්තකාලයක කාර්යයක් බව පෙන්වාදී ඇත. කේ. ඩබ්ලිව්. හම්ප්‍රීස් (K. W. Humpreys) හා ගිටින් හෙන්ස් (Gitting Heinz) 1969 දී ඉදිරිපත් කළ ජාතික පුස්තකාල කාර්යයන් පිළිබඳ

විශ්ලේෂණයේදී ඒකාබද්ධ සූචීන් සම්පාදනය ජාතික පුස්තකාලයක කාර්යයක් වශයෙන් දක්වා ඇත. 1967 යුනෙස්කෝ-කොළඹ සම්මන්ත්‍රණ වාර්තාව මගින්ද ශ්‍රී ලාංකික ප්‍රකාශන පිළිබඳ ඒකාබද්ධ සූචියක් පවත්වාගෙන යාම ජාතික පුස්තකාලයක කාර්යයක් වශයෙන් දක්වා ඇත. සෞදි අරාබියේ ජෙඩාහි අබ්දුල් අසීස් විශ්වවිද්‍යාලයේ සහාය මහාචාර්ය මොහොමඩ් අල්නහරි විසින් 1984 දී ඉදිරිපත් කළ ජාතික පුස්තකාල කාර්යයන් පිළිබඳ විග්‍රහයේදී ද ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය ජාතික පුස්තකාලයක කාර්යයක් වශයෙන් දක්වා ඇත.

ජාතික ඒකාබද්ධ සූචියක ප්‍රයෝජන ගණනාවක් ඇති බැවින් එය පවත්වාගෙන යාම රටකට ඉතාමත් වැදගත් වේ. රටතුළ විසිරී ඇති ප්‍රකාශන පිළිබඳ තොරතුරු එක් ස්ථානයකින් පහසුවෙන් සොයාගැනීමට හැකිවීම ඒකාබද්ධ සූචියක් මගින් ලැබෙන ප්‍රධානම ප්‍රයෝජනය වේ. විශේෂයෙන්ම පර්යේෂණ කාර්යයන් නියුතු විද්වතුන්ට පහසුවෙන් තොරතුරු සොයාගැනීමට හැකිවන අතර කාලය හා ශ්‍රමය ඉතිරි කර ගත හැකිවනු ඇත. එමෙන්ම ජාතික ඒකාබද්ධ සූචියට දායකවන පුස්තකාල මගින් පොත් පත් මිලදී ගැනීමේදී අනවශ්‍ය ද්විත්වකරණය වළක්වා ගැනීමට ද හැකියාව ලැබේ. විශේෂයෙන් මිල අධික පොත්පත් වෙනත් දායක පුස්තකාලයක තිබෙනම් ඒවා මිලදී නොගෙන පිරුළු ක්‍රමයට ලබාගත හැකිවේ. ඒ ආකාරයට ඒකාබද්ධ සූචියට දායකවන සෑම පුස්තකාලයක් අතරම අන්තර් පුස්තකාල පිරුළු ක්‍රමය යටතේ පොත් ලබාගැනීමේ වැඩසටහනක් ඇති කරගැනීමට පුළුවන. මේ සඳහා ගිවිසුමක් ඇති කර ගැනීම මගින් සීමිත කාලයකට පොත් ලබාගත හැකිවේ. එමෙන්ම විවිධ විෂය ක්ෂේත්‍ර පිළිබඳ ග්‍රන්ථනාමාවලී, අනුක්‍රමණිකා තොරතුරු සංග්‍රහ සම්පාදනයේදී එම විෂයයන් පිළිබඳ පලවී ඇති ප්‍රකාශන පිළිබඳ තොරතුරු සොයා ගැනීමට ද ජාතික ඒකාබද්ධ සූචිය ප්‍රයෝජනවත් වේ.

ජාතික ඒකාබද්ධ සූචිය මගින් අන්තර් පුස්තකාල සහයෝගීත්වය වර්ධනය කරගැනීමට ද අවස්ථාව සැලසේ. රට තුළ ඇති පුස්තකාල විශාල සංඛ්‍යාවක් ජාතික ඒකාබද්ධ සූචියට දායකවන බැවින් එම පුස්තකාල හා ජාතික පුස්තකාලය අතර ඇති සහයෝගය හා සම්බන්ධතාවය මේ මගින් වර්ධනය වේ. එමෙන්ම ජාතික ඒකාබද්ධ සූචියට දායකවන පුස්තකාලවල පුස්තකාලයාධිපතීන් සඳහා සම්මන්ත්‍රණ වැඩමුළු ආදිය පවත්වන බැවින් ඒ සඳහා සහභාගිවීම තුළින් ඔවුන්ට එකිනෙකාට හමුවීමටත් අදහස් හුවමාරු කරගැනීමටත් ගැටළු සාකච්ඡා කිරීමටත් අවස්ථාව ලැබෙන බැවින් එම පුස්තකාල අතරත් පුස්තකාලයාධිපතීන් අතරත් සහයෝගීතාවය වර්ධනය

කරගැනීමට හැකි වේ. එමෙන්ම ජාතික පුස්තකාලය මගින් ලබාදෙන විවිධ සේවාවන් වලින් ද මෙම පුස්තකාලවලට විශේෂයෙන් ප්‍රයෝජන ලබාගත හැකිවේ.

ජාතික ඒකාබද්ධ සූචිය පරිගණකගත කිරීම තුළින් මාර්ගගත පහසුකම් සැලසීම මගින් ඕනෑම අයෙකුට මෙයට ප්‍රවේශවීමට අවස්ථාව ලැබීම ද වැදගත් ප්‍රයෝජනයකි. ශ්‍රී ලංකාවේ ජාතික ඒකාබද්ධ සූචිය ද දැනට අන්තර්ජාලයට සම්බන්ධ කර ඇත. එබැවින් ලෝකයේ ඕනෑම අයෙකුට මෙයට ප්‍රවේශ විය හැකිය. මෙහිදී කර්තෘ, ග්‍රන්ථ නාමය, ආයතනය මූලික පද (Keyword) ආදී විවිධ ප්‍රවේශ මාර්ග ඔස්සේ තොරතුරු ගවේශනය කිරීමට පාඨකයින්ට පුළුවන.

පර්යේෂණ කාර්යයන්හි නියුතු විද්වතුන්ට ජාතික ඒකාබද්ධ සූචිය මගින් ලබාගත් හැකි ප්‍රයෝජන ඉමහත්ය. පර්යේෂකයින් මුහුණ දෙන ප්‍රධාන ගැටළුව නම් ඔවුන්ට අවශ්‍ය තොරතුරු තිබෙන ස්ථාන සොයාගැනීමට ඇති අපහසුවයි. විශේෂයෙන්ම මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණ විශාල වශයෙන්ම රඳා පවතින්නේ මුද්‍රිත මූලාශ්‍ර මතයි. මෙම මුද්‍රිත මූලාශ්‍ර සහිත පුස්තකාල අතර සම්බන්ධතාවය දුර්වල වුවහොත් නව දැනුම උත්පාදනයට එය බලවත් බාධාවකි.

රටක ග්‍රන්ථ විඥාපන පාලනය ඇති කිරීමේදී ද ජාතික ඒකාබද්ධ සූචිය වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. ග්‍රන්ථ විඥාපන පාලනය (Bibliographic Control) යනු රට තුළ විසිරී ඇති විවිධ ප්‍රකාශන පිළිබඳ තොරතුරු ඒකරාශිකර ඒවා ගවේශනය කිරීම සඳහා පාඨකයන්ට අවශ්‍ය පහසුකම් ඇති කිරීමයි. ජාතික ඒකාබද්ධ සූචියක් මගින් සිදුවන්නේ ද මෙම ක්‍රියාවලියයි. මානව ශිෂ්ටාචාරයේ ප්‍රගතිය සඳහා පර්යේෂණ අත්‍යවශ්‍ය වන්නාක් සේම විද්‍යාත්මක, තාක්ෂණික, ආර්ථික හා සමාජ පර්යේෂණ සඳහා කාර්යක්ෂම ග්‍රන්ථ විද්‍යාත්මක පාලනයක් අවශ්‍ය වේ. ග්‍රන්ථ විද්‍යාත්මක පාලනය යනු ප්‍රකාශිත හා අප්‍රකාශිත සියලුම තොරතුරු මූලාශ්‍ර හා දැණුම වාර්තාගත කිරීමය. ක්‍රමාණුකූල ග්‍රන්ථ විද්‍යාත්මක පාලනයක් මගින් තොරතුරු හඳුනා ගැනීම, නිරවද්‍යතාව පරීක්ෂා කිරීම, සොයා ගැනීම හා තෝරාගැනීම පහසු කරනවා පමණක් නොව පර්යේෂණ කටයුතුවලදී කාලය හා ශ්‍රමය ද ඉතිරි කරගත හැකිය. කාලය හා ශ්‍රමය අපතේ නොයවා අතිවිශාල දැනුම් සම්භාරය තුළින් තමන්ට අවශ්‍ය තොරතුරු සොයා ගැනීමට ග්‍රන්ථ විඥාපන පාලනය තුළින් අවස්ථාව ලැබේ. ග්‍රන්ථ විඥපන පාලනය සඳහා උපයෝගී කරගන්නා ක්‍රමෝපායන් ගණනාවක් ඇත. ජාතික ග්‍රන්ථනාමාවලි සම්පාදනය, පූර්ව කාලීන ග්‍රන්ථනාමාවලී (Retrospective

Bibliography) සම්පාදනය, තෝරාගත් විෂයයන් පිළිබඳ ග්‍රන්ථනාමාවලි මෙම ප්‍රධාන ක්‍රමෝපායයන් වන අතර ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය ද එක් ප්‍රධාන ක්‍රමෝපායකි. ජාත්‍යන්තර මට්ටමේ ග්‍රන්ථ විඥාපන පාලන ව්‍යාපෘතීන්ට සම්බන්ධ වීම ද එක් ව්‍යාපෘතියකි. උදාහරණ වශයෙන් කලාපයේ රටවල් එක්ව ඒකාබද්ධ සූචියක් සම්පාදනය කිරීම දැක්විය හැකිය.

ජාතික ඒකාබද්ධ සූචියක් මගින් වඩාත් කාර්යක්ෂම ලෙස ප්‍රයෝජන ලබාගැනීමට නම් එය පරිගණක ජාලයක් මගින් සම්බන්ධ කිරීම වැදගත් වේ. මෙම අරමුණ ඉෂ්ට කර ගැනීමට දීර්ඝ කාලයක් ගතවේ. එවැනි පරිගණක ජාලයක් මගින් සම්බන්ධ වූ විට දායක පුස්තකාලවලට සූචීන්ට තොරතුරු ඇතුළත් කරන අවස්ථාවේදීම එම තොරතුරු ජාතික ඒකාබද්ධ සූචියට ඇතුළත් වන ආකාරයට සැකසීම මගින් ජාතික ඒකාබද්ධ සූචිය වඩාත් උසස් තත්වයකට පත්කළ හැකිවේ.

## කලාපීය හා ජාත්‍යන්තර වැදගත්කම

ජාතික ඒකාබද්ධ සූචිය ජාතික මට්ටම ඉක්මවා ගොස් කලාපීය මට්ටමට ද ව්‍යාප්ත වෙමින් පවතී. දකුණු ආසියානු පුස්තකාල මධ්‍යස්ථාන පිළිබඳ කවුන්සලය හා චිකාගෝ විශ්වවිද්‍යාලය හා එක්ව පොත් වාර සඟරා හා පුවත්පත් පිළිබඳ දකුණු ආසියා කලාපීය ඒකාබද්ධ සූචියක් නිර්මාණය කිරීම ආරම්භ කර ඇත. දකුණු ආසියා කලාපයේ ප්‍රකාශන උරුමය පිළිබඳ අවබෝධය පෝෂණය කිරීමට ද මේ මගින් හැකිවේ. මෙම උරුමය සඳහා දැනට ලැබෙන අගය කිරීම හා ආරක්ෂාව ප්‍රමාණවත් නොවේ. ජාතික ඒකාබද්ධ සූචියක් කලාපීය ඒකාබද්ධ සූචියකට සම්බන්ධ වීමෙන් ලැබෙන ප්‍රයෝජන ගණනාවකි. දකුණු ආසියා කලාපයේ පර්යේෂණ කටයුතු සඳහා මේ මගින් විශාල පිටුවහලක් ලැබේ. දකුණු ආසියානු කලාපයේ රටවල් ඇතුළත හා පිටත අන්තර් පුස්තකාල පිරුළු සේවයක් ආරම්භ කිරීමට ද මේ මගින් අවස්ථාව සැලසේ. දකුණු ආසියානු රටවල දැනට ඇත්වී ඇති විවිධ ආයතන අතර අන්‍යෝන්‍ය සහයෝගීතාවය වර්ධනය කරගැනීමට ද මේ මගින් අවස්ථාව සැලසේ. දකුණු ආසියා කලාපයේ ඇති සුවිශාල ප්‍රකාශන උරුමය පිළිබඳ දැනුවත් භාවය වර්ධනය කිරීමට ද මෙම ඒකාබද්ධ සූචිය උපකාරීවේ. එමෙන්ම මෙම ප්‍රකාශන උරුමය ආරක්ෂා කිරීමට යම් යම් පියවර ගැනීමට ද මේ මගින් හැකිවේ. මෙම ප්‍රකාශන උරුමය ආරක්ෂා කිරීම සඳහා සංරක්ෂණ ප්‍රමුඛතා සකස් කිරීමට ද මේ මගින් අවස්ථාව ලැබේ. මෙම ඒකාබද්ධ සූචියට ඇතුළත් වන්නේ ඇෆ්ගනිස්ථානය, බංගලාදේශය,

භූටානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්ථානය හා ශ්‍රී ලංකාවයි. මෙම ඒකාබද්ධ සූචිය සම්පාදනයේ පළමු අදියරේදී දකුණු ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ ප්‍රකාශන පිළිබඳ අවධානය යොමු කෙරේ.

මෙම ජාතික ඒකාබද්ධ සූචීන්ගේ වැදගත්කම නිසාම අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය (IFLA) ජාතික ඒකාබද්ධ සූචීන් පිළිබඳ නාමාවලියක් සම්පාදනය කර ඇත. මෙය ලෝකයේ දැනට ක්‍රියාත්මක වන සියලුම ජාතික ඒකාබද්ධ සූචීන්වල සම්පූර්ණ ලැයිස්තුවකි. දැනට යාවත්කාලීනව පවත්වාගෙන යන ජාතික හා ජාත්‍යන්තර ඒකාබද්ධ සූචීන් මෙම නාමාවලියට ඇතුළත් කර ඇත. විශේෂිත විෂය ක්ෂේත්‍රයන්ට අයත් ඒකාබද්ධ සූචීන් ද මෙයට ඇතුළත් කර ඇත.

මෙම කරුණු අනුව සලකන විට ජාතික ඒකාබද්ධ සූචියක් ජාතික වශයෙන් මෙන්ම කලාපීය හා ජාත්‍යන්තර වශයෙන් ද අතිශයින් වැදගත් ව්‍යාපෘතියක් බව පැහැදිලි වේ. රටක අධ්‍යාපනික හා පර්යේෂණ කටයුතුවල සංවර්ධනය සඳහාත් ජාතික ග්‍රන්ථ විඥපන පාලනය ඇතිකර ගැනීම සඳහාත් ජාතික ඒකාබද්ධ සූචියක් පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ. මෙම වගකීම පැවරෙන්නේ ජාතික පුස්තකාලය වෙතය. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ද මෙම වගකීම අවබෝධ කොටගෙන මෙම ජාතික කර්තව්‍යය සඳහා පුළුල් ලෙස අවතීර්ණ වී ඇති අතර වර්තමානය වනවිට සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. ශ්‍රී ලංකා ජාතික ඒකාබද්ධ සූචියේ අනාගත සංවර්ධනය සඳහා ද දැනට සැලසුම් කර ඇති අතර ඉදිරියේ ද එය ජාත්‍යන්තර මට්ටමට දියුණු කිරීමට කටයුතු කිරීම ජාතික පුස්තකාලයේ අපේක්ෂාවයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. ප්‍රනාන්දු, ජානකී, 1994. ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනයෙහිලා ශ්‍රී ලංකාවේ පුස්තකාලවල කාර්යභාරය. පුස්තකාල ප්‍රවෘත්ති, ජුලි-සැප්., 19-24
2. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මධ්‍යස්ථානය, 2000. දසවස් සමරුම : 1990-2000.සම්පා. උපාලි අමරසිරි, කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මධ්‍යස්ථානය
3. Kaul, H. K.(ed)., 2004. National Library Services, Kolkata. National Library of India
4. URL : www.ifla.org/

# ශ්‍රී ලංකා ජාතික ඒකාබද්ධ සූචියේ ආරම්භය හා විකාශනය පිළිබඳ හැඳින්වීමක්

ජානකී ප්‍රනාන්දු
පුස්තකාල උපදේශක
(ජාතික පුස්තකාලයේ හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ)

## හැඳින්වීම

ලෝකයේ ඇති විඥාපන අවශ්‍යතා සපුරාලීමට කටයුතු කිරීම පුස්තකාල ක්ෂේත්‍රය මුහුණපාන සුවිශේෂවූ අභියෝගයකි. මුද්‍රිත, ශ්‍රව්‍ය දෘශ්‍ය විද්‍යුත් යන මාධ්‍ය ඔස්සේ දිනෙන් දින නිරතුරුවම ගලා එන තොරතුරු පාලනය කිරීම මෙන්ම ක්‍රමානුකූලව සහ ඉතා ඉක්මණින් එම තොරතුරු පාඨකයන් අතට පත් කිරීම ඊට සමාන්තර වේගයකින් කළ යුතුවේ. වත්මන්හි පොත්පත් සහ පොත්පත් නොවන වෙනත් පුස්තකාල ද්‍රව්‍ය ප්‍රකාශයට පත්වීම ඉතා සීඝ්‍රයෙන් සිදුවන අතර, එක් පුස්තකාලයකට මෙකී සියලුම සම්පත් අත්පත් කරගැනීම ඉතා දුෂ්කර කාර්යයක් වී තිබේ. ලෝකයේ තොරතුරු සොයා යන පාඨක සමූහයාගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීම හුදෙකලා පුස්තකාල සේවාවක් මගින් සිදු කළ නොහැක. මෙයට පිළියමක් වශයෙන් පුස්තකාල ස්වයංපෝෂණ සංකල්පයෙන් ඈත් වී පුස්තකාල සහයෝගීතාව යන සංකල්පය දෙසට නැඹුරුවීමේ ප්‍රවනතාවයක් ඇති බව වත්මන්හි පුස්තකාල ක්ෂේත්‍රය දෙස බලන විට පෙනීයන කරුණකි. ජාතික ඒකාබද්ධ සූචිය බිහිවීම ද මෙහි ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැක.

## ජාතික ඒකාබද්ධ සූචියක් යනු කුමක්ද?

කිසියම් පුස්තකාලයක ඇති පුස්තකාල සම්පත් (පොත් පත් සහ අනෙකුත් පුස්තකාල ද්‍රව්‍ය) පිළිබඳ ග්‍රන්ථ විඥානාත්මක තොරතුරු ඇතුළත්, ක්‍රමානුකූලව පිළියෙල කරන ලද ලැයිස්තුව පුස්තකාල සූචියක් (Library Catalogue) යනුවෙන් හැඳින්වීමට පුළුවන. පුස්තකාල සූචිය කිසියම් පුස්තකාලයක ඇති පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ තොරතුරුවලට පමණක් සීමාවන අතර, අදාළ පාඨකයාට පහසුවෙන් මෙන් ම ඉක්මනින් ද තමන්ට අවශ්‍යවන පුස්තකාල ද්‍රව්‍ය සොයාගැනීමට උපකාර වන මෙවලමකි.

ඒකාබද්ධ සූචිය (Union Catalogue) පුස්තකාල සූචියට වඩා වෙනස් වූවකි. කිසියම් භූගෝලීය පිහිටීමක් හෝ විෂය ක්ෂේත්‍රයක් හෝ පුස්තකාල වර්ගයක් පදනම් කර ගෙන පුස්තකාල ගණනාවක් විසින් අත්පත් කරගනු ලබන පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ ග්‍රන්ථ විඥානාත්මක තොරතුරු ඒකීය ස්වරූපයකට අනුව එක්රැස්කොට, ක්‍රමානුකූල ව පිළියෙල කරන ලද ලැයිස්තුව ඒකාබද්ධ සූචියක් ලෙස හැඳින්වීමට පුළුවන. මෙහි දී පුස්තකාල ගණනාවක් අතුරින් එක් පුස්තකාලයක් කේන්ද්‍රීය කරගෙන එහි ඒකාබද්ධ සූචිය පවත්වාගෙන යනු ලැබේ. අදාළ භූගෝලීය ප්‍රදේශයෙහි හෝ විෂය ක්ෂේත්‍රයට සම්බන්ධිත හෝ, පුස්තකාල වර්ගයට අයත් හෝ සියලුම පුස්තකාලයන්හි ඇති පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු එක් ස්ථානයකින් පාඨකයින් වෙත ලබාදීම සිදුවේ. ඒකාබද්ධ සූචීන්ට නිදසුන් ලෙස විද්‍යාව හා තාක්ෂණය, කෘෂිකර්මය, පරිසරය වැනි විෂය ක්ෂේත්‍රයන්ට අදාළ ව පිහිටුවා ඇති පුස්තකාල ජාල යටතේ පවත්වාගෙන යනු ලබන ඒකාබද්ධ සූචීන්, විශ්වවිද්‍යාල පුස්තකාලයන්හි ඇති පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ ව පවත්ගෙන යනු ලබන ඒකාබද්ධ සූචිය, නීතිය යන විෂය ක්ෂේත්‍රයට අදාළ පුස්තකාල විසින් පවත්වාගෙන යනු ලැබූ ඒකාබද්ධ සූචිය දැක්වීමට පුළුවන.

ජාතික ඒකාබද්ධ සූචිය (National Union Catalogue) ඉහත සඳහන් කරනු ලැබූ සූචීන් දෙකට ම වඩා වෙනස් වේ. කිසියම් රටක පවත්නා පුස්තකාල සතුව ඇති පුස්තකාල ද්‍රව්‍යයන්හි සම්පූර්ණ එකතුව හෝ එකතුවෙහි කොටසක් පිළිබඳ, ග්‍රන්ථ විඥානාත්මක තොරතුරු ඇතුළත්, එක් ක්‍රමයක් හෝ ක්‍රම කිහිපයකට අනුව සංවිධානය කරනු ලැබූ පොදු ලැයිස්තුවක් ලෙස ජාතික ඒකාබද්ධ සූචිය හැඳින්විය හැක. ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය කිරීම හා පවත්වාගෙන යාම සාමාන්‍යයෙන් කිසියම් රටක ජාතික පුස්තකාලයක කාර්යයක් මෙන්ම ප්‍රධාන වගකීමක් ලෙස ද සැළකෙන බැවින්, ජාතික පුස්තකාල විසින් ජාතික ඒකාබද්ධ සූචීන් සම්පාදනය කිරීමේ කාර්යයෙහිලා මූලිකත්වය ගෙන ඇති බව පැහැදිලි ව පෙනී යන කරුණකි. මේ අනුව ජාතික පුස්තකාල විසින් එක් එක් රටවල ඇති පුස්තකාල සතු, පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු එක්රැස් කොට ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය කර ඇති අතර, ඒ මගින් එක් ස්ථානයක සිට අනිකුත් පුස්තකාලයන්හි ඇති පුස්තකාල සම්පත් පිළිබඳ ව පර්යේෂකයින් හා අනෙකුත් පාඨකයින්හට තොරතුරු ලබාදීම සිදුකෙරේ. විද්‍යාව හා තාක්ෂණය, කෘෂිකර්මය, කර්මාන්ත, පරිසරය, සමාජ විද්‍යා ආදී වශයෙන් විවිධ විෂය ක්ෂේත්‍ර අනුව ස්ථාපිත වී ඇති විඥාපන ජාල මගින් එකී පුස්තකාලවල

ඇති සම්පත් පිළිබඳව සම්පාදනය කර ඇති ඒකාබද්ධ සූචීන් එක් කිරීම තුළින් ද ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය කිරීමේදී කටයුතු කළහැක.

**ජාතික ඒකාබද්ධ සූචියක් රටකට අවශ්‍ය ඇයි?**

මූලික වශයෙන් **කිසියම් රටක ඇති ප්‍රකාශන සොයාගැනීමටත්, එම ප්‍රකාශන ඇත්තේ කුමන පුස්තකාලවල ද යන්න ගැන දැනගැනීම සඳහාත්** ජාතික ඒකාබද්ධ සූචියක් තිබීම වැදගත් වේ. කිසියම් රටක ඇති විවිධ මාධ්‍යයෙන් ප්‍රකාශයට පත්වූ දැනුම් සම්භාරය පිළිබඳ ග්‍රන්ථ විඥානාත්මක තොරතුරු ජාතික ඒකාබද්ධ සූචිය මගින් විදහා දැක්වීම එක් අරමුණක් වන බැවින් ජාතික ඒකාබද්ධ සූචියක් රටකට තිබිය යුතුවේ.

පුස්තකාල සම්පත් අත්පත් කරගැනීමේ දී පුස්තකාල අතරෙහි ඇතිවන **අනවශ්‍ය ද්විත්වකරණය වලක්වාලීමට** ජාතික ඒකාබද්ධ සූචියක් මගින් හැකි වේ. විශේෂයෙන්ම ඉතා අධික මිලකින් යුත් පුස්තකාල ද්‍රව්‍ය මිල දී ගැනීමේ දී එම ද්‍රව්‍ය වෙනත් පුස්තකාලයක ඇත්ද යන්න ජාතික ඒකාබද්ධ සූචිය මගින් සොයාගත හැක. මෙහි දී එම පොත මිලට නොගෙන එය ඇති පුස්තකාලය වෙතින් තාවකාලික ව ලබාගෙන භාවිතා කිරීමට හැකියාවක් ඇති වේ.

ජාතික ඒකාබද්ධ සූචිය මගින් සාමාජික පුස්තකාලවල ඇති පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු සොයා ගැනීමට ඇති හැකියාව නිසා, පාඨකයන්ට මෙන්ම පර්යේෂකයන්ට අවශ්‍ය පුස්තකාල ද්‍රව්‍ය පරිශීලනය කළ හැකි පුස්තකාලය වෙත යොමු කිරීමට **යොමුගත සේවාව** (Referral Service) මගින් හැකියාවක් ලැබේ.

**අන්තර් පුස්තකාල පිරුළු ක්‍රමය** (Inter-library loan system) තුළින් සම්පත් බෙදා හදා ගැනීමේ දී ප්‍රකාශන වෙත ප්‍රවේශ වීමට පහසු කරවීමක් ජාතික ඒකාබද්ධ සූචිය මගින් සිදු වේ. එක් එක් වර්ගවලට අයත් පුස්තකාල එම පුස්තකාල වර්ගයට සම්බන්ධිත පාඨකයින්ට පමණක් සීමාවන බැවින්, එකී පුස්තකාලවල ඇති සම්පත් පොදුවේ පාඨකයින්ට පරිහරණය කිරීමට අපහසු වේ. මෙවැනි අවස්ථාවල දී ජාතික ඒකාබද්ධ සූචිය වෙතින් පාඨකයාට අදාළ පුස්තකාල ද්‍රව්‍ය ඇති පුස්තකාලය සොයා ගැනීමට හැකි වන අතර, අන්තර් පුස්තකාල පිරුළු ක්‍රමය යටතේ එම පොත එකී පුස්තකාලය වෙතින් තම පුස්තකාලය වෙත ලබාගෙන, අදාළ පාඨකයාට පුස්තකාලය

තුළ සිට එම පොත භාවිතා කිරීමට කටයුතු සැලසීමට පුස්තකාලයාධිපතිට හැකියාවක් ලැබේ.

**ග්‍රන්ථ නාමාවලී සම්පාදනයේ දී සහ පුස්තකාල ද්‍රව්‍ය සූචිකරණයේ දී** වෙනත් පුස්තකාලවලට ග්‍රන්ථ විඥානාත්මක තොරතුරු ලබාගැනීමට ජාතික ඒකාබද්ධ සූචිය උපකාරී විය හැක.

ජාතික ඒකාබද්ධ සූචියක අවශ්‍යතාවය වෙනත් අයුරකින් කිවහොත් පුස්තකාලවල ඇති සම්පත් හා තොරතුරු බෙදා හදා ගැනීමේ සංකල්පය ලෙස හැඳින්විය හැක. එමෙන්ම ජාතික ඒකාබද්ධ සූචිය පුස්තකාල එකිනෙකට බැඳ තබන පුරුකකි. මෙය පුස්තකාල ජාලයක් ලෙස ද හැඳින්වීමට පුළුවන.

## ජාතික ඒකාබද්ධ සූචිය සහ ජාතික පුස්තකාලය

ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය කිරීම සහ පවත්වාගෙන යාම ඕනෑම රටක ජාතික පුස්තකාලයට අයත් කර්තව්‍යයක් මෙන්ම ප්‍රධාන වගකීමක් ද වන බව අන්තර්ජාතික මෙන්ම ජාතික වශයෙන් ද පිළිගෙන ඇති අතර, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් මේ පිළිබඳව කරුණු දැක්වීමේදී එය ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයෙහි, වත්මන්හී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයෙහි කාර්යයන් අතරට එක් වී ඇති බව පෙනී යන්නකි.

සෞදි අරාබියේ ජෙඩාහි, අබ්දුල් අසීස් විශ්වවිද්‍යාලයේ සහාය මහාචාර්ය මොහමඩ් අල්-නහරි විසින් 1984 දී ජාතික පුස්තකාල කාර්ය භාරය පිළිබඳව කරන ලද පර්යේෂණය මුල් කොට ගෙන ජාතික පුස්තකාල කාර්යයන් වර්ග කිරීමක් කර ඇත. එම වර්ග කිරීම අනුව ජාතික පුස්තකාලයක දෙවන ප්‍රමුඛතා කාර්යයන් යටතේ "ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය" දක්වා ඇත. ආසියාවේ ජාතික පුස්තකාල සැලසුම් කිරීම පිළිබඳ 1967 කොළඹ පැවැති යුනෙස්කෝ විශේෂඥ රැස්වීම් වාර්තාවෙහි යෝජිත ශ්‍රී ලංකා ජාතික පුස්තකාල කාර්යයන් යටතේ "ශ්‍රී ලංකාවේ ප්‍රකාශන පිළිබඳ ඒකාබද්ධ සූචිය සකස් කිරීම සහ ශ්‍රී ලංකාවේ වාර සඟරා පිළිබඳ ඒකාබද්ධ ලැයිස්තුවක් සකස් කිරීම" දක්වා ඇත. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ මණ්ඩලීය පත්‍රිකා අංක 53-1974 හි යෝජිත ශ්‍රී ලංකා ජාතික පුස්තකාල කාර්යයන් යටතේ ඇති ජාතික ග්‍රන්ථ විඥාපන මධ්‍යස්ථානය වශයෙන් කටයුතු කිරීම

යටතේ "ලංකාවේ ප්‍රධාන පුස්තකාලවල ඇති නවකතා නොවන පොත්වල ඒකාබද්ධ සූචියක් පවත්වාගෙන යාම" දක්වා ඇත. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය - 1985 යෝජිත ශ්‍රී ලංකා ජාතික පුස්තකාල කාර්යයන් යටතේ "ශ්‍රී ලංකාවේ පුස්තකාලවල ඇති පුස්තකාල එකතුන් පිළිබඳ තොරතුරු ඇතුළත් ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය කිරීම" දක්වා ඇත.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විසින් ශ්‍රී ලංකාවේ ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය සඳහා ප්‍රථමයෙන් ම කටයුතු කිරීම ආරම්භ කරන ලද්දේ 1986 වර්ෂයේ දීය. 1986 සිට 2007 සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී අදියර කිහිපයකින් යුතුව ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය කිරීමේ කාර්යය සිදුවිය.

## පළමු අදියර

ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය සඳහා මූලික කටයුතු ආරම්භ කිරීම 1986.12.01 දින සිදුවිනි. මෙම අදියරෙහි දී සහභාගි කරගන්නා පුස්තකාල වර්ග තීරණය කිරීම සිදුවුන අතර, ඒ අනුව විශ්වවිද්‍යාල පුස්තකාල, ප්‍රධාන මහජන පුස්තකාල, විශේෂ පුස්තකාල සහ කාර්මික විද්‍යාල පුස්තකාල යන පුස්තකාල වර්ගවලින් ඒවායේ ඇති පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම ආරම්භ කරන ලදි. තොරතුරු ලබා ගැනීමේදී සියලුම විෂයයන් ආවරණය කිරීමටත්, පුස්තකාලවල ඇති ප්‍රාථමික, ද්විතීක හා තෘතීක විඥාපන මූලාශ්‍ර ඇතුළත් කිරීමටත්, සූචි සංලේඛ කර්තෘ, ග්‍රන්ථ නාමය සහ විෂය අනුව පිළියෙල කිරීමටත්, සූචිකරණයේ දී ඇන්ග්ලෝ ඇමරිකානු සූචිකරණ නීති සංග්‍රහය II අනුව සංලේඛ පිළියෙල කිරීමටත්, වර්ගීකරණය ඩිවි දශම වර්ගීකරණය අනුව කිරීමටත්, පුස්තකාලවල ඇති පුස්තකාල සම්පත් පිළිබඳ තොරතුරු ලබාගැනීමේ දී කාලීන තොරතුරු සහ පූර්වකාලීන තොරතුරු වශයෙන් දෙආකාරයකින් ලබා ගැනීමට කටයුතු කිරීමටත් තීරණය විය. 1986 වර්ෂයේදී ජාතික ඒකාබද්ධ සූචියට කාලීන තොරතුරු ලබාදීමෙන් දායක වූ පුස්තකාල සංඛ්‍යාව 06කි. විශ්වවිද්‍යාල පුස්තකාල 03ක්, මහජන පුස්තකාල 02ක් සහ විශේෂ පුස්තකාල 01ක් මීට අයත් විය. එම පුස්තකාල වනුයේ කොළඹ විශ්වවිද්‍යාලීය පුස්තකාලය, කැලණිය විශ්වවිද්‍යාලීය පුස්තකාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලීය පුස්තකාලය, කොළඹ මහජන පුස්තකාලය, මහනුවර මහජන පුස්තකාලය සහ ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතන පුස්තකාලයයි.

## දෙවන අදියර

කාලීන තොරතුරු ලබාගැනීම සඳහා 1986 දී කටයුතු ඇරඹුව ද, එය අඛණ්ඩව සිදු නොවුන බැවින් 1988 දී යලි ජාතික ඒකාබද්ධ සූචිය ප්‍රතිසංවිධානය කිරීමේ අරමුණින් යුතු ව පුස්තකාල 22ක් තෝරාගන්නා ලදි. විශ්වවිද්‍යාල පුස්තකාල 09ක්, මහජන පුස්තකාල 02ක්, විශේෂ පුස්තකාල 10ක් සහ කාර්මික විද්‍යාල පුස්තකාල 01ක් මීට අයත් විය. පුස්තකාල 22ක් තෝරාගනු ලැබුව ද, ක්‍රියාකාරී පුස්තකාල ලෙස අඛණ්ඩ ව කාලීන තොරතුරු එවීමෙන් කටයුතු කරන ලද්දේ පුස්තකාල 08ක් පමණි.

## තුන්වන අදියර

ජාතික ඒකාබද්ධ සූචිය සඳහා පූර්වකාලීන තොරතුරු ලබාගැනීමට දරන ලද ප්‍රයත්නයක ප්‍රතිඵලයක් වශයෙන් 1990 සහ 1991 යන වර්ෂ තුළදී පහත සඳහන් පුස්තකාලයන්හි එකතුන් පිළිබඳ තොරතුරු සූචිපත්‍රිකා, සූචිපත්‍රිකා ඡායාපිටපත්, මුද්‍රිත පිටපත්, යතුරු ලියන පිටපත් සහ පරිගණක මුද්‍රිත පිටපත් ආදී වශයෙන් විවිධ ස්වරූප වලින් ලබාගැනීමට සමත් විය.

(1) රාජකීය ආසියාතික සමිතිය (ලංකා ශාඛාව) පුස්තකාලයේ එකතුව-1989 වර්ෂය දක්වා (සූචිපත්‍රිකා මගින් ලබාගැනීම)

(2) කොළඹ මහජන පුස්තකාලයේ ශ්‍රී ලංකා එකතුව (සූචිපත්‍රිකාවල ඡායා පිටපත් ලෙස ලබා ගැනීම)

(3) පේරාදෙණිය විශ්වවිද්‍යාල පුස්තකාලයේ ලෙස්ලි ද සේරම් විශේෂ එකතුව වර්ගීකෘත ලැයිස්තුව සම්පාදක : එම්. ඒ. ගුණපාල (මුද්‍රිත පිටපතක් ලෙස ලබාගැනීම)

(4) පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාලයේ එකතුව 1991 අගෝස්තු දක්වා (පරිගණක මුද්‍රිත පිටපතක් ලෙස ලබාගැනීම)

(5) ජාතික කෞතුකාගාර පුස්තකාලයේ ශ්‍රී ලංකා සහරා ලිපි සූචිය එකතුව (මුද්‍රිත පිටපත් වශයෙන් ලබාගැනීම)

(6) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ශිෂ්‍යයන් විසින් පරීක්ෂණ අවශ්‍යතා ලෙස සම්පාදනය කරන ලද ග්‍රන්ථනාමාවලි සහ අනුක්‍රමණිකා එකතුව (යතුරු ලියනය කරන ලද පිටපත් වශයෙන් ලබාගැනීම.)

## හතරවන අදියර

1988 වර්ෂයේදී ජාතික ඒකාබද්ධ සූචිය ප්‍රතිසංවිධානය කිරීම කළ ද, එය සාර්ථක නොවූ නිසා යළි 1992 දී ඉහත සඳහන් කරන ලද පුස්තකාල 22ට අමතරව තවත් පුස්තකාල 28 තෝරාගනිමින් පුස්තකාල සංඛ්‍යාව 50 දක්වා ව්‍යාප්ත කරන ලදි. 1992 වර්ෂයේ සිට මෙම පුස්තකාල 50 විසින් අත්පත් කරගන්නා ලද පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු ජාතික ඒකාබද්ධ සූචියට ලබාදෙන මෙන් ඉල්ලීමක් කරන ලදි. එහෙත් කාලීන තොරතුරු ලබාදීමෙන් ක්‍රියාකාරී ලෙස කටයුතු කරන ලද්දේ පුස්තකාල 07ක් පමණි.

## පස්වන අදියර

1993 දී ජාතික ඒකාබද්ධ සූචිය යළි ප්‍රතිසංවිධානය කිරීමට කටයුතු කරන ලදි. ඒකාබද්ධ සූචිය සම්පාදනය හා අඛණ්ඩව පවත්වා ගෙන යාමේ ජාතික කර්තව්‍යය ඉහත වර්ෂවලට වඩා ක්‍රමානුකූලව මෙන් ම ඵලදායී අයුරින් කිරීම මෙම ප්‍රතිසංවිධානයේ මූලික අරමුණ වින. ජාතික ඒකාබද්ධ සූචියේ වැදගත්කම, ජාතික කර්තව්‍යයක් ලෙස සලකා ශ්‍රී ලංකාවේ පුස්තකාලවල පුස්තකාලයාධිපතීන් එම කාර්යයට සහභාගිවීමේ වැදගත්කම සඳහන් කොට ලිපියක් සහ කෙටි ප්‍රශ්නාවලියක් ද,1992 වර්ෂයේදී තෝරාගනු ලැබූ පුස්තකාල 50 වෙත යැවීම සිදුවින. ප්‍රශ්නාවලිය යවනු ලැබූ පුස්තකාල 50න් 26ක් ඊට ප්‍රතිචාරය දක්වා තිබුණි. ජාතික ඒකාබද්ධ සූචිය සඳහා දායකත්වය පිළිබඳ තොරතුරු, දායකවීමට ඇති ගැටළු, පුස්තකාල සම්පත් පිළිබඳ ව තොරතුරු එවීමට බලාපොරොත්තුවන ස්වරූපය, ජාතික ඒකාබද්ධ සූචිය සම්බන්ධයෙන් අදහස් සහ යෝජනා ආදිය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගැනීමට එම ප්‍රතිචාරය තුළින් හැකිවින.

1994 මාර්තු මස 17 වෙනි දින පුස්තකාලවල ප්‍රධානීන් සඳහා දින ½ සම්මන්ත්‍රණයක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ දී පැවැත්වින. තෝරාගනු ලැබූ පුස්තකාල 50 පුස්තකාලයාධිපතීන් සඳහා පැවැති මෙම සම්මන්ත්‍රණයේ දී ජාතික ඒකාබද්ධ සූචියක

ඇති වැදගත්කම සහ එම ජාතික කර්තව්‍යය සියලු ම පුස්තකාලවල සහභාගිත්වයෙන් සිදුවිය යුත්තක් බව පෙන්වා දෙන ලදි. මෙය ඉතා ඵලදායී සම්මන්ත්‍රණයක් විය. 1995 වර්ෂය වනවිට ජාතික ඒකාබද්ධ සූචියට දායක වූ පුස්තකාල සංඛ්‍යාව 7 සිට 31 දක්වා වැඩි විය.

## හයවන අදියර

### ජාතික ඒකාබද්ධ සූචිය පරිගණකගත කිරීම සඳහා මූලික කටයුතු ඇරඹීම

පරිගණකගත කෙරෙන පුස්තකාල කාර්යයන් අතුරින් පරිගණක ඒකාබද්ධ සූචි, පරිගණක පද්ධති කාර්යයන් යටතට ගැනේ. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විසින් සිය කාර්යයන් අතුරින් පරිගණකගත කළයුතු කාර්යයන් මොනවාද යන්න හඳුනාගැනීමේදී ජාතික ඒකාබද්ධ සූචිය පරිගණකගත කිරීම ද ඊට ඇතුළත් කරන ලදි. මේ සඳහා මූලික කටයුතු ආරම්භ කිරීම 1994 වර්ෂයේදී සිදුවිය. එහෙත් එම වර්ෂය වන විට ජාතික ඒකාබද්ධ සූචියට දායක වූ පුස්තකාල සියල්ලම සිය පුස්තකාල එකතුන් පරිගණකගත කිරීමේ කාර්ය අරඹා නොතිබුන බැවින්, එක්වරම ජාතික ඒකාබද්ධ සූචිය පරිගණකගත කිරීමට හැකියාවක් නොමැති විය. මේ නිසා පුස්තකාල එකතුන් පරිගණකගත කර ඇති පුස්තකාල වෙතින් පරිගණක තැටිලි (ඩිස්කට්) හෝ පරිගණක මුද්‍රිත පිටපත් ස්වරූපයෙන් ජාතික ඒකාබද්ධ සූචියට තොරතුරු ලබාගැනීමත්, පරිගණකගත කර නොමැති පුස්තකාල වෙතින් ශ්‍රමිකව (Manual) තොරතුරු ලබාගැනීමත් සමාන්තරව කළයුතු විය.

මෙහිදී එවකට දායක වූ පුස්තකාල බොහොමයක් විසින් භාවිත කරනු ලැබූ සූක්ෂම සී. ඩී. එස්/අයිසිස් (Micro CDS/ISIS) නැමැති මෘදුකාංග දත්ත පදනම් පාලන පද්ධතිය මූලික වශයෙන් යොදා ගැනීම සිදුකෙරුනි. මෙම දත්ත පදනම සකස් කිරීමේ කාර්යය මෙන්ම පරිගණකගත ඒකාබද්ධ සූචියේ කටයුතු වලදී එවකට අන්තර් ජාතික වාරි කළමනාකාරිත්ව ආයතනයේ ප්‍රධාන පුස්තකාලයාධිපති වශයෙන් කටයුතු කළ එන් යූ යාපා මහතාගේ උපදේශකත්වය ලබාගැනීමට කටයුතු කරන ලදී. ඇතැම් පුස්තකාල වෙනත් මෘදුකාංග පද්ධතීන් භාවිතා කළ ද, ජාතික ඒකාබද්ධ සූචියට තොරතුරු එවීමට එය බාධාවක් නොවීය. ජාතික ඒකාබද්ධ සූචිය සඳහා පරිගණක පද්ධතියක් ඇති කිරීමටත්, දත්ත ප්‍රවිෂ්ඨ කිරීම සඳහා පොදු ආකෘතියක් පිළියෙල කිරීමටත්, ජාතික ඒකාබද්ධ සූචිය පරිගණකගත කිරීම හා

අදාළව දායක පුස්තකාල සඳහා වැඩමුළුවක් පැවැත්වීමටත් ඉදිරි වර්ෂයන් සඳහා සැලසුම් පිළියෙල කිරීම සිදුවිනා.

**හත්වන අදියර**

1996 වසරේදී ජාතික ඒකාබද්ධ සූචිය පරිගණකගත කිරීම ආරම්භ කරන ලදි. 2000 වසරේ අවසානය වනවිට මෙරට ප්‍රධාන පුස්තකාල 59 ජාතික ඒකාබද්ධ සූචිය සඳහා දායක කරගැනීමට හැකිවිනා. මුළු දායක පුස්තකාල සංඛ්‍යාවෙන් පුස්තකාල 32ක් පරිගණකගත ඩිස්කට් ස්වරූපයෙන් තොරතුරු සැපයීම සිදුකල අතර, ඒ වනවිට දත්ත පදනමට සංලේඛ 1,27,208ක දත්ත ප්‍රවිෂ්ඨ කිරීම සිදුකරන ලදි. දත්ත පදනම ඇසුරින් ජාතික ඒකාබද්ධ සූචිය මුද්‍රිත පිටපත් කොටස් වශයෙන් ප්‍රකාශයට පත්කිරීම සිදුකරන ලද අතර, i, ii, iii, iv සහ v වශයෙන් කොටස් 5කින් මුද්‍රිත පිටපත් ප්‍රකාශයට පත් කෙරිනා. මෙම මුද්‍රිත පිටපත් දායක පුස්තකාලවලට නොමිලේ ලබාදෙන ලදි.

මෙම දත්ත පදනම මූලික වශයෙන් සකස් කරන ලද්දේ CDS/ISIS යන මෘදුකාංගය භාවිතා කිරීමෙනි. ඉන්පසු WINISIS ද භාවිතා කරන ලදි. 2001 වසරේ සිට මෙම දත්ත පදනම සඳහා Alice for Windows (AFW) මෘදුකාංගය භාවිතා කිරීම ඇරඹිනා. 2001 වර්ෂයේ සිට ජාතික ඒකාබද්ධ සූචිය මාර්ගගත සූචියට OPAC (On-line Public Access Catalogue) සම්බන්ධ කරන ලදි. 2003 වසරේදී ජාතික ඒකාබද්ධ සූචිය අන්තර්ජාලයට ඇතුළත් කරන ලදි. එතැන් සිට ජාතික පුස්තකාල වෙබ් අඩවිය ඔස්සේ ජාතික ඒකාබද්ධ සූචිය පරිශීලනය කිරීමට හැකියාවක් ඇත. වෙබ් ලිපිනය වනුයේ http://www.natlib.lk ය.

**ජාතික ඒකාබද්ධ සූචියේ ව්‍යාප්තිය**

**ජාතික ඒකාබද්ධ සූචියෙහි වත්මන් තත්වය**


1986දී පුස්තකාල 6කින් ආරම්භ කරන ලද ජාතික ඒකාබද්ධ සූචියේ පුස්තකාල සංඛ්‍යාව ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වී 2007 වර්ෂයේ සැප්තැම්බර් 30 වන විට ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුස්තකාල 77ක් ඊට දායක වී ඇත. ජාතික ඒකාබද්ධ සූචියට දායකවන පුස්තකාල වර්ග අනුව විශ්වවිද්‍යාල පුස්තකාල, පශ්චාත් උපාධි ආයතන

පුස්තකාල, මහජන පුස්තකාල, රජයේ දෙපාර්තමේන්තු පුස්තකාල, රාජ්‍ය නොවන ආයතන පුස්තකාල, විශේෂ පුස්තකාල හා කාර්මික විද්‍යාල පුස්තකාල වේ.

### ජාතික ඒකාබද්ධ සූචියෙහි වත්මන් තත්වය

### 1986 සිට 2007 සැප්තැම්බර් 30 දක්වා මුළු දායක පුස්තකාල සංඛ්‍යාව - 77

### දායක පුස්තකාල වර්ග - සංඛ්‍යාත්මකව




### දායක පුස්තකාල සංඛ්‍යාවේ වර්ධනය

ජාතික ඒකාබද්ධ සූචිය සඳහා 1986 සිට 2007 සැප්තැම්බර් 30 දක්වා දායකව ඇති පුස්තකාල සංඛ්‍යාව 77කි. දායක පුස්තකාල සංඛ්‍යාවේ වර්ධනය පහත දැක්වේ.

| වර්ෂය | දායක පුස්තකාල සංඛ්‍යාව |
|---|---|
| 1986 | 06 |
| 1995 | 31 |
| 1996 | 46 |
| 1997 | 48 |
| 1998 | 53 |
| 1999 | 56 |
| 2000 | 66 |
| 2001 | 68 |
| 2002 | 71 |

| | |
|---|---|
| 2003 | 75 |
| 2004 | 75 |
| 2005 | 77 |
| 2006 | 77 |
| 2007 සැප්. 30 | 77 |

**පරිගණකගත ජාතික ඒකාබද්ධ සූචියේ දත්ත සංඛ්‍යාවේ වර්ධනය**

1997 සිට 2007 සැප්තැම්බර් 30 දක්වා ජාතික ඒකාබද්ධ සූචිය දත්ත පදනමෙහි ඇතුළත් මුළු සංලේඛ සංඛ්‍යාව 448, 258කි. දත්ත සංඛ්‍යාව වර්ධනය වූ ආකාරය පහත දැක්වේ.

| වර්ෂය | දත්ත සංඛ්‍යාව |
|---|---|
| 1997 | 38,610 |
| 1998 | 49,210 |
| 1999 | 67,530 |
| 2000 | 127,208 |
| 2001 | 238,297 |
| 2002 | 264,200 |
| 2003 | 301,006 |
| 2004 | 324,200 |
| 2005 | 372,654 |
| 2006 | 431,061 |
| 2007 සැප්. 30 | 448,258 |

**ජාතික ඒකාබද්ධ සූචිය සඳහා පරිගණකගත සහ ශ්‍රමික වශයෙන් තොරතුරු එවන දායක පුස්තකාලවල තත්වය**

දායක පුස්තකාල 77න් පරිගණකගත ස්වරූපයෙන් පුස්තකාල 54ක් ද ශ්‍රමිකව පුස්තකාල 23ක් ද 2007 සැප්තැම්බර් වන විට ජාතික ඒකාබද්ධ සූචියට තොරතුරු එවීම සිදුකර ඇත. එම පුස්තකාලවල තත්වය පහත දැක්වෙන සටහනෙන් පැහැදිලි වේ.

| වර්ෂය | පරිගණකගත | ශ්‍රමික |
|---|---|---|
| 1997 | 25 | 23 |
| 1998 | 26 | 27 |
| 1999 | 28 | 28 |
| 2000 | 35 | 31 |
| 2001 | 42 | 26 |
| 2002 | 45 | 26 |
| 2003 | 48 | 27 |

| | | |
|---|---|---|
| 2004 | 52 | 23 |
| 2005 | 54 | 23 |
| 2006 | 54 | 23 |
| 2007 සැප්. 30 | 54 | 23 |

තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමග පුස්තකාල සිය එකතුන් පිළිබඳ ග්‍රන්ථ විඥානාත්මක තොරතුරු පරිගණකගත කිරීම කෙරෙහි නැඹුරුවක් දක්වා ඇති බව ඉහත දැක්වෙන සංඛ්‍යාලේඛන අනුව පෙනී යනු ඇත.

### ජාතික ඒකාබද්ධ සූචියෙහි සංවිධානය

සාමාජික පුස්තකාල විසින් සිය පුස්තකාලවල ඇති පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ ග්‍රන්ථ විඥානාත්මක තොරතුරු ජාතික පුස්තකාලය විසින් සම්පාදනය කරනු ලබන ජාතික ඒකාබද්ධ සූචිය සඳහා එවීම සිදු වේ. අදාළ තොරතුරු එවීමේදී එක් එක් පුස්තකාල විවිධ ස්වරූපයෙන් තොරතුරු එවීම සිදුවින. ආරම්භයේ සිට 1997 පමණ වන තෙක් තොරතුරු ලැබුණු ආකාරය වනුයේ: සූචිපත්‍රිකා, පරිග්‍රහණ ලේඛනයේ ඡායා පිටපත්, නව ප්‍රතිග්‍රහණ ලැයිස්තු, පරිගණක මුද්‍රිත පිටපත්, සූක්ෂම සේයා පත්‍ර, පරිගණක තැටිලි සහ ISO ගොනුවක් ලෙස විද්‍යුත් තැපැල (e-mail) මගිනි.

සූචිපත්‍රිකා මගින් තොරතුරු එවීමේ දී ප්‍රධාන සූචි සංලේඛය ලෙස ලැබෙන කාඩ්පතට අමතර වශයෙන් ග්‍රන්ථනාමය සහ විෂය සඳහා සංලේඛ දෙකක් පිළියෙල කිරීම ජාතික පුස්තකාලය විසින් සිදු කෙරින. සූචිපත්‍රිකා ස්වරූපයෙන් තොරතුරු නොලැබෙන විට දී සංලේඛ තුනක් පිළියෙල කිරීමට සිදු වින. එනම් ප්‍රධාන සංලේඛය, ග්‍රන්ථනාම සංලේඛය සහ විෂය සංලේඛය යනුවෙනි. සූක්ෂම සේයා පත්‍ර වශයෙන් ලැබෙන විට සූක්ෂම සේයා පත්‍ර ඒවා සඳහා ඇති කියවීමේ හා මුද්‍රණ යන්ත්‍රයේ (Microfiche Reader Printer) ආධාරයෙන් සූක්ෂම සේයා පත්‍රවල ඡායා පිටපත් ලබාගෙන ඒවා භාවිතයෙන් යතුරු ලියනය කොට සංලේඛ තුනක් පිළියෙල කිරීම කළයුතු වින. තොරතුරු එවීමේ දී සියලු ම පුස්තකාලවල ඒකාකාර බවක් නොමැති වූයෙන් බොහෝ සෙයින් සංස්කරණ කටයුතු කළයුතු වින. ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනයේ දී ආරම්භයේ සිට පරිගණකගත කරන තුරු විවිධ අපහසුතාවයන්ට මුහුණ දීමට සිදුවින. පරිගණකගත කළ පසුව ද පරිගණක තැටිලි ලබාගෙන, එම දත්ත තාවකාලික දත්ත පදනමකට ඇතුළත් කර, සංලේඛවල සංස්කරණ කටයුතු කිරීමෙන් අනතුරුව ප්‍රධාන දත්ත පදනමට ඇතුළත් කළයුතු වින.

සූචියේ ව්‍යුහය අනුව සූචි පත්‍රිකා ගොනු කිහිපයක් ඇත. එකී ගොනු වනුයේ : ප්‍රධාන සංලේඛ ගොනුව, ග්‍රන්ථනාම ගොනුව සහ විෂය ශීර්ෂ ගොනුව යනුවෙනි. මෙලෙස ගොනු කිහිපයක් සකස් කර ඇත්තේ, පාඨකයින්හට තමන්ට අවශ්‍ය පුස්තකාල ද්‍රව්‍ය සොයාගැනීමේදී විවිධ ආකාරයෙන් මෙන් ම ක්ෂණිකව ද එකී ද්‍රව්‍ය වෙත ප්‍රවේශවීමට හැකිවන පරිදි ය. සංලේඛ සූචිකරණය ඇන්ග්ලෝ ඇමරිකානු සූචිකරණ නීති මාලාවේ දෙවන සංස්කරණය අනුවත්, වර්ගීකරණය ඩිවි දශම වර්ගීකරණය අනුවත් සිදු වේ.

ජාතික ඒකාබද්ධ සූචියට ආයත්වන සාමාජික පුස්තකාල හැඳින්වීම සඳහා කෙටි හැකුළුම් පදයක් භාවිත කෙරේ.

නිදසුන් : කෙටි හැකුළුම් පදය

| | | |
|---|---|---|
| ACC | - | Arthur C. Clarke Centre for Modern Technology |
| MI | - | Marga Institute |
| NIBM | - | National Institute of Business Management |
| PLC | - | Public Library, Colombo |
| RRI | - | Rubber Research Institute |
| UC | - | University of Colombo |

ජාතික ඒකාබද්ධ සූචියෙහි ඇති සෑම සූචි සංලේඛයක ම එකී ප්‍රකාශනය ඇති පුස්තකාලය කුමක් ද යන්න ඉහත දක්වා ඇති පරිදි කෙටි හැකුළුම් පදය භාවිතයෙන් සටහන් කර ඇත. මේ නිසා තමන්ට අදාළ පුස්තකාල ද්‍රව්‍යය ඇති පුස්තකාලය කුමක් ද යන්න පහසුවෙන් සොයා ගැනීමට පාඨකයන්හට ජාතික ඒකාබද්ධ සූචිය මගින් හැකියාවක් ලැබේ. පුස්තකාල විසින් එවනු ලබන තොරතුරු අනුව, එකම ග්‍රන්ථය පුස්තකාල එකකට වැඩි සංඛ්‍යාවක ඇති විට දී, වඩාත් ම විස්තර ඇතුළත් කර ඇති සූචි සංලේඛය තෝරාගෙන එම පුස්තකාල ද්‍රව්‍යය ඇති අනෙකුත් පුස්තකාල මොනවාද යන්න එකී සංලේඛයෙහි සටහන් කිරීම සිදුවේ.

## ජාතික ඒකාබද්ධ සූචිය සහ ඊට සහභාගිවන පුස්තකාලවල කාර්ය භාරය

ජාතික ඒකාබද්ධ සූචිය සඳහා සහභාගිවන පුස්තකාලවල මූලික වගකීම වනුයේ තම පුස්තකාලයේ ඇති සම්පත් පිළිබඳ තොරතුරු අඛණ්ඩ ව ජාතික පුස්තකාලයට ලබාදීමයි. මෙහි දී අළුතින් පුස්තකාලයට අත්පත් කරගනු ලබන පුස්තකාල ද්‍රව්‍ය සම්බන්ධයෙන් තොරතුරු, එක් එක් පුස්තකාලය විසින් තම පුස්තකාල සූචියට ඇතුළත් කිරීමේ දී සකස් කරනු ලබන ප්‍රධාන සූචිපත්‍රිකාවෙහි අතිරේක සූචි පත්‍රිකාවක් පිළියෙල කොට ජාතික පුස්තකාලයට එවීම ඔවුන්ගේ ප්‍රධාන වෘත්තීය ම ය වගකීමක්

වේ. කාලීන තොරතුරු ලබාදීමේ දී සූචිපත්‍රිකා මගින් තොරතුරු සැපයීමේ අපහසුතාවයක් ඇත්නම්, ඒ සඳහා වෙනත් ක්‍රම යොදා ගැනීමට පුළුවන. පුස්තකාලයට අළුතින් ලබාගන්නා පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ කාලීන ව නිකුත් කරනු ලබන නව ප්‍රතිග්‍රහණ ලැයිස්තු, සිය එකතුන් පරිගණකගත කර ඇති පුස්තකාල ඇත්නම්, පරිගණක තැටිලි (ඩිස්කට්) ස්වරූපයෙන්, ISO ගොනුවක් ලෙස විද්‍යුත් තැපැල මගින්, ජාතික පුස්තකාලය වෙත තොරතුරු එවීමට පුළුවන.

තම පුස්තකාලය විසින් තොරතුරු ලබාදීමේ දී ලබාදිය හැකි ක්‍රම එකකට වඩා ඇත්නම් ඉතා ම යෝග්‍ය ක්‍රමය යොදා ගැනීමට හැමවිටම උත්සාහ කිරීම, ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය පහසුකරවීමට හේතුවනු ඇත.
නිදසුන් :

සූචිපත්‍රිකා/ප්‍රතිග්‍රහණ ලැයිස්තු - (සූචිපත්‍රිකා)
සූක්ෂම සේයා පත්‍ර/ප්‍රතිග්‍රහණ ලැයිස්තු - (ප්‍රතිග්‍රහණ ලැයිස්තු)
ප්‍රතිග්‍රහණ ලැයිස්තු/පරිගණක මුද්‍රිත පිටපත් - (පරිගණක මුද්‍රිත පිටපත්)
සූචිපත්‍රිකා/පරිගණක තැටිලි - (පරිගණක තැටිලි)
පරිගණක තැටිලි/ISO ගොනුවක් ලෙස විද්‍යුත් තැපැල මගින් (ISO ගොනුවක් ලෙස විද්‍යුත් තැපැල මගින්)

කාලීන තොරතුරු මෙන්ම සහභාගිවන පුස්තකාලවල ඇති මූලික එකතුව පිළිබඳව (පූර්වකාලීන තොරතුරු) තොරතුරු ද ජාතික ඒකාබද්ධ සූචියට ලබාගැනීම ඉතා වැදගත් වේ. මෙම තොරතුරු ලබාදීමේදී ද පුස්තකාලවලට විවිධ ක්‍රම යොදා ගැනීමට පුළුවන. තම පුස්තකාලයෙහි ඇති සූචිපත්‍රිකාවල ඡායා පිටපත් ලබාදීමට පුළුවන. පරිගණකගත කර ඇති පුස්තකාලවලට පූර්වකාලීන තොරතුරු පරිගණක තැටිලි ස්වරූපයෙන් ලබාදීමට පුළුවන. මේ හැරුණු විට පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු ඇතුළත්වන ප්‍රතිග්‍රහණ ලැයිස්තු මුල සිටම ප්‍රකාශයට පත් කර ඇත්නම්, ප්‍රතිග්‍රහණ ලැයිස්තුවල සම්පූර්ණ එකතුවක් ලබාදීමට පුළුවන. මෙවැනි ක්‍රම මගින් පුස්තකාලවල ඇති ද්‍රව්‍ය පිළිබඳ පූර්වකාලීන තොරතුරු ජාතික ඒකාබද්ධ සූචිය වෙත ලබාදීම ද සහභාගී වන පුස්තකාලවල වගකීමක් වේ.

ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය හා මැනවින් පවත්වාගෙනයාම ඉදිරියේ වූ ගැටළු රැසකි. ජාතික ඒකාබද්ධ සූචියට දායකවීමේ දී, දායකවන සමහර පුස්තකාලවලට විවිධ දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදුවන බව මේ පිළිබඳ ව කරන ලද සමීක්ෂණයක

දී පුස්තකාලයාධිපතීන් විසින් දක්වා තිබූ කරුණු අනුව පැහැදිලි වින. සේවක ඌණතාව, පුස්තකාල සූචිය අංග සම්පූර්ණ නොවීම, ක්‍රමානුකූලව සංවිධානය නොවීම, ඇතැම් පුස්තකාල ද්‍රව්‍ය සඳහා සූචිපත්‍රිකා සකස් කර නොමැති වීම, සකස් කළ සූචිපත්‍රිකා නිසි කලට එවීමට ඇති අපහසුව, හිස් සූචිපත්‍රිකා නොමැතිවීම, පරිපාලන ගැටළු වැනි විවිධ ගැටළු මෙහි දී හඳුනාගැනීම සිදුවින.

මෙම තත්ත්වය මඟහරවාලීම පිණිස මෙකී ගැටළුවලට කිසියම් ආකාරයක විසඳුමක් ලබාදීම සඳහා ජාතික පුස්තකාලය විසින් පියවර කිහිපයක් ගන්නා ලදි. එනම් ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය කිරීමේ ජාතික කාර්යයෙහි වැදගත්කම පිළිබඳ ඊට සහභාගිවන පුස්තකාල අයත්වන ආයතනයන්හි අධිකාරීන් දැනුවත් කිරීම සඳහා ඔවුන් වෙත විස්තරාත්මක ලිපියක් යැවීමට කටයුතු කරන ලදි. සහභාගීවන පුස්තකාලවල ප්‍රධානීන් සඳහා සම්මන්ත්‍රණයක් පැවැත්වීමත්, එහි දී පැවැති විශේෂ සාකච්ඡා වාරයේදී මෙම කාර්යය සාර්ථකව කළයුතු ආකාරය පිළිබඳව ඔවුන් හා සාකච්ඡා කොට අදහස් සහ යෝජනා ලබාගැනීමට කටයුතු කිරීමත්, ජාතික ඒකාබද්ධ සූචියට දායක වී තොරතුරු එවන පුස්තකාල සඳහා ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය, පුස්තකාල ප්‍රවෘත්ති, NATNET LANKA ප්‍රවෘත්ති පත්‍රිකාව වැනි මණ්ඩලීය වාරික ප්‍රකාශන නොමිලයේ ලබාදීමට කටයුතු කිරීමත්, සුදුසු සහ අවශ්‍ය පුස්තකාල වෙත හිස් සූචිපත්‍රිකා සැපයීම ආදිය ගනු ලැබූ පියවර වශයෙන් සඳහන් කිරීමට පුළුවන.

ජාතික ඒකාබද්ධ සූචිය සඳහා පරිගණකගත සහ ශ්‍රමිකව තොරතුරු එවීමේදී දායක පුස්තකාලවල පුස්තකාලයාධිපතීන්හට පැවැති දුෂ්කරතා මගහැරීම සඳහා ජාතික පුස්තකාලයේ ප්‍රලේඛන සේවා අංශය මගින් 1993 සිට 2007 දක්වා සම්මන්ත්‍රණ 7ක් සහ වැඩමුළුමාලා 5ක් පවත්වා ඇත. මෙම සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම තුලින් පුස්තකාලවල නිලධාරීන්හට අවශ්‍ය තාක්ෂණික දැනුම හා පුහුණුව ලැබීම නිසා, තොරතුරු එවීමේදී ඇති වූ දුෂ්කරතා මගහරවා ගැනීමට හැකියාවක් ලැබින. එහෙයින් අඛණ්ඩව තොරතුරු එවීමට ඔවුන් උනන්දුවක් දැක්විත. අඛණ්ඩව තොරතුරු එවීම සඳහා දායකවන පුස්තකාල දිරිමත් කිරීමේ අරමුණින් පහත දැක්වෙන අයුරින් කටයුතු කිරීමට ජාතික පුස්තකාලය පියවර ගන්නා ලදි. දායකවන පුස්තකාලවලට කෙබඳු වාසි අත්වේ ද යන්න පැහැදිලි කරදෙන ලදි.

## දායකවන පුස්තකාලවලට අත්වන වාසි

- දායකවන පුස්තකාලය ජාතික පුස්තකාලයේ විශේෂ අනුග්‍රාහක පුස්තකාලයක් ලෙස සැලකේ.
- ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය, පුස්තකාල ප්‍රවෘත්ති, Natnet Lanka ප්‍රවෘත්ති පත්‍රිකාව වැනි මණ්ඩලීය වාරික ප්‍රකාශන නොමිලේ ලැබීම.
- අන්තර් පුස්තකාල පිරුළු සේවාවලදී ප්‍රමුඛත්වයක් ලැබීම.
- පුස්තකාලවල සේවය කරන කාර්ය මණ්ඩල නිලධාරීන්ට ජාතික පුස්තකාලයේ පුහුණුවක් ලබාගැනීමට කරනු ලබන ලබන ඉල්ලීම්වලදී ප්‍රමුඛත්වයක් ලබාදීම.
- ජාතික පුස්තකාලය වෙතින් තොරතුරු ලබාගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම්වලදී විශේෂ ප්‍රමුඛත්වයක් ලැබීම.
- තම පුස්තකාලයන්හි එකතුන් පිළිබඳ තොරතුරු ඇතුළත් පරිගණක දත්ත පදනම්හි ඇති තොරතුරු කිසියම් හේතුවක් නිසා මැකී හෝ විනාශ වී ගියහොත්, ජාතික ඒකාබද්ධ සූචියට දායක වී ඇති පුස්තකාලවලට තම පුස්තකාලයේ තොරතුරු ජාතික ඒකාබද්ධ සූචිය වෙතින් ලබාගැනීමට හැකිවේ. ජාතික පුස්තකාලය විසින් මෙලෙස තොරතුරු නැතිවී ගිය වන සම්පත් දෙපාර්තමේන්තු පුස්තකාලය සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශ පුස්තකාලය වෙත ඔවුන්ගේ පුස්තකාල සම්පත් පිළිබඳ තොරතුරු ජාතික ඒකාබද්ධ සූචිය මගින් ලබාදෙන ලදී.
- අවශ්‍ය අවස්ථාවලදී තම පුස්තකාලයේ තොරතුරු පිළිබඳ අතිරේක පිටපත් (Backups) ලබාගැනීමේ හැකියාව ඇත.
- ජාතික ඒකාබද්ධ සූචිය අන්තර්ජාලයට ඇතුළත් කර ඇති බැවින් තම පුස්තකාලයේ එකතුව පිළිබඳ තොරතුරුවලට ජාතික වශයෙන් පමණක් නොව අන්තර්ජාතික වශයෙන්ද ප්‍රචාරයක් ලැබීම.

ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය හා මැනාවින් පවත්වාගෙන යාම ජාතික පුස්තකාලයට පමණක් තනිව කළහැකි කාර්යයක් නොවේ. එය ශ්‍රී ලංකාවේ ඇති අනිකුත් සියලුම පුස්තකාලව ද වෘත්තීයමය වගකීමක් වේ. මෙම ජාතික කර්තව්‍යය සඳහා සෑම පුස්තකාලයකම සහයෝගය අත්‍යවශ්‍ය වේ. ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය හා මැනවින් පවත්වාගෙන යාම කාර්යක්ෂමව ඉටුකිරීම තුළින් පර්යේෂකයින් සහ අනෙකුත් සියලුම පාඨකයන්හට මෙරට පුස්තකාලවල ඇති

පුස්තකාල ද්‍රව්‍ය මගින් තොරතුරු ලබාදීමේ දී මහඟු සේවයක් ඉටු කිරීමට හැකිවනු ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ


අමරසිරි, එම්. එස්. යූ.
සංස්කාරක සටහන්.- ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සමරු කලාපය.- කොළඹ : ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, 1990. පි. 1-18.

අමරසිරි, එම්. එස්. යූ.
ශ්‍රී ලංකා ජාතික ඒකාබද්ධ සූචිය. (මණ්ඩලීය පත්‍රිකා 236/1994)

අලහකෝන්, යූ. පී.
ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සඳහා පොදු සූචියක් සකස් කිරීමේ දී මතුවන ගැටළු සහ විසඳුම්, 1993. (1993 ඔක්තෝබර් 08 දින ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය රැස්වීමට ඉදිරිපත් කරන ලද පත්‍රිකාවකි.)

කාරියවසම්, සුනේත්‍රා
ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනයේදී මුහුණපාන ගැටළු හා දුෂ්කරතා, 2003. (2003.06.26 වෙනි දින පැවැති ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ NETELIS ජාතික සම්මන්ත්‍රණයට ඉදිරිපත් කරන ලද පත්‍රිකාවකි.)

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය
දසවස් සමරුව : 1990-2000/සම්පා. උපාලි අමරසිරි.- කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය, 2000.

ප්‍රනාන්දු, ජානකී
ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනයෙහිලා ශ්‍රී ලංකාවේ පුස්තකාලවල කාර්යභාරය.-
<u>පුස්තකාල ප්‍රවෘත්ති</u> : වෙ. 15, ක. 3, ජුලි-සැප්තැම්බර්, 1994.- පි. 19-24.

මුතුගල, වීරසිංහ
ජාතික ඒකාබද්ධ සූචිය මනාව පවත්වාගෙන යාම, 1994.
(1994 මාර්තු මස 09 දින ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන ලද පත්‍රිකාවකි.)

යාපා, එන්. යූ.
පුස්තකාලය හා පරිගණකය.- කොළඹ :
ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය, 1991.

Perera, Harrison
A Story of a Union Catalogue : A Canadian Experience in The National Library of Sri Lanka Commemorative Volume/ed. By M. S. U. Amarasiri.- Colombo : Sri Lanka National Library Services Board, 1990. P. 186 – 198.

Yapa, N. U.
Role of the National Library of Sri Lanka in Utilization of Information Technology for the Development of Library and Information Systems in the National Library of Sri Lanka Commemorative Volume/ed. By M. S. U. Amarasiri.- Colombo : Sri Lanka National Library Services Board, 1990. P. 145 – 154.

# ජාතික ඒකාබද්ධ සූචිය සහ අන්තර් පුස්තකාල සහයෝගිතාව

නාලිනි මල්ලව ආරච්චි
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

## හැඳින්වීම

නූතන ලෝකයේ දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වනුයේ පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ සංවර්ධනයක් ඇතිවීම සහ දැනුම පදනම් වූ සමාජයක් බිහිවීම වේ. පොත්පත් හා වෙනත් ස්වරූපයේ තොරතුරු සම්පත් ලොව පුරා අධික වේගයකින් පළවීමත් පරිගණක ආශ්‍රිත තෙරතුරු මාධ්‍යයන්හි සීඝ්‍ර වර්ධනයත් නිසා තොරතුරු ගවේෂණ කාර්යයන්හි සංකීර්ණ බවක් දක්නට ලැබේ. ලොව බිහිවන සියලුම වර්ගයේ තොරතුරු මූලාශ්‍ර පුස්තකාල සම්පත් වශයෙන් පුස්තකාල එකතුන්වල එක්රැස් කරනු ලැබේ. එමගින් පාඨක ජනයාට තම අවශ්‍යතාවලට ගැලපෙන තොරතුරු මූලාශ්‍ර පරිහරණය කිරීමට පහසුකම් සැපයීම පුස්තකාලවලට පැවරෙන වගකීමකි. බහුවිධ විෂයයන් යටතේ පළවන තොරතුරු බිහිවන වේගය සමග සසඳන කළ එම තොරතුරු යල්පැනයාමේ වේගය ද මොහොතින් මොහොත වැඩිවේ. එබැවින් කුමන විෂය ක්ෂේත්‍රයක් යටතේ වුවද පළ වී ඇති පොතපත හා වෙනත් තොරතුරු මූලාශ්‍ර සොයා එන පාඨකයාට හැකි ඉක්මණින් ඒවා ලබාදීම අත්‍යවශ්‍ය කාරණයකි. පුස්තකාලවල එක්රැස් කොට ඇති බුද්ධිමය සම්පත්වලින් පාඨකයාට මැනවින් ප්‍රයෝජන ගත හැක්කේ තමාට අවශ්‍ය දේ ප්‍රමාදයකින් තොරව නියමිත අවස්ථාවේදී පරිහරණයට ලබාගත හැකි වුවහොත් පමණි. එම කාර්යය මැනවින් ඉටුකර ගැනීමට පාඨක එළඹුම් ශීර්ෂ අනුව විධිමත් අයුරින් පුස්තකාල සූචි සම්පාදනය විය යුතුය.

## පුස්තකාල සූචි

පුස්තකාල සූචියක් යනු කිසියම් පුස්තකාලයක ඇති සම්පත් මොනවාදැයි පහසුවෙන් තෝරා බේරා ගැනීම සඳහා සකස් කරනු ලබන ග්‍රන්ථ විද්‍යාත්මක ලැයිස්තුවකි. එම සූචිය අදාළ පුස්තකාලයේ තැන්පත් වී ඇති පුස්තකාල ද්‍රව්‍යවලට පමණක් සීමාවන අතර කිසියම් පාඨකයකුට ඒ තුළින් තමන්ට අවශ්‍යවන පොත්පත් හෝ අනෙකුත් පුස්තකාල ද්‍රව්‍ය සොයා ගත හැකිය. එපමණක් නොව, පුස්තකාල සූචි මගින් අත්

කරගත හැකි තවත් ප්‍රයෝජන රාශියක් ඇත. විෂය එළඹීමේදී තමාට අවශ්‍ය නියත ග්‍රන්ථය නොමැති වුව ද, එම විෂයය අලළා ලියවුණු වෙනත් ග්‍රන්ථයක් කරා එළඹීමේ අවස්ථාව පාඨකයාට ලැබේ. එමෙන්ම තමාට අවශ්‍ය විෂයයට අයත්, පුස්තකාලයේ ඇති ග්‍රන්ථ තොගය පිළිබඳව දළ අවබෝධයක් ලබා ගැනීමට උපකාරී වේ. එය පුස්තකාල පොත් තොගයේ සම්පූර්ණ ලේඛනයක් වන හෙයින් බැහැර ගෙන ගොස් ඇති පොත් පිළිබඳ තොරතුරු ද ලබාගත හැක. පුස්තකාල කාර්යමණ්ඩලයට වෘත්තියමය කටයුතු ඉටුකිරීමට පුස්තකාල සූචිය බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මුද්‍රිත කාඩ්පත් වල සටහන් කරන ලද ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සහිත කාඩ්පත් සූචි අද පරිගණකගත සූචි බවට පත් වී ඇති අතර, මාර්ගගත සූචි ලෙසද පවත්වාගෙන යනු ලැබේ. අසීමිත තොරතුරු විදාරණය සහ සංකීර්ණ බව පාලනය කරමින් පහසුවෙන් හා ඉක්මනින් තොරතුරු ගවේෂණය සඳහා මාර්ග ගත සූචි සැකසීම නව ප්‍රවනතාවක් වී ඇත.

## ඒකාබද්ධ සූචි සම්පාදනය

සාමාන්‍ය පුස්තකාල සූචියකට වඩා ඒකාබද්ධ සූචියක් තුළින් පෘථුල අන්දමින් පුස්තකාල සම්පත් හා තොරතුරු ගවේෂණ මාර්ග සැලසිය හැකිය. කිසියම් විෂයයකට සම්බන්ධව හෝ භූගෝලීය ප්‍රදේශයකට සීමාවී හෝ කිසියම් පුස්තකාල වර්ගයක් නියෝජනය කරමින් පුස්තකාල කීපයක් එකතුවී සාමූහික වශයෙන් සකස් කරනු ලබන ග්‍රන්ථ විස්තර සහිත ලේඛනයක් ඒකාබද්ධ සූචියක් ලෙස හැඳින්විය හැකිය. මෙහි ඇති විශේෂ ලක්ෂණයක් වනුයේ එම පුස්තකාල අතරින් ප්‍රධාන මට්ටමේ පුස්තකාලයක් මධ්‍යගත සූචි සම්පාදන මධ්‍යස්ථානය ලෙස මෙහෙයුම් කටයුතු දියත් කිරීමත් අනෙකුත් පුස්තකාලවලින් ඒ සඳහා තොරතුරු ලබාදීමෙන් දායකවීමත් වේ. බොහෝ දුරටම ජාතික මට්ටමින් ඒකාබද්ධ සූචි සැකසීම සෑම රටකම ජාතික පුස්තකාලයක් වෙත පැවරෙන ප්‍රධාන වගකීමකි. කිසියම් රටක තිබෙන සියලුම වර්ගයේ පුස්තකාලවල තැන්පත් කොට ඇති විවිධ පුස්තකාල ද්‍රව්‍ය හා තොරතුරු සම්පත් පිළිබඳව ජාතික පුස්තකාලය මගින් ඒකාබද්ධ සූචියක් සම්පාදනය කිරීම වැදගත් වේ. ප්‍රාදේශීය මට්ටමෙන් පුස්තකාලවල විසිරි ඇති සම්පත් ගැන විධිමත් විස්තර දැනගැනීමට ජාතික වශයෙන් ක්‍රියාත්මක වන එවැනි මධ්‍යස්ථානයකින් එවැනි සූචි සැකසීම ප්‍රමිතිය, ඒකීය බව හා ගුණාත්මක බව රැක ගැනීමට පිටුවහලක් වේ. ජාතික පුස්තකාලයක රටෙහි පළවන සෑම ප්‍රකාශනයක්ම තැන්පත් කරන බැවින් පාඨක පිරිස ද අනෙකුත් පුස්තකාලවලට වඩා ප්‍රමාණාත්මකව

වැඩි වේ. ජාතික මට්ටමේ ව්‍යාපෘතියක් වශයෙන් ඒකාබද්ධ සූචි සම්පාදනයෙන් අන්තර් පුස්තකාල සහයෝගීතාවය ඇතිකළ හැක. පුස්තකාල කීපයක් ඒකරාශී වී තොරතුරු හුවමාරු කරගැනීමත් සූචිය ගොඩනැගීමත් ඊට නිදසුන් වේ.

ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය මඟින් ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය සඳහා තොරතුරු රැස් කිරීමේ මූලික කටයුතු අරඹන ලද්දේ 1986 වර්ෂයේදීය. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාල, පර්යේෂණායතන, මහජන සහ විශේෂ පුස්තකාල 50කට වැඩි ප්‍රමාණයක් ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනයෙහි ලා දායකත්වය ලබාදේ. 1994 දී ජාතික ඒකාබද්ධ සූචිය පරිගණකගත කිරීම ආරම්භ වූ අතර 2001 වසරේ සිට එය මාර්ගගත සූචියට සම්බන්ධ කරන ලදී. ජාතික පුස්තකාල වෙබ් අඩවිය (www.natlib.lk) ඔස්සේ එම තොරතුරු පරිශීලනය කළ හැකිය.

## ඒකාබද්ධ සූචිය හා පුස්තකාල සහයෝගීතාවය

පුස්තකාල සහයෝගිතා වැඩසටහන් දියත් කිරීම සඳහා ජාතික ඒකාබද්ධ සූචියක දායකත්වය අතිශයින් වැදගත් වේ. එමඟින් පුස්තකාල කටයුතු වල ප්‍රගතිය සහ සේවාවන්හි කාර්යක්ෂමතාව වර්ධනය කර ගත හැක. අන්තර් පුස්තකාල සහයෝගිතා කාර්යයන්හිදී පුස්තකාල කිහිපයක් එකතුවී කටයුතු කිරීම අනිවාර්යයෙන්ම සිදුවිය යුත්තකි. මෙහිදී ඒකාබද්ධ සූචියක් සකස් කර ගැනීමෙන් එම පුස්තකාල අතර, සහයෝගිතා වැඩසටහන් දියත් කිරීම පහසුවේ. එය තුළින් පුස්තකාල එකතුන් පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක කාර්යයන්හි ඒකීයභාවය රැකගත හැකි අතර පුස්තකාල කටයුතුවල කිසියම් ප්‍රමිතියක් ගොඩනගා ගැනීමටද හැකියාව ලැබේ. ඉන් ලැබෙන අනෙකුත් ප්‍රයෝජන පහත සඳහන් පරිදි විස්තර කළ හැකිය.

- කිසියම් පුද්ගලයෙකුට ජාතික ඒකාබද්ධ සූචිය පරිශීලනය කිරීමෙන් ඒ ඒ පුස්තකාලවල සම්පත් මොනවාදැයි නිශ්චිත වශයෙන් හඳුනා ගැනීමට හැකියාවක් ලැබේ. එමෙන්ම පුස්තකාලයාධිපතිවරුන්ට පොත් මිලදී ගැනීමේදීත්, සූචි සම්පාදනයේදීත්, වෙනත් වෘත්තීයමය කටයුතුවලදීත් එය භාවිත කොට නොයෙකුත් ප්‍රයෝජන ලබා ගත හැක. ඒ අයුරින් පුස්තකාල සහයෝගීතාව ගොඩනැගීම සඳහා ඒකාබද්ධ සූචිය වටිනා ග්‍රන්ථ විඥාපන මූලාශ්‍රයක් වේ.

- එමෙන්ම ජාතික ඒකාබද්ධ සූචියට දායක වී ඇති පුස්තකාල අතර අන්‍යෝන්‍ය වශයෙන් අන්තර් පුස්තකාල පිරුළු ක්‍රමය යටතේ සම්පත් හුවමාරු කර ගැනීමේ පහසුකම් ලැබේ. අනෙකුත් පුස්තකාල සඳහා ද එම පහසුකම ලබාගත හැක. එම පුස්තකාල අතර සුහද සබඳතා වර්ධනය කිරීමටත් ගැටළු අවම කරගැනීමටත් මෙය තුලින් ඉඩ ප්‍රස්ථා ඇතිවේ.

- තවද, මිල අධික පොත්, දුර්ලභ ග්‍රන්ථ, විශේෂිත විෂයයන් යටතේ ඇති විමර්ශන මූලාශ්‍ර, සීමිත වාර්තා සහ වෙනත් ලිපි ලේඛන තැන්පත් වී ඇති පුස්තකාල වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමට ද මෙය ප්‍රයෝජනවත් වේ.

- අප රටේ පුස්තකාලවල ආර්ථික හා මූල්‍ය පහසුකම් අඩුය. එහෙත් පොත පත සඳහා පාඨක ඉල්ලීම් අසීමිතය. පොත් මිලදී ගැනීමේදී සාමූහික ප්‍රතිග්‍රහණය ක්‍රියාත්මක කිරීම බොහෝදුරට අඩු බවක් දක්නට ඇත. එසේ හෙයින් පුස්තකාල මගින් පොත් මිලදී ගැනීමේදීත් එකතු ගොඩනැගීමේදීත්, අනවශ්‍ය ලෙස පුස්තකාල සම්පත් ද්විත්වකරණය වීම වළක්වා ගත යුතුය. එම කාර්යයට තොරතුරු ලබාගැනීමට ජාතික ඒකාබද්ධ සූචිය පරිශීලනය කළ හැකිය. සීමිත මුදල් සම්පත් ඇති කුඩා පුස්තකාලවලට අනවශ්‍ය ලෙස එකම ආකාරයේ පොතපත නැවත නැවත මිල දී ගැනිම වළක්වා ගැනීමට මෙය උපකාරී වේ. අන්තර් පුස්තකාල සහයෝගිතාවය එවැනි අංශ යටතේද ක්‍රියාත්මක කළ හැක.

- ජාතික ඒකාබද්ධ සූචියට දායක වී ඇති පුස්තකාලවල සේවයේ නියුතු විවිධ මට්ටමේ කාර්යමණ්ඩල සඳහා අධ්‍යාපනික හා පුහුණුවීම් සැසි, වැඩමුළු ආදිය සංවිධානය කිරීමටත් ඒවා සහයෝගිතා වැඩසටහන් ලෙස ඒ ඒ පුස්තකාලවලට අනුයුක්තව ඉටුකිරීමටත් හැකියාවක් ලැබේ. උදාහරණ වශයෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ ජාතික ඒකාබද්ධ සූචියට දායක වී ඇති පුස්තකාල සහ ජාතික විද්‍යා පදනම මගින් පවත්වාගෙන යනු ලබන ඒකාබද්ධ සූචි ව්‍යාපෘතීන්වලට දායක වී ඇති ආයතන සඳහා අධ්‍යාපනික සහයෝගිතා වැඩසටහන් හා පුහුණු වැඩමුළු දියත් කරනු ලැබේ.

- පුස්තකාලයක ග්‍රන්ථ සම්භාරය නිරන්තරයෙන් ම වෙනස් වෙයි. දිනෙන් දිනම අලුත් පොත් පත් පුස්තකාල එකතුවලට එක්කරනු ලබන අතර යල්

පැනගිය පුස්තකාල ද්‍රව්‍ය ඉවත් කරනු ලැබේ. එසේ හෙයින් පාඨකයන්හට පුස්තකාලයන්හි එකතූන්වලට අලුතින්ම ප්‍රවේශ වී හෝ ඉවත් වී ඇති පොත් පිළිබඳ තොරතුරු දැන ගැනිමට ද අවකාශ ලැබේ. ඒකාබද්ධ සූචි සම්පාදනයෙන් නව ප්‍රකාශන පිළිබඳ පාඨකයා දැනුවත් වන අතර, යාවත්කාලින තොරතුරු ලබාගැනීමටද අවස්ථාවක් ලැබේ. මෙය අන්තර් පුස්තකාල සහයෝගිතාවය වැඩි දියුණු කිරීම සඳහා පිටුවහලක් වේ. ඒ හැර පුස්තකාලවල ඇති අතිරික්ත පොතපත පිළිබඳ සංඛ්‍යාලේඛන ලබාගත හැකිවීම ද වාසිදායක කරුණකි.

- ශ්‍රී ලංකා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය කේන්ද්‍ර කරගත් ජාතික ඒකාබද්ධ සූචිය මාර්ගගත (online) සූචියක් වන බැවින් අන්තර්ජාලය භාවිත කරන විද්වතුන්ට ශ්‍රී ලංකික පුස්තකාලවල තිබෙන සම්පත් පිළිබඳ දැනුවත්වීමට හැකියාව ලැබේ. එමගින් දේශීය පුස්තකාල ගැනත් ඒවාගේ එකතූන් පිළිබඳවත් ලොව වෙසෙන ඕනෑම කෙනෙකුට අවබෝධයක් ලබා ගත හැකි අතර අන්තර්ජාතික වශයෙන් ප්‍රචාරයක් ද ඇතිවේ. එමෙන්ම භූගෝලීය සීමාවන්ගෙන් ඔබ්බට අන්තර් පුස්තකාල සහයෝගිතා වැඩ සටහන් පැතිරවීමටත් විවිධ රටවල ජාතික පුස්තකාල හා පර්යේෂණ පුස්තකාල සමග සම්බන්ධ වී ග්‍රන්ථ විඥාපන සේවා හුවමාරු කර ගැනීමටත් ජාතික ඒකාබද්ධ සූචිය තුළින් අගනා මෙහෙවරක් ඉටු වේ.

# ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනයේදී මගේ අත්දැකීම්

සුනේත්‍රා කාර්යවසම්
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

## හැඳින්වීම

කිසියම් රටක පවත්නා පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන සතුව ඇති පුස්තකාල ද්‍රව්‍යයන් එක්රැස් කර සංවිධානය කරනු ලැබූ ග්‍රන්ථ විද්‍යාත්මක මූලාශ්‍රයක් ලෙසත්, එක් පුස්තකාලයකට වඩා වැඩි සංඛ්‍යාවක තිබෙන තොරතුරු පිළිබඳව හෙළිදරව් කරන ප්‍රධාන මූලාශ්‍රයක් ලෙසටත් ජාතික ඒකාබද්ධ සූචිය (National Union Catalogue) හැඳින්විය හැකිය.

## ආරම්භය සහ ව්‍යාප්තිය

ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය හා පවත්වාගෙන යාම සෑම රටකම ජාතික පුස්තකාලයක් වෙත පැවරෙන ප්‍රධාන වගකීම්වලින් එකක් වන අතර, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් 1986 වර්ෂයේ දී ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය කිරීමට අදාළ තොරතුරු එක්රැස් කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. මෙහිදී සහභාගී කර ගන්නා පුස්තකාල වර්ග තීරණය කිරීම, සූචි සංලේඛ කර්තෘ, ග්‍රන්ථනාම සහ විෂයය අනුව පිළියෙල කිරීම, තොරතුරු එක්රැස් කිරීමේදී සියලුම විෂයයන් ආවරණය කිරීම, පුස්තකාලවල ඇති ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික මූලාශ්‍ර තොරතුරු ඇතුළත් කිරීම මෙන්ම, තොරතුරු ලබා ගැනීමේ දී කාලීන හා පූර්ව කාලීන ලෙස දෙයාකාරයකින් ලබා ගැනීමටත් තීරණය කරන ලදී. මෙහිදී විශ්වවිද්‍යාල පුස්තකාල, ප්‍රධාන මහජන පුස්තකාල, විශේෂ පුස්තකාල හා කාර්මික විද්‍යාල පුස්තකාලවල තොරතුරු ලබා ගැනීමට තීරණය කරන ලද අතර, විශ්වවිද්‍යාල පුස්තකාල 03 ක්, මහජන පුස්තකාල 02 සහ විශේෂ පුස්තකාල 01 කින් ආරම්භයේ දී කාලීන තොරතුරු ලබා දීමට දායක විය. එහෙත්, මෙසේ දායක පුස්තකාලවලින් අඛණ්ඩව තොරතුරු නොලැබීම නිසා දෙවන අදියර ලෙස පුස්තකාල 22 ක් තෝරා නැවත ප්‍රතිසංවිධානය කිරීමට කටයුතු කරන ලදී. ඒ සඳහා විශ්වවිද්‍යාල පුස්තකාල 09, මහජන පුස්තකාල 02, විශේෂ පුස්තකාල 10, කාර්මික විද්‍යාල පුස්තකාල 01 ක් තෝරා ගනු ලැබූ අතර, එම පුස්තකාල 22 න් ක්‍රියාකාරී ලෙස තොරතුරු එවා දායකවූයේ පුස්තකාල 08 ක් පමණකි.

රටක ජාතික පුස්තකාලයකින් ඉටු කළ යුතු මහඟු ව්‍යාපෘතියක් වන ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය හා පවත්වා ගෙන යාමේ ඇති වැදගත්කම නිසාම තෙවන අදියර ලෙසට 1990-1991 වර්ෂ තුළ දී පූර්ව කාලීන තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ආයතන 06 කින් පූර්ව කාලීන තොරතුරු ලබා ගැනීමේ හැකියාව ලැබුණි. ඒවානම්,
ජාතික කෞතුකාගාර පුස්තකාලයේ ශ්‍රී ලංකා සහරා ලිපි සූචිය.
පේරාදෙනිය විශ්වවිද්‍යාල පුස්තකාලයේ ලෙස්ලි ද සේරම් විශේෂ එකතුව.

කොළඹ මහජන පුස්තකාලයේ ශ්‍රී ලංකා එකතුව.
රාජකීය ආසියාතික සමිතිය (ලංකා ශාඛාව) පුස්තකාල එකතුව (වර්ෂ 1989 දක්වා)
පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාලයේ එකතුව (වර්ෂ 1991 අගෝස්තු දක්වා)
ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ශිෂ්‍යයින් විසින් සම්පාදිත ග්‍රන්ථනාමාවලි සහ අනුක්‍රමණිකා එකතුව

මෙම පුස්තකාලයන් හි එකතුන් පිළිබඳ තොරතුරු මුද්‍රිත පිටපත්, සූචි පත්‍රිකා, සූචි පත්‍රිකාවල ඡායා පිටපත්, පරිගණක මුද්‍රිත පිටපත් හා යතුරුලියන පිටපත් ලෙස විවිධ ස්වරූපයන්ගෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයට ලබා ගැනීමට හැකියාව ලැබිය.

මීට අමතරව, ජාතික ඒකාබද්ධ සූචියට දායක වූ පුස්තකාල අඛණ්ඩව තොරතුරු එවනු නොලැබීම නිසා සිව්වන අදියර ලෙස 1992 දී දායක පුස්තකාල 22 පුස්තකාල 50 ක් දක්වා ව්‍යාප්ත කිරීමට කටයුතු කරන ලදී. එහෙත් ක්‍රියාකාරී ලෙස කාලීන තොරතුරු ලබාදීමෙන් දායකවූයේ පුස්තකාල 07 ක් පමණි.

ජාතික ඒකාබද්ධ සූචියට සාමාජික පුස්තකාලවලින් ලැබෙන දායකත්වය බෙහෙවින් දුර්වල මට්ටමක පැවතීමත් එහෙත්, සූචිය සම්පාදනය කිරීම හා අඛණ්ඩව පවත්වාගෙන යාම රටෙහිම වගකීමක් නිසාත්, දායකත්වය සැපයීමේ මන්දගාමී බවට හේතු අධ්‍යයනය කිරීම වැදගත් බව ප්‍රත්‍යක්ෂ විය. එමනිසා 1993 දී ජාතික ඒකාබද්ධ සූචියට සම්බන්ධවීමේ ඇති වැදගත්කම පිළිබඳව ශ්‍රී ලංකාවේ පුස්තකාලයාධිපතීන් දැනුවත් කිරීමේ ලිපියක් සමඟ ප්‍රශ්නාවලියක් සකස් කර 1992 වසරේදී තෝරාගනු ලැබූ පුස්තකාල 50 සඳහා යොමු කිරීමට කටයුතු කරන ලදී. මෙම ප්‍රශ්නාවලියට ජාතික ඒකාබද්ධ සූචියට තොරතුරු එවීමට ඇති එකඟතාව, තොරතුරු එවීමට බලාපොරොත්තු වන ක්‍රමය (සූචි පත්‍රිකා/ප්‍රතිග්‍රහන ලැයිස්තු/පරිගණක මුද්‍රිත පිටපත්/පරිගණක තැටිලි/සංගෘහිත තැටි/විද්‍යුත් තැපැල්) ජාතික ඒකාබද්ධ සූචිය සඳහා දායකවීමට දැනට ඇති ගැටළු මෙන්ම ඒකාබද්ධ සූචිය පිළිබඳව අදහස් හා යෝජනා ද ඇතුළත් කෙරුණි. ඒ අනුව, තෝරාගනු ලැබූ පුස්තකාල 50 න් පුස්තකාල 26 කින් අවශ්‍යව තිබූ තොරතුරු ලබා ගැනීමට හැකි විය.

ජාතික ඒකාබද්ධ සූචිය සඳහා දායක කර ගත් ඉහත පුස්තකාල 50 න් ලබාගත් තොරතුරු පදනම් කරගෙන පුස්තකාලයාධිපතීන් දැනුවත් කිරීම සුදුසු යැයි තීරණය කළ අතර, ඒ සඳහා 1994 වසරේදී දින භාගයක සම්මන්ත්‍රණයක් පැවැත්වීමට කටයුතු කරන ලදී. මෙය ඉතා සාර්ථක සම්මන්ත්‍රණයක් වූ අතර, රටේ සියළුම පුස්තකාලවල සහයෝගය මත ඒකාබද්ධ සූචිය සම්පාදනය කිරීමේ ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමේ ඇති අවශ්‍යතාව එත්තු ගැන්වීමට හැකියාවක් ලැබිය.

මේ අනුව, 1995 වසරේදී දායක පුස්තකාල සංඛ්‍යාව 31ක් වූ අතර, 1996 වසර මුල වන විට දී ක්‍රියාකාරී දායක පුස්තකාල සංඛ්‍යාව 46 දක්වා වැඩි කර ගැනීමේ හැකියාව ලැබුණි.

## දායක පුස්තකාල සංඛ්‍යාවේ වර්ධනය (1986 සිට 1996 දක්වා)

| වර්ෂය | දායක පුස්තකාල සංඛ්‍යාව |
|---|---|
| 1986 | 06 |
| 1988 | 08 |
| 1990 | 06 |
| 1992 | 07 |
| 1995 | 31 |

**පරිගණකගත කිරීම**

1996 දී ජාතික ඒකාබද්ධ සූචිය පරිගණකගත කිරීමට කටයුතු කරන ලද අතර, මේ සඳහා සීඩීඑස්/අයිසිස් (CDS/ISIS) මෘදුකාංගය යොදා ගන්නා ලදී. මෙම දත්ත පදනම සකස් කිරීම සඳහා එවකට අන්තර් ජාතික වාරි කළමනාකාරිත්ව ආයතනයේ (International Irrigation Management Institute - IIMI) ප්‍රධාන පුස්තකාලයාධිපතිව සිටි එන්.යූ. යාපා මහතාගේ උපදේශකත්වය ලබා ගැනීමට කටයුතු කරන ලදී. ඒකාබද්ධ සූචියට (Union Catalogue) යන නාමය පදනම් කර ගෙන දත්ත පදනම UCAT නමින් හඳුන්වනු ලබන අතර, මෙම දත්ත පදනම සඳහා පොත්, සම්මන්ත්‍රණ වාර්තා, සඟරා ආදී පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ සම්පූර්ණ තොරතුරු ග්‍රන්ථ මිළදී ගන්නා අවස්ථාවේ සිට තොරතුරු දත්ත පදනමට ඇතුළත් කරන දිනය දක්වා අදාළ තොරතුරු ඇතුළත් කළ හැකි සේ පරිපූර්ණ ක්ෂේත්‍ර වගුවක් (Field Definition Table-FDT) සකස් කරන ලදී. එහෙත් ප්‍රථම අදියර ලෙස ග්‍රන්ථ පිළිබඳ තොරතුරු පමණක් ඒකාබද්ධ සූචියට ඇතුළත් කිරීමට තීරණය කළ හෙයින් ආකෘති පත්‍ර (Work Sheets) සකස් කරන ලද්දේ ඊට අදාළව පමණි. අද වනතුරුත් ඒකාබද්ධ සූචිය සඳහා තොරතුරු ලබා ගනු ලබන්නේ ග්‍රන්ථ පිළිබඳව පමණි.

ආයතන 25 කින් ආරම්භ වූ පරිගණකගත ඒකාබද්ධ සූචිය මේ වන විට මුළු දායක පුස්තකාල සංඛ්‍යාවෙන් පුස්තකාල 54 ක් පරිගණක තැටිලි (Diskettes), සංගෘහිත තැටිලි (CD Rom), විද්‍යුත් තැපැල් (e-mail) ස්වරූපයෙන් තොරතුරු ලබාදීම සිදු කරනු ලබයි. මේ වන විට දත්ත පදනමට ඇතුළත් කර ඇති සංලේඛ සංඛ්‍යාව හාරසිය පනස් දහසකට (450,000) ආසන්නව ඇත. 1998 වන විට CDS/ISIS මෘදුකාංගයට අමතරව WINISIS මෘදුකාංගය ද ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය සඳහා යොදා ගනු ලැබිය. දත්ත පදනමට විවිධ පුස්තකාලවලින් ලද තොරතුරු ඇතුළත් කර තොරතුරු තිබෙන නියමිත ස්ථානය (Location) දැක්වීම සඳහා හැකුලුම් පදයක් භාවිත කරනු ලබයි. ඒකාබද්ධ සූචිය සම්පාදනය ආරම්භයේදී ඒ ඒ සාමාජික පුස්තකාල සඳහා අංකයක් ලබා දුන් අතර, ඒකාබද්ධ සූචිය සඳහා දත්ත පදනමක් සකස් කිරීමත්

සමඟම නියමිත පුස්තකාල සඳහා හැකුළුම් පදයක් යොදා ගැනීමට කටයුතු කරන ලදී. උදාහරණ ලෙසට

NSF - National Science Foundation
PLC - Public Library Colombo - ලෙසත් (ඇමුණුම 01)

තොරතුරු ලබා දෙන සැම පුස්තකාලයක් සඳහාම පරිගණක පහසුකම් නොතිබීමත්, සාමාජික අනෙකුත් පුස්තකාලවල ඇති සම්පත් පිළිබඳව දැනුවත් වීමක් නොමැති වීමත් නිසා ඒකාබද්ධ සූචියට ඇතුළත් කර ඇති දත්තවල මුද්‍රිත පිටපතක් ලබාදෙන ලෙස දායක පුස්තකාලවලින් ඉල්ලීම් කරන ලදී.

සාමාජික පුස්තකාලවල ඉල්ලීම පරිදි UCAT දත්ත පදනමට ඇතුළත් කරන ලද දත්ත දස දහස (10,000) බැගින් ගෙන මුද්‍රිත පිටපත් සකස් කිරීමට කටයුතු කරන ලදී. මෙය ඉතා දුෂ්කර කාර්යයක් විය. කර්තෘ නාමය, ග්‍රන්ථනාමය, ප්‍රකාශිත වර්ෂය ඇතුළත් කර අකාරාදී ලේඛනයක් ලෙස මෙම ප්‍රකාශනය සකස් කරන ලදී. එහිදී දත්ත පදනමේ සංලේඛ 01-10,000 දක්වා තාවකාලික දත්ත පදනමකට වෙන් කර ගැනීමටත්, තොරතුරු ලබා ගැනීම සඳහා වෙනමම මුද්‍රණ ආකෘතියක් (Print Format) සකස් කිරීමටත් කටයුතු කරන ලදී. දත්ත පදනමෙහි තොරතුරුවල ඇති දුර්වලතා, නියමිත ආකාරයට තොරතුරු ඇතුළත් නොකිරීම හා උපකාරක පද සැලකිල්ලට නොගැනීම, සිංහල ග්‍රන්ථ පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීමේ විවිධ ක්‍රම ආදී දුර්වලතා නිවැරදි කිරීමත්, එමගින් ආකාරාදිව තොරතුරු ලැයිස්තුවක් ප්‍රකාශයට පත් කිරීමත් සිදු කෙරිණි. තාක්ෂණ උපකරණවල හිඟකමත්, සේවක හිඟකමත් අංශයේ අනෙකුත් රාජකාරී කටයුතු ඉටු කරන අතරතුරම ජාතික ඒකාබද්ධ සූචිය සංස්කරණය කිරීමට සිදුවීම නිසාත්, පොතක් ලෙස ප්‍රකාශයට පත් කිරීම වියදම් අධික කාර්යයක් වීම නිසාත්, මෙලෙස ප්‍රකාශයට පත් කළ ප්‍රකාශන සංඛ්‍යාව 05කට සීමා කිරීමට සිදු විය. මෙසේ ප්‍රකාශයට පත් කළ ප්‍රකාශන සාමාජික පුස්තකාල සඳහා නොමිලේ බෙදා හැරීමට කටයුතු කරන ලදී.

2001 වසරේ සිට WINISIS මෘදුකාංගයට අමතරව Alice for windows මෘදුකාංගය ද ඒකාබද්ධ සූචිය සම්පාදනය සඳහා භාවිත කරන ලද අතර, WINISIS මෘදුකාංගය මගින් මාර්ගගත සූචියට (OPAC) සම්බන්ධ කිරීම ද මෙම වසරේදී සිදු කරන ලදී.

**ජාතික ඒකාබද්ධ සූචිය වර්ධනය 1996-2007**

| වර්ෂය | දායක පුස්තකාල සංඛ්‍යාව | | පරිගණක ගත දත්ත සංඛ්‍යාව |
|---|---|---|---|
| | පරිගණකගත | ශ්‍රමික | |
| 1996 | 25 | 23 | 38,610 |
| 1997 | 25 | 23 | 38,610 |
| 1998 | 26 | 27 | 49,210 |
| 1999 | 28 | 28 | 67,530 |
| 2000 | 35 | 31 | 127,208 |

| | | | |
|---|---|---|---|
| 2001 | 42 | 26 | 238,297 |
| 2002 | 45 | 26 | 264,200 |
| 2003 | 48 | 27 | 301,006 |
| 2004 | 52 | 23 | 355,355 |
| 2005 | 54 | 23 | 372,654 |
| 2006 | 54 | 23 | 431,061 |
| 2007සැප්. | 54 | 23 | 448,258 |

මෙම සංඛ්‍යා ලේඛනවලට අනුව, තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමඟම පුස්තකාල ද පරිගණකගත කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇති බව පෙනී යයි. මෙය ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනයේදී ඵලදායි පියවරක් බව පෙන්වා දිය යුතුයි.

2003 වසර වන විට ජාතික ඒකාබද්ධ සූචියේ තවත්, ජයග්‍රහණයක් ලබා ගැනීමට හැකියාව ලැබිණ. එනම් ජාතික පුස්තකාල වෙබ් පිටුවට ජාතික ඒකාබද්ධ සූචිය ඇතුළත් කිරීමත් එමඟින් ලෝකයේ සිටින ඕනෑම පාඨකයෙකුට අන්තර්ජාලය ඔස්සේ (http://www.natlib.lk) තොරතුරු ගවේශනය කිරීමට හැකියාව ලැබීමයි. මෙය 2003 වසරේදී GENISIS මෘදුකාංගය භාවිත කරමින් ද, 2005දී Alice for Windows මෘදුකාංගය භාවිතයෙන් ද සකස් කරන ලදී. වර්තමානයේදී මෘදුකාංග දෙකම භාවිතයෙන් තොරතුරු ගවේශනය කිරීමේ හැකියාව සලසා ඇත.

ඒ අනුව, දැනට ජාතික ඒකාබද්ධ සූචියට විශ්වවිද්‍යාල, පශ්චාත් උපාධි ආයතන, මහජන, රජයේ දෙපාර්තමේන්තු, රජයේ නොවන ආයතන, විශේෂ සහ කාර්මික විද්‍යාල පුස්තකාල දායකවන පුස්තකාල වර්ග වේ.

**දායක පුස්තකාල වර්ග (1986-2007 සැප්.)**

| | | |
|---|---|---|
| රජයේ දෙපාර්තමේන්තු පුස්තකාල | - | 28 |
| විශ්වවිද්‍යාල/පශ්චාත් උපාධි ආයතන පුස්තකාල | - | 18 |
| විශේෂ පුස්තකාල | - | 12 |
| රජයේ නොවන ආයතනික පුස්තකාල | - | 08 |
| මහජන පුස්තකාල | - | 09 |
| කාර්මික ආයතන පුස්තකාල | - | 02 |

## දායක පුස්තකාලවලින් තොරතුරු ලැබෙන ක්‍රම

ජාතික ඒකාබද්ධ සූචිය සඳහා දායක පුස්තකාලවලින් තම පුස්තකාලයේ ඇති පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු එවීමේදී විවිධ වූ ශිල්පීය ක්‍රම උපයෝගී කරගනු ලබයි. ඒ අනුව, ඒකාබද්ධ සූචියට තොරතුරු ලැබෙන ක්‍රම වනුයේ සූචි පත්‍රිකා, සූචි පත්‍රිකා ඡායා පිටපත්, ප්‍රතිග්‍රහණ ලැයිස්තු, ප්‍රතිග්‍රහණ ලේඛන ඡායා පිටපත්, පරිගණක මුද්‍රිත පිටපත්, සූක්ෂම සේයා පත්‍ර, පරිගණක තැටිලි (Diskettes), සංගෘහිත තැටි (CD Rom), විද්‍යුත් තැපැල් (e-mail) මගිනි.


සූචි පත්‍රිකා මගින් එවනු ලැබූ තොරතුරු 1996 වසර තෙක් ප්‍රධාන සූචි සංලේඛය ලෙස ලැබෙන කාඩ් පත්‍රිකාවට අමතරව විෂයය සහ ග්‍රන්ථනාමය සඳහා සංලේඛ දෙකක් සකස් කිරීමට කටයුතු කරන ලදී. ප්‍රතිග්‍රහණ ලැයිස්තු, පරිගණක මුද්‍රිත පිටපත්, ප්‍රතිග්‍රහණ ලේඛන ඡායා පිටපත් ලෙස ලැබෙන තොරතුරු සඳහා සංලේඛ තුනක් සකස් කිරීමට සිදුවිය. විෂය, ග්‍රන්ථනාම සංලේඛයට අමතරව ප්‍රධාන සංලේඛයක් යනුවෙන් ද සූක්ෂම සේයා පත්‍ර ලෙස ලැබෙන තොරතුරු ඒවා කියවීමේ යන්ත්‍රයක් අනුසාරයෙන් (Microfiche Reader Printer) මුද්‍රිත පිටපත් ලබා ගෙන එම තොරතුරුවලින් කාඩ් පත්‍ර තුනක් සකස් කළ යුතු විය.

සාමාජික පුස්තකාලවලින් ශ්‍රමිකව තොරතුරු ලැබීමත් සමඟම ඒවා කාඩ්පත්‍රිකා යතුරු ලියනය කිරීම කළ යුතු වන අතර, ප්‍රතිග්‍රහණ ලේඛන ඡායාපිටපත්, ප්‍රතිග්‍රහණ ලැයිස්තු මගින් බොහෝ පුස්තකාල තොරතුරු ලබාදීම නිසා යතුරුලියනය කිරීමේ කාර්යය සඳහා බාහිර නිලධාරීන් යොදා ගැනිණ. යතුරුලියන කිරීමේ හැකියාව මෙන්ම පුස්තකාල විද්‍යාව පිළිබඳ දැනුම ද මෙහි දී අත්‍යවශ්‍ය වූවත්, යතුරුලියනය කරන ලද සෑම කාඩ් පත්‍රිකාවක්ම පරීක්ෂා කිරීම මෙන්ම සංස්කරණය කිරීම ද කළ යුතු විය. යතුරුලියන කරන ලද කාඩ් පත්‍රිකා අදාළ සූචි කැබිනෙට්ටු ගත කිරීම ද පහසු කාර්යයක් නොවූවත්, පාඨකයාගේ ප්‍රයෝජනය සඳහා සූචිගත කිරීම දෛනිකව ඉටු කරන ලදී.

1996 ජාතික ඒකාබද්ධ සූචිය පරිගණක ගත කිරීමත් සමඟම තොරතුරු ඇතුළත් කිරීමේ පහසුව ළඟාවිය. ආරම්භයේදී CDS/ISIS මෘදුකාංග මේ සඳහා භාවිත කරන ලදී. එකතුව පරිගණකගත කර ඇති පුස්තකාල මුල් කාලයේදී පරිගණක තැටිලි භාවිතයෙන් තොරතුරු එවීම සිදු කළ ද මේ වන විට සංගෘහිත තැටි, විද්‍යුත් තැපැල් මගින් තොරතුරු එවීම දක්වා වර්ධනය වී ඇත. ශ්‍රමිකව තොරතුරු එවන ලද පුස්තකාල තම එකතුව පරිගණකගත කිරීමත් සමඟම ඒකාබද්ධ සූචියට දායක පරිගණකගත පුස්තකාල සංඛ්‍යාවේ වර්ධනයක් සිදුවිය.

### දායකත්වය (පරිගණකගත/ශ්‍රමික)

| Year | Compu. | Manual |
|---|---|---|
| 1996 | 25 | 23 |
| 1997 | 25 | 23 |
| 1998 | 26 | 27 |
| 1999 | 28 | 28 |
| 2000 | 35 | 31 |
| 2001 | 42 | 26 |
| 2002 | 45 | 26 |
| 2003 | 48 | 27 |
| 2004 | 52 | 23 |
| 2005 | 54 | 23 |
| 2006 | 54 | 23 |
| 2007Sep | 54 | 23 |




පරිගණක පුස්තකාලවලින් බොහොමයක් පුස්තකාල CDS/ISIS, WINISIS, Alice for windows මෘදුකාංග භාවිතයෙන් තොරතුරු එවනු ලැබීම නිසා ජාතික ඒකාබද්ධ සුචිය සම්පාදනයේදී මෙම මෘදුකාංග ත්‍රිත්වයම භාවිත කළ යුතු විය. CDS/ISIS සහ WINISIS භාවිතයේදී එවනු ලබන තොරතුරු තාවකාලික දත්ත පදනමකට ඇතුළත් කරනු ලබන අතර, එහිදී තොරතුරු නිවැරදිව ඇතුළත් කර ඇති බව පරීක්ෂා කිරීම. දත්ත තේරීම සහ තොරතුරු අයත් පුස්තකාලයේ හැකුලුම් පදය යෙදීමට කටයුතු කරනු ලැබිය. ඉන් අනතුරුව ප්‍රධාන දත්ත පදනමට තොරතුරු ඇතුළත් කිරීම සිදු කෙරේ. Alice for Windows මෘදුකාංගය භාවිතයෙන් එවනු ලබන තොරතුරු එම මෘදුකාංගය ඔස්සේම ප්‍රධාන දත්ත පදනමට ආනයනය කිරීමට කටයුතු කෙරේ.

ශ්‍රමිකව එවනු ලබන තොරතුරු 2000 වසරේ සිට ශ්‍රමිකව දත්ත පදනමට ඇතුළත් කිරීම සිදු කරන අතර, 2000 දක්වා ලැබී ඇති ග්‍රන්ථ විඥාපන තොරතුරු සුචි පත්‍රිකා ලෙස පර්යේෂකයින්ගේ පරිශීලනය සඳහා ජාතික පුස්තකාලයේ සුචි කැබිනෙට්ටුවල ගොනු කර තැබීමට කටයුතු කර ඇත.

### දත්ත පදනමට ක්‍රමිකව ඇතුළත් කරන ලද දත්ත සංඛ්‍යාව

| වර්ෂය | ඇතුළත් කරන ලද දත්ත සංඛ්‍යාව |
|---|---|
| 2000 | 450 (CDS/ISIS භාවිතයෙන්) |
| 2001 | 2040 (Alice for Windows භාවිතයෙන්) |
| 2002 | 3981 (Alice for Windows භාවිතයෙන්) |
| 2003 | 7681 (Alice for Windows භාවිතයෙන්) |
| 2004 | 10902 (Alice for Windows භාවිතයෙන්) |
| 2005 | 15141 (Alice for Windows භාවිතයෙන්) |
| 2006 | 17205 (Alice for Windows භාවිතයෙන්) |
| 2007 | 20827 (Alice for Windows භාවිතයෙන්) |

### ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනයේදී ලද අත්දැකීම්

ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනයේදී තොරතුරු එක්රැස් කිරීම, එක්රැස් වන තොරතුරු සංස්කරණය කිරීම, සූචිය සම්පාදනය කිරීම හා එම සූචිය හා තොරතුරු ආරක්ෂා කිරීම මෙන්ම පාඨක ප්‍රයෝජනයට මුද්‍රා හැරීම තෙක් සිදුවන සුවිශාල කටයුත්ත ඉටු කිරීමේදී මතු වූ විවිධ වූ දුෂ්කරතා හා ගැටළු ද ඒවා යම් තරමකින් හෝ විසඳාගෙන කටයුතු කළ ආකාරය මගේ අත්දැකීම් ලෙස ඉදිරිපත් කිරීමට මෙහිදී අදහස් කරමි. ඒ අනුව,

- බාහිර ආයතන හා සම්බන්ධව ඉටු කරනු ලබන ව්‍යාපෘතිවලදී මෙන්ම, ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනයේදී ද ප්‍රථමයෙන්ම මුහුණ දුන් ගැටළුව වූයේ දායක පුස්තකාලවලින් තොරතුරු ලබා ගැනීමේ ඇති අපහසුතාවයි.

ව්‍යාපෘතිය ආරම්භයේ විවිධ අවස්ථාවලදී දායක පුස්තකාල ප්‍රමාණය වැඩි කර ගැනීම සඳහා අදියර කිහිපයක් ලෙසට වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. දායක පුස්තකාල ප්‍රමාණය ක්‍රම ක්‍රමයෙන් වැඩි කර ගත්ත ද, එම පුස්තකාලවලින් තොරතුරු ලබා ගැනීම ඉතා අපහසු කාර්යයක් විය. සම්මන්ත්‍රණ, දේශන, වැඩමුළු වාර්ෂිකව දෙවතාවක් බැගින් පැවැත්වුව ද දායක පුස්තකාල අතරින් බොහොමයක් පුස්තකාල ක්‍රමානුකූලව යම් කාල පරිච්ඡේදයක් තුළ තම පුස්තකාලයේ ඇති තොරතුරු ජාතික පුස්තකාල වෙත නොඑවීම නිසා ත්‍රෛමාසිකව සිහි කැඳවීම් යොමු කිරීමට සිදු විය. මෙම සිහි කැඳවීම් දුරකථනය මගින් මෙන්ම පෞද්ගලිකව හමුවන අවස්ථාවලදී ද දැනුවත් කිරීම් මගින් සිදු කරන ලදී.

විද්‍යුත් තැපැල් භාවිත කරනු ලබන පුස්තකාල සඳහා විද්‍යුත් තැපැල් මගින් සිහි කැඳවීම් කරන ලද නමුත්, නිතර නිතර විද්‍යුත් ලිපිනයන් වෙනස් කිරීම ද සිදු කරනු ලැබූ හෙයින්, එයින් ද නිසි ප්‍රයෝජන ගැනීම දුෂ්කර විය. බොහෝ දුරට දායක පුස්තකාල සංඛ්‍යාව 2007 වන විට 77 ක්

වුවද, අඛණ්ඩව තොරතුරු එවීම මගින් දායකවන්නේ පුස්තකාල 46 වැනි ප්‍රමාණයකි. මෙසේ අඛණ්ඩව දායකත්වය නොසැපයීම සඳහා ද විවිධ හේතු බලපා ඇත. ඒ අතර, පරිගණකගත පුස්තකාල, විවිධ වූ තමන්ටම ආවේනික මෘදුකාංග භාවිත කිරීම නිසා එම මෘදුකාංග ඔස්සේ දත්ත අපනයනය (Export) කර ජාතික පුස්තකාලය භාවිත කරනු ලබන මෘදුකාංගයට දත්ත ආනයනය (Import) කිරීමේ අපහසුව.

සාමාජික පුස්තකාලවලින් බොහොමයක් පුස්තකාල WINISIS මෘදුකාංගය භාවිත කළ ද, පර්යේෂණ ආයතන පුස්තකාල, විශේෂ පුස්තකාල හා රජයේ නොවන ආයතනික පුස්තකාල විවිධ වූ මෘදුකාංග භාවිත කිරීම නිසා එම පුස්තකාලවල තොරතුරු ඒකාබද්ධ සූචියට ලබා ගත නොහැකි විය.

උදා : බ්‍රිතාන්‍ය කවුන්සල පුස්තකාලය
අන්තර් ජාතික වාරි කළමනාකාරිත්ව ආයතනික පුස්තකාලය (2002 වසරේ සිට)

WINISIS මෘදුකාංගය භාවිත කරනු ලබන පුස්තකාලවලින් වුවද ක්‍රමවත්ව තොරතුරු එවනු නොලබයි. මෙයට හේතු වී ඇත්තේ තාක්ෂණික දැනුම ඇති පුහුණු නිලධාරීන්ගේ හිඟකමයි. වාර්ෂිකව පවත්වනු ලබන වැඩමුළු මගින් පුස්තකාලයාධිපතීන්ට මෙන්ම පුස්තකාල භාරනිලධාරීන්ට ද ඔවුන්ගේ ගැටළු හඳුනාගෙන ඒ සඳහා විසඳුම් ලබා දුන්න ද එම පුස්තකාලවල තොරතුරු ලබා ගැනීම ද ඉතා දුෂ්කර වී ඇත. බොහෝ අවස්ථාවලදී ඒ ඒ පුස්තකාලවලට ගොස් දත්ත ආනයනය කරන ක්‍රම හඳුන්වා දී අදාළ තොරතුරු ජාතික පුස්තකාලයට රැගෙන ඒම සිදු කළ ද එතැන් සිට ඉදිරියට එම පුස්තකාලවලින් තොරතුරු ලැබී නොමැත.

එසේම, තම පුස්තකාලයේ තොරතුරු පරිගණකගත කර තිබුන ද තොරතුරු එවීමට පරිගණක තැටිලි නොමැති වීම නිසා ද සමහර පුස්තකාලවලින් තොරතුරු එවීම ප්‍රමාද කර ඇත. මේ සඳහා විසඳුමක් ලෙසට ජාතික පුස්තකාලය මගින් පරිගණක තැටිලි ලබාදීමට ද සිදු කරන ලදී. ශ්‍රමිකව තොරතුරු එවනු ලබන ආයතන සඳහා සූචි පත්‍රිකා ද ජාතික පුස්තකාලය විසින් ලබා දී ඇත.

දායක පුස්තකාලවලින් අඛණ්ඩව තොරතුරු ලබා ගැනීම සඳහා සාමාජික පුස්තකාල සඳහා විවිධ වූ ප්‍රතිලාභ සැපයීමට ද කටයුතු කරන ලදී. ඒ අතර,

- දායකවන පුස්තකාල ජාතික පුස්තකාලයේ විශේෂ අනුග්‍රාහක පුස්තකාලයක් ලෙස සැලකීම.
- ජාතික ග්‍රන්ථනාමාවලිය, පුස්තකාල ප්‍රවෘත්ති, ප්‍රතිග්‍රහණ ලැයිස්තු NATNET LANKA වැනි මණ්ඩලයීය ප්‍රකාශන නොමිලේ බෙදාදීම්.

- අන්තර් පුස්තකාල පිරුළු සේවාවලදී ප්‍රමුඛත්වය ලබාදීම.

- පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා ජාතික පුස්තකාලයේ පුහුණුවක් ලබා ගැනීමට කරනු ලබන ඉල්ලීම්වලදී ප්‍රමුඛත්වය ලබාදීම.

- ජාතික පුස්තකාලයෙන් තොරතුරු ලබා ගැනීමට කරනු ලබන ඉල්ලීම් සඳහා විශේෂ අනුග්‍රහය දැක්වීම.

- තම පුස්තකාල එකතුව හා පරිගණකවල අන්තර්ගත දත්ත කුමන හෝ හේතුවක් නිසා මැකී හෝ විනාශ වී ගියහොත් ජාතික ඒකාබද්ධ සූචිය මගින් දත්ත ආරක්ෂා කරදීම.

- අවශ්‍ය වූ අවස්ථාවක තම පුස්තකාලයේ තොරතුරු පිළිබඳ අතිරේක පිටපත් (Backup) ලබාදීම.

- තම පුස්තකාලයේ ඇති සම්පත් පිළිබඳ ප්‍රචාරයක් ලබාදීම මේ අතර වැදගත් වේ.

මෙම ප්‍රතිලාභ දායක පුස්තකාල සියල්ලටම පාහේ නොකඩවා සපයන ලදී. තොරතුරු ලබා ගැනීමට සිහි කැඳවීම් යවන අතරතුරේදීම මණ්ඩලයීය ප්‍රකාශන ද නොමිලේ බෙදා හැරීමට කටයුතු කරන ලදී. ප්‍රකාශන ලැබුණු බව දැන්වීමත්, ඒ සඳහා කෘතගුණ පළ කිරීමත්, නියමිත කාලවකවානුව තුළ දී තොරතුරු එවීමත් සිදු කරනු ලබන්නේ දායක පුස්තකාලවලින් ඉතා අතලොස්සක් පමණකි.

- පුස්තකාලවලින් ලැබෙන දත්තවල සම්පූර්ණ තොරතුරු අඩංගු නොවීම ද ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය කිරීමේ දී ගැටළුවක් විය.

ජාතික ඒකාබද්ධ සූචියට තොරතුරු ලැබෙන ක්‍රම ප්‍රධාන වශයෙන් දෙයාකාරවේ. එනම්,

1. ශ්‍රමික (Manual) - සූචි පත්‍රිකා, ප්‍රතිග්‍රහණ ලේඛන ජායාපිටපත්, පරිගණක මුද්‍රිත පිටපත්,
   විද්‍යුත් තැපැල් මගින් Word Document ලෙස)

2. පරිගණකගත (Computerised)- පරිගණක තැටිලි (Diskettes) සංගෘහිත තැටිලි (CD Rom) සහ විද්‍යුත් තැපැල් මගින් ඇමුණුමක් ලෙසට (Attachment through - email as an ISO file)

ශ්‍රමිකව ලැබෙන තොරතුරුවලින් කාඩ් පත්‍රිකා මගින් ලැබෙන තොරතුරු හැරුණුවිට අනෙකුත් ක්‍රම මගින් ලැබෙන තොරතුරුවලින් පොතක සම්පූර්ණ තොරතුරු ලබා ගත නොහැකි වේ. විෂයය, වර්ග අංකය, ISBN අංකය ආදී පොතක වැදගත්ම තොරතුරු ප්‍රතිග්‍රහණ ලේඛන මගින් නොසැපයෙන හෙයින්, ලැබෙන තොරතුරු ඒකාබද්ධ සූචියට ඇතුළත් කිරීම ගැටළුවක් විය. මෙහිදී කෘතියේ වැදගත්කම සලකා විෂයානුබද්ධ ග්‍රන්ථවල තොරතුරු පමණක් ඒකාබද්ධ

සූචියට ඇතුළත් කිරීමට කටයුතු කරන ලදී. විෂයය, වර්ග අංකය පොත නොමැතිව ඇතුළත් කළ ද, ISBN අංකය යෙදීමේ හැකියාවක් නොමැති හෙයින් එය හිස්ව තබන ලදී.

පරිගණකගත පුස්තකාලවලින් ලැබෙන තොරතුරුවල ද බොහෝදුරට අඩුපාඩු පවතී. බාහිර පුස්තකාලවලින් එවනු ලබන තොරතුරු තාවකාලික දත්ත පදනමට ඇතුළත් කරන විට බොහෝ දුරට සම්පූර්ණ තොරතුරු ලබා ගත නොහැකි වී ඇත. පරිගණකගත තොරතුරු ඇතුළත් කිරීමේ දී උපකාරක පද (Help Massages) භාවිත නොකිරීම නිසා එවනු ලබන තොරතුරු නිවැරදිව ලබා ගත නොහැකි වීම මෙන්ම, තොරතුරු නියමාකාරයෙන් ප්‍රදර්ශනය වීම ද සිදු නොවේ.

දත්ත පදනමට පොත් පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීමේදී බොහෝ විට කෙටියෙන් තොරතුරු දැක්වීම- උදාහරණ ලෙස ග්‍රන්ථනාමය කෙටි කර යෙදීම උප ග්‍රන්ථ නාමය නොදැක්වීම, ප්‍රකාශිත වසර නොදැක්වීම, කර්තෘ නාමය විවිධ ආකාරයට ඇතුළත් කිරීම (සාධිකාර ගොනුවක් භාවිත නොකිරීම) උදා : Sooriyaarachchi, Badra

Suriyaarachchi, Badra

Suriya Arachchi, Badra ආදි නොසැලකිලිමත් ලෙස තොරතුරු ඇතුළත් කිරීම නිසා දායක පුස්තකාලවලින් ලැබෙන තොරතුරු ප්‍රධාන දත්ත පදනමට ඇතුළත් කිරීමේ ගැටළු මතු විය.

එසේම, ජාතික පුස්තකාලයට තොරතුරු එවීමට ප්‍රථම අදාළ පුස්තකාලයේ පුස්තකාලයාධිපතින් මෙසේ ඇතුළත් කරන ලද තොරතුරුවල නිරවද්‍යභාවය තහවුරු කිරීම සඳහා සංස්කරණය කිරීම කළ යුතුවුවත්, එවැන්නක් සිදු නොකර තොරතුරු එවනු ලැබීමත් සිදු විය. මෙම ගැටළු විසඳාලමින් ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය කිරීම මෙන්ම පවත්වා ගෙන යාමද සුළු පටු කාර්යයක් නොවිය.

මෙවැනි ගැටළු බොහෝමයක් නිරාකරණය කර ගැනීම සඳහා අදාළ පුස්තකාලවල පුස්තකාලයාධිපතින් දැනුවත් කිරීමේ වැඩමුළු පවත්වන ලදී. වැඩමුළු සඳහා පුස්තකාල වෙතට ලිපි යොමු කිරීමේ දී ජාතික ඒකාබද්ධ සූචියට තොරතුරු එවනු ලබන නිලධාරීන් සහභාගි කරවන ලෙස දැනුම් දීමට යෙදුණි. මෙම වැඩමුළු අනුසාරයෙන් දත්ත පදනමට තොරතුරු එවිය යුතු අන්දම, තාක්ෂණික ගැටළු, තොරතුරු සම්පූර්ණයෙන් එවීමේ යෝග්‍යතාව, දායක පුස්තකාලවලට ලැබෙන ප්‍රතිලාභ ආදී සියළු දැනුවත් කිරීම් වාර්ෂිකව, අර්ධ වාර්ෂිකව සිදු කරන ලදී.

- ශ්‍රමිකව තොරතුරු එවීම නිසා එම තොරතුරු නැවත ශ්‍රමිකව දත්ත පදනමට ඇතුළත් කළ යුතු වීම.

වසර 2000 වන විට ප්‍රධාන දත්ත පදනමට අමතරව තවත් අතිරේක දත්ත පදනමක් සකස් කර, ශ්‍රමිකව එවනු ලබන තොරතුරු එම දත්ත පදනමට ඇතුළත් කිරීමට කටයුතු කරන ලදී.

CDS/ISIS මෘදුකාංගය භාවිතයෙන් මෙසේ දත්ත ඇතුළත් කිරීම ආරම්භ කළ අතර, 2001 සිට Alice for Windows භාවිතයෙන් ද ශ්‍රමිකව එවනු ලබන දත්ත ඇතුළත් කිරීමට කටයුතු කරන ලදී. මෙය ඉතා වෙහෙස කර මෙන්ම කාලය වැය වන කාර්යයක් විය. මේ සඳහා වෙනමම නිලධාරියකු යෙදවූ අතර, සෑම සතියකට වරක්ම ඇතුළත් කරන ලද දත්ත පරීක්ෂා කිරීමට ද කටයුතු කළෙමි. ප්‍රලේඛන සේවා අංශයේ තිබූ අනෙකුත් රාජකාරී කටයුතුවලට අමතරව ශ්‍රමිකව දායකවන පුස්තකාලවලින් ලැබෙන තොරතුරු ඇතුළත් කිරීම හා පරීක්ෂා කිරීම සඳහා කටයුතු කිරීමේ අපහසුව මඳ වශයෙන්වත් අවම කර ගැනීමේ චේතනාව ඇතිව 2003 වසරේදී දායක පුස්තකාල සඳහා ප්‍රශ්නාවලියක් යොමු කිරීමට කටයුතු කරන ලදී.

1993 වසරේ යොමු කරන ලද ප්‍රශ්නාවලියෙන් ලබාගත් තොරතුරු යාවත්කාලීන කර ගැනීමටත්, තම පුස්තකාල එකතුව පිළිබඳ තොරතුරු ජාතික ඒකාබද්ධ සූචියට එවීමට ඇති අපහසුතා හඳුනා ගැනීමත් මේ පිළිබඳව ආයතන ප්‍රධානීන්ගේ මතය තහවුරු කර ගැනීමත් මෙම ප්‍රශ්නාවලියෙහි මූලික පරමාර්ථය විය. ඒ අනුව, බොහෝ ප්‍රශ්නාවලි තුළින් දක්වා තිබූ අදහස් වූයේ තම ආයතන ප්‍රධානීන් මෙම ජාතික කර්තව්‍යය කෙරෙහි උනන්දුවක් දැක්වීම මඳ බවත්, එබැවින් ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීම වඩාත් වැදගත් බවත් ය.

2003-06-26 වන දින ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මගින් පවත්වනු ලැබූ NETELIS-2003 ජාතික සම්මන්ත්‍රණයේදී "ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනයේදී මුහුණපාන ගැටළු හා දුෂ්කරතා" මැයෙන් මා විසින් කරන ලද දේශනයත්, ඒ තුළින් බෙදා හරින ලද වාර්තාවත්, එම සම්න්ත්‍රණයට සහභාගී වූ ප්‍රධාන පෙළේ පුස්තකාලයාධිපතීන් ජාතික ඒකාබද්ධ සූචිය පිළිබඳව දැනුවත් කිරීමට හැකියාවක් ලැබීම මා ලද විශාල අත් දැකීමක් විය. ඒ අනුව, දායක පුස්තකාලවලින් ලැබෙන තොරතුරු බොහෝ නිවැරදිවත්, එවනු ලබන තොරතුරු පුස්තකාලයාධිපතීන් විසින් පරීක්ෂා කර එවීමත් නිසා පරිගණක ගත සූචිය සම්පාදනය කිරීම යම් තරමක පහසුවක් වූ බව සඳහන් කළ යුතුය. මෙය ජාතික කර්තව්‍යයක් බවත්, සාර්ථක ලෙස පවත්වා ගෙන යාමට දායක පුස්තකාලවල සහයෝගය ලබාදීම අත්‍යවශ්‍ය බවත් පැමිණ සිටි පුස්තකාලයාධිපතීන්ට පසක් කර දුනිමි.

- සාමාජික පුස්තකාල විවිධ මෘදුකාංග භාවිත කිරීම මෙන්ම, එකම මෘදුකාංගය වුවද විවිධ ක්ෂේත්‍ර වශු භාවිත කිරීම නිසා තොරතුරු ලබා ගැනීමේ අපහසුතාව.

ජාතික ඒකාබද්ධ සූචියට දායක කර ගනු ලැබූ පරිගණකගත පුස්තකාල බොහොමයක්ම තමන්ට ආවේණික පරිගණක මෘදුකාංග භාවිත කරනු ලබයි. CDS/ISIS, WINISIS, Alice for Windows වලට අමතරව LIBISIS, MYBIS හා වෙනත් විවිධ වූ මෘදුකාංග භාවිත කරමින් තම පුස්තකාල එකතුව පරිගණක ගත කර ඇත. මෙම මෘදුකාංග මගින් එවනු ලබන තොරතුරු WINISIS මෘදුකාංගයට හැරවීමේ (Convert) ක්‍රම ලේඛ (Programme) උපයෝගී කර ගනිමින් තම එකතුවෙහි ඇති තොරතුරු ජාතික පුස්තකාලයට එවනු ලබන පුස්තකාල ද මේ අතර වේ. උදාහරණ ලෙසට මොරටුව විශ්වවිද්‍යාල පුස්තකාලය, ශ්‍රී ලංකා මහ බැංකු පුස්තකාලය. අන්තර් ජාතික වාරි කළමනාකරණ ආයතනික පුස්තකාලයේ තොරතුරු ද WINISIS මෘදුකාංගයට

හැරවීමෙන් තොරතුරු එවීම සිදු කළ ද 2002 වසරේ සිට එම තොරතුරු ලබා ගැනීමට අපොහොසත් විය.

ජාතික ඒකාබද්ධ සූචියට දායක පුස්තකාල හා ජාතික පුස්තකාලය එකම මෘදුකාංගය භාවිත කළ ද විවිධ මට්ටමේ තමන්ට ආවේනික විවිධ ක්ෂේත්‍ර වගු (FDT) භාවිතය නිසා තොරතුරු ලබා ගැනීමේ අපහසුතාව පවතී.

පොදු දත්ත පදනමක් වෙනුවට පහසුවෙන් සකසා ගත හැකි කුඩා දත්ත පදනමක් සකස් කර තොරතුරු ඇතුළත් කිරීම නිසා ජාතික පුස්තකාලය විසින් එම තොරතුරු ලබා ගැනීමට නැවත ආකෘති (Reformat) සකස් කළ යුතු විය. මෙසේ නැවත ආකෘති සකස් කිරීම ඉතා කල්පනාකාරීව කළ යුතු වන අතර, කෙටිකාලයක් තුළදී කළ හැකි ක්‍රියාවක් ද නොවීය. එබැවින්, අලුතින් දායකවීමට බලාපොරොත්තුවන පුස්තකාල සඳහා පොදු දත්ත පදනම ලබා ගැනීමට ක්‍රියා කරන ලෙස පුස්තකාලයාධිපතීන් දැනුවත් කරන ලදී.

- ජාතික ඒකාබද්ධ සූචියට තොරතුරු ලබාදීමේ දී තොරතුරු රෙජිස්ටරයක් භාවිත නොකිරීම සහ දත්ත පදනම් නිතර නිතර සංශෝධනයට ලක් කිරීම නිසා ඇති වන ගැටළු.

මෙවැනි අපහසුවීම් බොහෝ දුරට ඇති වන්නේ පරිගණකගත තොරතුරු එවනු ලබන පුස්තකාල ආශ්‍රයෙනි. ජාතික ඒකාබද්ධ සූචියට තොරතුරු එවීමේදී තොරතුරු අපනයන රෙජිස්ටරයක් භාවිත කළ යුතු වේ. එහිදී තමන් එවනු ලබන තොරතුරු ප්‍රමාණය (MFN අංකයෙන් හෝ පරිග්‍රහන අංකය අනුව) සහ තොරතුරු එවන ලද දිනය සඳහන් කළ යුතු අතර, මෙසේ ලේඛනයක් පරිහරණය නොකිරීම නිසා එවනු ලබන තොරතුරු ද්විත්වකරණයට ලක්වේ. ද්විත්වකරණයට ලක් වූ තොරතුරු ගවේශනය කිරීමෙන් ප්‍රධාන දත්ත පදනමෙන් ඉවත් කිරීම නිතර කළ හැකි ක්‍රියාවක් නොවේ. එම නිසා තොරතුරු එවීමේ පරිපාටිය පිළිබඳව ද දායක පුස්තකාල දැනුවත් කිරීමට කටයුතු කළයුතු විය.

මීට අමතරව, නිතර නිතර දත්ත ප්‍රතිසංස්කරණය කර මුල සිට එවීම නිසා ද ජාතික පුස්තකාලයට එවන දත්ත තේරීමේදී ගැටලුවලට මුහුණ දීමට සිදුවේ. මුලින් එවනු ලැබූ තොරතුරු ඉවත් කර ප්‍රතිසංස්කරණය කිරීමෙන් අනතුරුව එවන ලද දත්ත ඇතුළත් කිරීමට සිදුවන අතර ප්‍රධාන දත්ත පදනම නිතර නිතර යාවත්කාලීන කිරීම සිදු කළ යුතු වේ.
එසේම සාමාජික පුස්තකාලවලින් අපහරණය කරනු ලබන දත්ත පිළිබඳව ද අවධානය යොමු කළ යුතුව තිබේ. පුස්තකාලවල විනාශ වී ගොස් ඇති ග්‍රන්ථ සහ ප්‍රතිග්‍රහන ලේඛනයෙන් ඉවත් කරන ලද ග්‍රන්ථ පිළිබඳ තොරතුරු ද ජාතික ඒකාබද්ධ සූචියෙන් ඉවත් කිරීමට සිදුවනු ඇත. තව ද, ආයතනිකනාමය වෙනස් කිරීම නිසා ලැබී ඇති තොරතුරුවල හැකුළුම් පදය ද වෙනස් කළයුතු විය. ආරම්භයේ සිට ජාතික ඒකාබද්ධ සූචියට දායක පුස්තකාල හතරක ආයතනිකනාමය මේ වනවිට වෙනස් වී ඇත. ඒවානම්

1. Ceylon Institute of Scientific and Industrial Research (CISIR) යන්න Industrial Technology Institute (ITI) ලෙස ද,
2. International Irrigation Management Institute (IIMI) යන්න International Water Management Institute (IWMI) ලෙස ද,
3. Pheniex College Clothing Technology (PCCT) යන්න Brandix College Clothing Technology (BCCT) ලෙස ද,
4. Natural Resources Energy & Science Authority of Sri Lanka (NARESA)
   යන්න,
   National Science Foundation (NSF) ලෙස ද වේ

- සමස්තයක් ලෙස ගත් කල දායක පුස්තකාලවලට ද ජාතික ඒකාබද්ධ සූචියට දායකවීමේදී දුෂ්කරතා මතු වී තිබීම.

ඒකාබද්ධ සූචියට දායකවීමට බොහෝ පුස්තකාලයාධිපතීන්ගේ අවශ්‍යතාව හා කැමැත්ත තිබුන ද එය ක්‍රියාත්මක කර ගැනීමේ විවිධ අපහසුතාවන්ගෙන් පසුවන බව ඔවුන් හා අදහස් හුවමාරු කිරීමේදී පැහැදිලි විය. ඒ අතර, ආයතනික මට්ටමෙන් පවත්නා මුදල් ප්‍රතිපාදන හිඟකම, තාක්ෂණික ගැටළු හා තාක්ෂණික උපකරණ හිඟකම, සාම්ප්‍රදායික ක්‍රමවලින් බැහැරව වෙනත් ක්‍රම භාවිතයට ඇති අකමැත්ත, පුහුණු කාර්ය මණ්ඩල හිඟකම සහ ආයතනයේ පරිපාලනමය ගැටළු හා දුෂ්කරතා ද වැදගත් වේ.

- එසේම සිංහල, දෙමළ ග්‍රන්ථ තොරතුරු ඒ ඒ භාෂාවන්ගෙන් ඇතුළත් කිරීමට තවම හැකියාවක් නොමැතිවීම.

ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනයේදී පුස්තකාලවල පවත්නා සිංහල, දෙමළ භාෂාවන්ට අදාළ පුස්තකාල ද්‍රව්‍යයන් පරිගණකගත කිරීමේදී ඒකමතික බවක් තිබිය යුතු වේ. නමුත් එක් එක් පුස්තකාල සිංහල, දෙමළ ග්‍රන්ථනාම පරිගණක ගත කිරීමේදී විවිධ වූ භාෂා පරිවර්තන ක්‍රම යොදා ගනු ලබන බව පෙනේ. උදාහරණ ලෙසට වචන හැසිරවීමේ ක්‍රමය, කොංග්‍රස් භාෂා පරිවර්තන ක්‍රමය හා එන් යූ යාපා මහතාගේ භාෂා පරිවර්තන ක්‍රමය ලෙස
මෙහි ඒකමතික බවක් ඇති කළ යුතුවේ. එසේ නොකළහොත් තොරතුරු ගවේශනය කරනු ලබන පාඨකයාට තොරතුරු මඟ හැරී යාමට ඉඩ සැලසෙනු ඇත. එමගින් ජාතික ඒකාබද්ධ සූචියෙහි පරමාර්ථ ඉටු නොවනු ඇත.

සමස්ථයක් ලෙස ගත් කල 1986 පුස්තකාල 06කින් ජාතික ඒකාබද්ධ සූචිය ආරම්භ කිරීමත්, 1996දී පුස්තකාල 25කින් ජාතික ඒකාබද්ධ සූචිය පරිගණකගත කිරීම ආරම්භ කිරීමත්, 2001 වසරේ සිට ජාතික ඒකාබද්ධ සූචිය මාර්ගගත සූචියට (OPAC) සම්බන්ධ කිරීමත්, 2003 වනවිට පොදු පාඨකයාගේ පරිහරනය සඳහා ඒකාබද්ධ සූචිය අන්තර්ජාලයට ඇතුළත් කිරීමට කටයුතු කළ හැකිවීමත් පොදුවේ ගත් කල ජාතික පුස්තකාලය මෙන් ම දායක පුස්තකාලවල

ජයග්‍රහනයක් ලෙස සැලකිය හැකිය. මෙවැනි ජාතික කර්තව්‍යයකට කැපවීමෙන් කටයුතු කර, අනාගත පරපුරට රටෙහි ප්‍රධාන පුස්තකාලවල ඇති සම්පත් භාවිතයට ඉඩ සැලසීමේ කාර්යයට දායක වීමට අවස්ථාවක් ලැබීම මාගේ ද භාග්‍යයක් කොට සලකමි.

ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනයේදී හා පවත්වා ගෙන යාමේදී මා ලද අත්දැකීම් අනුව මෙම ව්‍යාපෘතියේ අනාගතය මෙන් ම එහි සුරක්ෂාත භාවය සඳහා ද යෝජනා කිහිපයක් ඉදිරිපත් කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

- 1986 සිට මේ වනතුරු ග්‍රන්ථ පිළිබඳ තොරතුරු පමණක් ජාතික ඒකාබද්ධ සූචියට ලබා ගෙන ඇති අතර, එය සහරා, විද්‍යුත් මාධ්‍ය දක්වා ව්‍යාප්ත කිරීමට කටයුතු කිරීම

- ජාතික ඒකාබද්ධ සූචියෙහි වර්තමානයෙහි දත්ත භාරසිය පනස් දහස (450,000) ඉක්මවා තිබීම නිසා මෙහි සුරක්ෂිත භාවය ද සැලකිල්ලට ගෙන සංගෘහිත තැටියක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කිරීම.

- ජාතික ඒකාබද්ධ සූචියට දත්ත රැස්කිරීම පළාත් මට්ටමින් සිදු කිරීමට කටයුතු කිරීම. තොරතුරු තැපැල් මගින් එවීමේදී සිදුවන හානි බොහෝ දුරට මෙමගින් වලක්වා ගත හැකි වනවා සේ ම, තොරතුරු රැගෙන කොළඹට පැමිනීමට අවශ්‍ය නොවන හෙයින් දැනට වඩා දායක පුස්තකාල ප්‍රමාණය වැඩි කර ගැනීමේ හැකියාව ලැබෙනු ඇත.

- බාහිර පුද්ගලයන් හා ආයතන සමග කටයුතු කරනු ලබන ව්‍යාපෘතියක් හෙයින් නිතර නිතර ලිපි මගින්, ප්‍රශ්නාවලි මගින් තොරතුරු යාවත්කාලීන කිරීම මෙන්ම ගැටළු සාකච්ඡා කිරීම කළ යුතුවේ. එසේ හෙයින් ජාතික ඒකාබද්ධ සූචිය මැනවින් පවත්වා ගෙන යාම සඳහා ප්‍රලේඛන සේවා අංශයට අනුබද්ධව අනු ඒකකයක් ලෙස පවත්වා ගෙන යාමත්, මේ සඳහා පුස්තකාල දැනුම, පරිගණක දැනුම හා තාක්ෂණික දැනුම ඇති නිලධාරීන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් ඇතුළත් වීම සුදුසු යැයි යෝජනා කරමි.

ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනයේදී ජාතික පුස්තකාල මට්ටමින් දායක පුස්තකාලවල පුස්තකාලයාධිපතිවරුන් නිතර නිතර දැනුවත් කළයුතුවන්නා සේ ම, පුස්තකාලයාධිපතිවරුන් ද මෙය තමන්ගේ වෘත්තියමය කාර්යයක් සේ සලකා පොදුවේ දුෂ්කරතා රාශියකට මුහුණදීමට සිදුවුව ද, මෙය ජාතික කර්තව්‍යයක් බැවින් මනාව පවත්වාගෙන යාම සඳහා අප සැමගේ ම නොමසුරු සහයෝගය හා කැපවීම ලබා දිය යුතු වේ.

# ජාතික ඒකාබද්ධ සූචිය පවත්වාගෙන යාමේදී ඇතිවන තාක්ෂණික ගැටළු

අමරා නානායක්කාර
නියෝජ්‍ය අධ්‍යක්ෂ(වැ.බ)
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

## ආරම්භය

යම්කිසි රටක ප්‍රධාන පුස්තකාලවල ඇති තොරතුරු ඇතුළත් සංලේඛ එකතුවක් සහිත දත්ත පදනමක් ජතික ඒකාබද්ධ සූචිය ලෙස හැඳින්විය හැකිය. ඕනෑම රටක ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය හා පවත්වාගෙන යාම ජාතික පුස්තකාලයේ ප්‍රධාන වගකීමක් ලෙස සැලකේ. එම අරමුණ පෙරදැරිකරගෙන ශ්‍රී ලංකා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය මගින් 1986 වසරේදී ජාතික ඒකාබද්ධ සූචිය ආරම්භ කරන ලදි. ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල පුස්තකාල, පර්යේෂණ ආයතන පුස්තකාල හා විශේෂ පුස්තකාල 22 ක සහභාගිත්වයෙන් ඇරඹි මෙම ව්‍යාපෘතිය 1996 වනවිට පුස්තකාල පනහකට ආසන්න සංඛ්‍යාවක් දක්වා වර්ධනය විය.

සාමාජික පුස්තකාල වලින් ජාතික පුස්තකාලයට ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු එවීමේදී විවිධ මාධ්‍යයන් අනුගමනය කරනු ලැබේ. සූචි පත්‍රිකා, ප්‍රතිග්‍රහණ ලැයිස්තු, සූක්ෂම පත්‍රිකා, පරිගණක මුද්‍රිත පිටපත් ආදී ලෙස විවිධ ස්වරූප භාවිතා කෙරේ. මේ ආකාරයෙන් තෙමසකට වරක් ජාතික පුස්තකාලය වෙත ලැබෙන දත්ත සංලේඛ පරීක්ෂා කිරීම හා තේරීම සිදුකල යුතුවේ. විවිධ පුස්තකාල වලින් එකම ග්‍රන්ථය සඳහා ලැබෙන සංලේඛ තෝරා එම ග්‍රන්ථය ලබාගතහැකි ස්ථාන (Location) එක් සංලේඛයක සටහන් කර අතිරේක සංලේඛ පත්‍රිකා ඉවත්කල යුතුවේ. ඊට අමතරව දත්ත සංස්කරණය, විශේෂයෙන් සූචිකරණයේදී හා වර්ගීකරණයේදී සිදුවන විෂමතා ඉවත්කිරීම, විවිධ ස්වරූපවලින් ලැබෙන ග්‍රන්ථ විද්‍යාත්මක දත්තයන් පත්‍රිකා ස්වරූපයෙන් නිර්මාණය කිරීම ආදී ලෙස සංකීර්ණ වූ පිරිසැකසුම් ක්‍රියාවලියකට භාජනය කිරීමෙන් අනතුරුව ආකාරාදී පත්‍රිකා ගොනුවක් ලෙස ඒකාබද්ධ සූචිය සම්පාදනය කිරීම 1996 දක්වා සිදුකරන ලදි. මේ ආකාරයට අත්හුරු ක්‍රමයට (manual system) ඒකාබද්ධ සූචිය සම්පාදනය කිරීම පහසු කාර්යාවලියක් නොවේ. මේ සඳහා ග්‍රන්ථ විඥාපන සේවා පිළිබඳ මනා පලපුරුද්දක් සහිත කාර්ය මණ්ඩලයක් මෙන්ම යතුරු ලේඛකයින් වැනි සහාය කාර්ය මණ්ඩලයක් අවශ්‍යවේ. ආරම්භක අවධියේදි පුහුණු කාර්ය මණ්ඩලවල ඌණතාවය මධ්‍යයයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකුගේ අධීක්ෂණය යටතේ පුස්තකාලයාධිපතිවරයෙකු සහ යතුරු ලේඛකයෙකුගේ පමණක් සේවය ලබාගැනීමට සිදුවූ නිසා කාර්යක්ෂමව පවත්වාගෙන යාම එක්තරා විධියක අභියෝගයක් ලෙස සඳහන් කළ හැකිය.

## පරිගණකගත ජාතික ඒකාබද්ධ සූචිය (Computerized National Union Catalogue)

මෙම අභියෝගයෙන් ජයගැනීම සුදුසු පසුබිමක් එවකට ශ්‍රී ලංකාවේ නිර්මාණය වෙමින් පැවතුනි. අනිකුත් ක්ෂේත්‍රවල මෙන්ම පුස්තකාල ක්ෂේත්‍රයේ මුහුණපාන අභියෝගයන් ජයගැනීමේ විධිමත් මෙවළමක් ලෙස තොරතුරු තාක්ෂණය යොදාගෙන තිබීමයි. ඒ අනුව පරිගණක තාක්ෂණය උපයෝගී කරගෙන ජාතික

ඒකාබද්ධ සූචිය සම්පාදනය සඳහා 1996 අවසාන භාගයේදී පියවර ගන්නා ලදි. පුස්තකාල කටයුතු සඳහා පරිගණක තාක්ෂණය යොදාගනු ලබන පුස්තකාල 28 ක් තෝරා එම පුස්තකාලවල පුස්තකාලයාධිපතීන් සඳහා සම්මන්ත්‍රණයක් පවත්වා පරිගණකගත ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනයට මුල් පියවර තබනලදි. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ තොරතුරු තාක්ෂණ අංශය මගින් ප්‍රලේඛන සේවා අංශයේ සහයෝගය ඇතිව මෙම කර්තව්‍ය සඳහා මූලික පියවර ගන්නා ලද අතර පුස්තකාල පරිගණක තාක්ෂණය හඳුන්වාදීමේ පුරෝගාමී මෙහෙවරක යෙදෙන එවකට අන්තර්ජාතික ජල කළමණාකාරිත්ව ආයතනයේ පුස්තකාලයාධිපති එන්.යූ.යාපා මහතා විසින් සම්පත් දායකත්වය සපයන ලදි. මෙහිදී පරිගණකගත ඒකාබද්ධ සූචිය සඳහා භාවිතයට යොදාගත් නාමය වූයේ Computerized National Union Catalogue ය. කෙටි නාමය ලෙස UCAT භාවිතා කිරීමට තීරණය විය. ඕනෑම දේශීය පුස්තකාලයකට දායකත්වය ලබාගැනීමට අවස්ථාව ලබාදී තිබුණි.

### අරමුණ

පහත සඳහන් කරුණු පරිගණකගත ඒකාබද්ධ සූචියේ මූලික අරමුණු ලෙස දක්වා ඇත.

(i) දේශීය පුස්තකාලවල තැන්පත්කර ඇති ඒකීය ග්‍රන්ථ (Monographs) පිළිබඳ තොරතුරු ලබාගැනීම,එසේ නැතහොත් දේශීය පුස්තකාලවල තැන්පත්කර ඇති ග්‍රන්ථ පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සොයාගැනීමේ ගවේෂණ මෙවලමක් ලෙස භාවිතා කිරීම

(ii) පුස්තකාලවලට පොත් මිළදී ගැනීමේදී අනවශ්‍ය ද්විත්වකරණය වැළැක්වීම වෙනත් වචනවලින් කිවහොත් පුස්තකාල සහයෝගීතාව මත අනිකුත් පුස්තකාලයකින් ලබාගත හැකි ග්‍රන්ථ නැවත මිළදී ගැනීමෙන් වැළකීම.

(iii) පුස්තකාලවලට සාමූහික ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්තියක් ආරම්භ කිරීම සඳහා මෙය අත්වැලක් ලෙස භාවිතා කළහැකි වීම.

### උපදෙස් හා ප්‍රමිතීන්

දායකත්වය ලබන සියළුම පුස්තකාල පොදු ප්‍රමිතියක් අනුගමනය කිරීම අපේක්ෂා කරන ලදි. මට්ටම් තුනකින් අදාල ප්‍රමිතීන් භාවිතා කිරීමට උපදෙස් දෙන ලදි.

මෘදුකාංග (Software)
සංලේඛ (Records)
දත්ත (Data)

### මෘදුකාංග

යුනෙස්කෝ ආයතනය මගින් සංවර්ධනය කරන ලද Micro CDS / ISIS මෘදුකාංග පද්ධතිය ඒකාබද්ධ සූචිය සම්පාදනය සඳහා තෝරාගන්නා ලදි. මෙය ආරම්භයේ

සිටම ශ්‍රී ලංකාවේ පුස්තකාලවල බහුලව භාවිතා කරනු ලැබූ මෘදුකාංගය බැවින් එය භාවිතා කිරීම සුදුසු බවට නිර්දේශ ඉදිරිපත් කරනලදි. විවිධ පුස්තකාලවලින් ලැබෙන දත්ත සංලේඛ ඒකාබද්ධ සූචියට ඇතුළත් කිරීමේදී ඒකමතික භාවයක් ඇතිකිරීමේ අරමුණින් මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමුකරන ලදි.

## සංලේඛ

එවකට ශ්‍රී ලංකාවේ CDS / ISIS මෘදුකාංගය භාවිතා කළ පුස්තකාල තම පුස්තකාල සඳහා දත්ත පදනම් නිර්මාණය කිරීමේදී විවිධ ග්‍රන්ථ විද්‍යාත්මක ස්වරූප (Formats) භාවිතා කරන ලදි. ප්‍රධාන වශයෙන් SLISTINET හා MIBIS යන ස්වරූප භාවිතා කෙරිනි. ඒකාබද්ධ සූචිය සම්පාදනයේදී බොහෝදුරට අනුගමනය කරන ලද්දේ SLSISTINET ස්වරූපයයි. ඒ අනුව එය UCAT format ලෙස නම්කරනු ලැබීය. කුමන ස්වරූපයෙන් දත්ත ලැබුණද ජාතික පුස්තකාලය UCAT ස්වරූපයට එම දත්ත පරිවර්තනය කර ඒකාබද්ධ සූචියට ඇතුළත් කරනු ලැබේ.

## ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත

ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත පරිගණගත කිරීමේදී ප්‍රමිතියකට අනුව කළයුතුවේ. සියළුම පුස්තකාල ග්‍රන්ථ සූචිකරණයේදී අනුගමනය කරනු ලබන්නේ ඇන්ග්ලෝ-ඇමරිකානු සූචිකරණ ව්‍යවස්ථා මාලාවේ II සංස්කරණයයි. මෙම ප්‍රමිතිය සෑම පුස්තකාලයකම අනුගමනය කිරීමෙන් ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත පිළිබඳ ඒකමතියක් පවත්වා ගැනීමට හැකිවන බව අවධාරනය කරන ලදි. නමුත් වර්ගීකරණය, ප්‍රමුඛපද යෙදීම වැනි ක්ෂේත්‍රයන් ගැටළු පැනනැගීමට ඉඩ ඇත.

## ඒකාබද්ධ සූචිය සම්පාදන ක්‍රියාවලිය

ඉහත ප්‍රමිති අනුව සම්පාදනය කරනු ලබන පරිගණකගත ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත සංලේඛ තෙමසකට වරක් සාමාජික පුස්තකාල මගින් ජාතික පුස්තකාලයට එවීමට කටයුතු කළයුතු වේ. ජාතික පුස්තකාලය වෙත තොරතුරු එවීමේදී විද්‍යුත් පරිවහන ක්‍රම භාවිතා කළ හැකිය. පරිගණක තැටිලි ,විද්‍යුත් තැපැල සංගෘහිත තැටි භාවිතා කළ හැකිය. කුමන මාධ්‍යයක් භාවිතා කළද දත්ත ජාතික පුස්තකාලයට එවීමේදී ISO දත්ත ගොනුවක් ලෙස එය එවීමට කටයුතු කළයුතු වේ. මේ ආකාරයට ලැබෙන දත්ත ත්‍රෛමාසිකව ජාතික පුස්තකාලයේ ඇති UCAT දත්ත පදනමට ආදානය කරනු ලැබීමෙන් පරිගණකගත ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය කෙරේ.

## නව ප්‍රවණතා

ආරම්භයේදී Micro CDS / ISIS මෘදුකාංග පද්ධතිය ඇසුරින් ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනයට පියවර ගත්තද එම මෘදුකාංග වින්ඩෝස් (windows) පාදක පරිගණක පද්ධතියක් ලෙස නිර්මාණය වීම සමග CDS / ISIS, WINISIS නමින් නම්කරන ලදි. ඒ අනුව UCAT දත්ත පදනම 1999 දී WINISIS පාදක දත්ත පදනමක් බවට පරිවර්තනය කරන ලදි.

2000 වසරේදී ජාතික පුස්තකාලය සඳහා නව මෘදුකාංගයක් හඳුන්වා දෙන ලදි. Alice for Windows නම් වූ මෙම අනුකලිත (integrated) මෘදුකාංගය ඒකාබද්ධ

සූචිය සඳහා වූ මොඩියුලයකින්ද සමන්විත විය. ජාතික පුස්තකාල ප්‍රතිග්‍රහන, සූචිකරණ ආදී සියලු පුස්තකාල කටයුතු නව මෘදුකාංගය ඇසුරින් සාර්ථකව ස්වයංක්‍රියකරණය කරන ලදි. ඒකාබද්ධ සූචියද මෙම මෘදුකාංගය ඇසුරින් සම්පාදනය කිරීම සඳහා පියවර ගනු ලැබීය. මේ වනවිට ඒකාබද්ධ සූචිය WINISIS දත්ත පදනමක් ලෙස පවත්වාගෙන ගිය අතර, දත්ත සංලේඛ ලක්ෂයකට අධික සංඛ්‍යාවක් එහි විය. මෙම දත්ත Alice for windows පාදක ඒකාබද්ධ සූචිය සඳහා ඇතුළත් කිරීම සඳහා පියවර ගත්තද මතුවූ විවිධ තාක්ෂණික ගැටළු නිසා අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට නොහැකි විය.

2002 වසරේදී ජාතික පුස්තකාලය ලැබූ විශිෂ්ඨ ජයග්‍රහණයක් ලෙස ජාතික ඒකාබද්ධ සූචිය අන්තර්ජාලයට සම්බන්ධ කිරීම සඳහන් කළ හැකිය. වර්තමානයේ WINISISපාදක දත්ත පදනමක් ලෙස ජාතික ඒකාබද්ධ සූචිය පවත්වාගෙන යනු ලැබේ.

### තාක්ෂණික ගැටළු

ජාතික ඒකාබද්ධ සූචියට දායකවී ඇති පුස්තකාල ස්වයංක්‍රීයකරණය සඳහා වර්තමානයේ භාවිතා කරනු ලබන මෘදුකාංග විවිධ වේ. විශ්ව විද්‍යාල කිහිපයක් Alice for Windows මෘදුකාංගනයද, සමහර පුස්තකාල Libsys වැනි මෘදුකාංග භාවිතා කරනු ලැබේ. බොහොමයක් පුස්තකාල Winisis පද්ධතිය පාදක දත්ත පදනම් භාවිතා කෙරේ. වර්තමානයේ ජාතික ඒකාබද්ධ සූචිය පවත්වාගෙන යනු ලබන්නේද Winisis පාදක දත්ත පදනමක් ලෙසිනි. උදා: විවෘත විශ්ව විද්‍යාල පුස්තකාලය, කොළඹ විශ්ව විද්‍යාල පුස්තකාලය දත්ත ලබාදෙන්නේ Alice for windows මෘදුකාංග පාදක කරගෙන බැවින් එම ආයතනවල දත්ත Winisis පාදක UCAT දත්ත පදනමට ආදානය කිරීමට නොහැකිවී ඇත. මේ සඳහා ක්‍රමවත් පරිවර්තිත වැඩසටහනක් (Conversion programme) නොමැතිවීම නිසා එම දත්ත ජාතික ඒකාබද්ධ සූචියට ඇතුළත් කිරීම නොහැකිවී ඇත. එබැවින් පරිපූර්ණ ඒකාබද්ධ සූචියක් ගොඩනැගීමට සිදුවී ඇති ප්‍රධාන බාධකයක් ලෙස මෙය සඳහන් කළ හැකිය.

කටුබැද්ද විශ්ව විද්‍යාලයීය පුස්තකාලය පරිගණකගත කිරීමේදී භාවිතා කරනු ලබන්නේ Libsys මෘදුකාංගයයි. එසේ වුවද, ඔවුන් පරිවර්තිත වැඩ සටහන් සම්පාදනය කර ISO ගොනුවක් ලෙස ඔවුන්ගේ ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත, ජාතික පුස්තකාලයට එවන බැවින් භාවිතාකරන මෘදුකාංග Winisis සමග සමානතාවයක් (compatibility) නොදැක් වුවද, දත්ත ඒකාබද්ධ සූචියට ඇතුළත් කිරීමේ හැකියාව තිබීම වෙනස් මෘදුකාංග භාවිතාකරන පුස්තකාලවලට වටිනා ආදර්ශයකි. එමෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුව

මුල්කාලවලදී ඒකාබද්ධ සූචියට දායක වුවද, එම පුස්තකාලය Libsys දත්ත පදනම භාවිතයට ගැනීමත් සමග දායකත්වය ලබාදීම අත්හිටුවා ඇත. මේ අනුව වටිනා පුස්තකාල සම්පත් සහිත පුස්තකාල ජාතික ඒකාබද්ධ සූචියක් සම්බන්ධ නොවීම පිළිබඳව අවධානය යොමුකළ යුතුය.

දායක පුස්තකාලවලින් තොරතුරු ලබාදීමේදී සමහර අවස්ථාවල එකම ග්‍රන්ථය සඳහා ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත සැපයීමේදී පරස්පර විරෝධතාවයන් දැකිය හැකිය. එවැනි අවස්ථාවලදී මෙම කාර්යයෙහි නිරතවන නිලධාරින්ට දත්ත සංස්කරණය

කිරීමේ කාර්යයට අමතර දත්ත ආදානය කිරීමේදී ද යම් යම් ගැටළු මතුවේ. ඒ සඳහා සම්මත ප්‍රමිති හරියාකාරව අනුගමනය කිරීමෙන් මෙම අභියෝගයෙන් ජයගත හැකි වේ.

තවද භාෂාමය ගැටළුව විශාල අභියෝගයකි. සිංහල හා දෙමළ ග්‍රන්ථ පරිගණකගත කිරීමේදී එම ප්‍රකාශනවල ග්‍රන්ථ නාමය ඉංග්‍රීසි භාෂාවට අනුවර්තනය කර දත්ත පදනමට ඇතුළත් කරනු ලැබේ. මෙහිදී සියළුම පුස්තකාල අනුවර්තන කාර්යයයේදී එකම ප්‍රමිතියක් අනුගමනය නොකිරීමෙන් ඒකාබද්ධ සුචිය සම්පාදනයේදී විවිධ විෂමතාවයන්ට මුහුණ දීමට සුදුවේ. මේ පිළිබඳව සාමාජික පුස්තකාල විශේෂ අවධානය යොමුකල යුතුය.

තවද සාමාජික පුස්තකාලවල සේවය කරන පුස්තකාල වෘත්තිකයන්ට ඇති වෘත්තීය මෙන්ම තාක්ෂණික දැනුම මෙන්ම අත්දැකීම් මෙම ව්‍යාපෘතියේ සාර්ථකත්වයට බෙහෙවින් හේතුවන බව සඳහන් කළ යුතුය.

**යෝජනා :**

දැනට Alice for windows මෘදුකාංගය පුස්තකාල ස්වයංක්‍රීයකරණය සඳහා යොදාගනු ලබන පුස්තකාල ජාතික ඒකාබද්ධ සුචියට තොරතුරු එවීමට හැකිවන පරිදි පරිවර්තිත වැඩසටහනක් (data conversion programme ) නිර්මාණය කරගැනීම ජාතික ඒකාබද්ධ සුචියේ සාර්ථකත්වයට බෙහෙවින් වැදගත් වේ. තවද, Libsys මෘදුකාංගය භාවිතා කරනු ලබන පුස්තකාල වලට දැනට කටුබැද්ද විශ්ව විද්‍යාලය නිර්මාණය කර ඇති දත්ත පරිවර්තිත වැඩ සටහන, ලබාදුනහොත් එය ඒකාබද්ධ සුචියේ ප්‍රගතියට විශාල පිටුවහලක් වේ.

ජාතික ඒකාබද්ධ සුචිය සඳහා දායක පුස්තකාලවලින් තොරතුරු එවීමේදී ඒකීය ග්‍රන්ථ (monographs) පිළිබඳ පමණක් තොරතුරු එවීමට සටහන්කර ගත්තේනම් මැනවි. සමහර පුස්තකාලවලින් ළමා ග්‍රන්ථ, සඟරා, පිළිබඳ ආදී ලෙස විවිධ මූලාශ්‍ර පිළිබඳ දත්ත ලැබෙමින් පවතී. එබැවින් එවැනි තොරතුරු එවීමෙන් වලකින ලෙස දායක පුස්තකාල දැනුවත්විය යුතුවේ.

තවද, හැමවිටම පිළිගත් සුචිකරණ නීති අනුගමනය කිරීම බෙහෙවින් ප්‍රයෝජනවත්වේ. එසේ නොවුවහොත්, ජාතික ඒකාබද්ධ සුචියට දත්ත ඇතුළත් කිරීමේදී විවිධ විෂමතාවයන්ට මුහුණපෑමට සිදුවේ.

සිංහල හා දෙමළ ග්‍රන්ථ නාම ඉංග්‍රීසි භාෂාවට අනුවර්තනය කිරීමේදී එකම ප්‍රමිතියක් අනුගමනය කිරීමෙන් තොරතුරු ගවේශනයේදී මුහුණපාන ගැටළු බොහොමයක් නිරාකරණය කරගත හැකිවේ.

මෙම ව්‍යාපෘතියේ සාර්ථකත්වය රඳාපවතින්නේ ඔබසැම ලබාදෙන තොරතුරුවල ප්‍රමිතිගතබව, නිවැරදිතාවය හා කලටවේලාවට තොරතුරු ලබාදීම යන කරුණු පාදක කරගෙනය.

# ජාතික ඒකාබද්ධ සූචියේ අනාගත සංවර්ධනය සඳහා ගතහැකි ක්‍රියාමාර්ග

ජේ. ඒ. අමරවීර
පුස්තකාලයාධිකාරී
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## හැඳින්වීම

ජාතියක ඥාන සම්භාරයට පිවිසීමේ බිහිදොර අනෙකක් නොව එම දේශයේ ජාතික ඒකාබද්ධ සූචිය යි පැවසීම නිවැරැදිය. මෙම කර්තව්‍යයේ දී රටෙක ජාතික පුස්තකාලයට පැවරෙනුයේ වගකීමකින් යුතු සජීවී කාර්යභාරයකි. ජාතික ඒකාබද්ධ සූචිය අංග සම්පූර්ණ වන තරමටම එම රටෙහි පුස්තකාල ප්‍රනාලිය ද ප්‍රකාශිත ඥාන සම්භාරයෙන් පොහොසත් බව කියාපායි.

ඒකාබද්ධ සූචියක් යනු සාමූහික ප්‍රයත්නයක අන්ත ඵලය වේ. තොරතුරු සාමූහික පරිහරනය සඳහා තැනුනු ග්‍රන්ථ විඥාපන මෙවලමකි. එකම තේමාවක් අරභයා තොරතුරු එක්රැස්කරන්නාවූ හෝ එකම නිෂ්යාවක පිහිටා ක්‍රියාත්මක වන්නාවූ ආයතනයීය පුස්තකාල රැසක හෝ එක් භූගෝලීය කලාපයක, ප්‍රදේශයක පිහිටි පුස්තකාල ගණනාවක හෝ ග්‍රන්ථ විඥාපන තොරතුරු ඒකරාශී කොට සක්‍රීයව පවත්වාගෙන යන්නාවූ සංග්‍රහිත මෙවලමක් ලෙස ද ඒකාබද්ධ සූචිය නිර්වචනය කළහැක. නිදසුනක් ලෙස හෝග පර්යේෂණායතන පුස්තකාල ගණනාවක් එක්ව තම ග්‍රන්ථ විඥාපන තොරතුරු එක් තෝරාගත් ආයතනයක මධ්‍යගත සූචියකට සපයා පවත්වාගෙන යන්නාවූ කෘෂිකර්ම ඒකාබද්ධ සූචියක් මෙහිලා දැක්විය හැක. විවිධ විෂය ක්ෂේත්‍රයන් හා නිෂ්යාවන් පෙරදැරි කොටගෙන රටෙක පවත්වාගෙන යනු ලබන මෙවැනි ඒකාබද්ධ සූචි ගණනාවකි. කෘෂිකර්මය, සෞඛ්‍ය ක්ෂේත්‍රය, විද්‍යා හා තාක්ෂණය, සමාජයීය විද්‍යා වශයෙන් මෙන්ම විශ්වවිද්‍යාල, කාර්මික විද්‍යාල, වෛද්‍ය ආයතන ආදී වශයෙන්ද මෙවැනි ඒකාබද්ධ සූචි සංඛ්‍යාවක් මෙහි දැකිය හැක.

එසේ වුවද, ජාතික වශයෙන් වැදගත්වන, එවන් අනන්‍යතාවයක් පිලිඹිබු කෙරෙන ජාතික ඒකාබද්ධ සූචි රටක දැකිය හැක්කේ එකකි. ඇතැම් විට එක්සත් රාජධානිය වැනි රටවල් කිහිපයකින් සැදී (උදා:- වේල්සය, එංගලන්තය, ස්කොට්ලන්තය, අයර්ලන්තය) සුවිසල් ඒකාබද්ධ රාජ්‍යයක ජාතික ඒකාබද්ධ සූචි කිහිපයක් දැකිය හැක.

සෑම රටකම පාහේ ජාතික ඒකාබද්ධ සූචියක් නිර්මාණය කොට පවත්වාගෙන යනුයේ එරට ජාතික පුස්තකාලය මගිනි. අප රටෙහි ද ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය මගින් ශ්‍රී ලංකා ජාතික ඒකාබද්ධ සූචිය පවත්වාගෙන යනු ලබයි. එයට අමතරව විද්‍යා හා තාක්ෂණය පිළිබඳ ජාතික මට්ටමේ ඒකාබද්ධ සූචියක් ජාතික විද්‍යා පදනම මගින් පවත්වාගෙන යනු ලැබේ.

**ඒකාබද්ධ සූචිය - අර්ථ නිරූපන**

ජාතික ඒකාබද්ධ සූචියක ලක්ෂණ හා ක්‍රියාවලිය පිළිබඳව යොමුවීමට ප්‍රථමව ඒකාබද්ධ සූචිය යනු කවරේදැයි නිශ්චිත පිළිගත් අර්ථ නිරූපන සහදාදීම වැදගත්ය.

ලොව සුපතල අන්තර්ජාලස්ථ විද්‍යුත් විශ්වකෝෂය වන විකිපීඩියා (WIKIPEDIA) විසින් ඒකාබද්ධ සූචිය මෙසේ අර්ථ දක්වයි.

## Union Catalogue

A Union Catalogue is a combined library catalogue describing the collections of a number of libraries. Union catalogue have been created in a range of media including book format, microform, cards and more recently networked electronic databases. Print Union Catalogue are typically arranged by title, authors or subject (Often employing controlled vocabulary) ; electronic versions typically support keyword and boolean queries. (Wikipedia)

ඒකාබද්ධ සූචියක් යනු පුස්තකාල ගණනාවක එකතුන් පිළිබඳ විස්තර සැපයෙන පුස්තකාල සූචිවල එකතුවකි. ග්‍රන්ථ ආකෘතිය, සූක්ෂමරූපී, පත්‍රිකා වැනි ආකෘතීන් හෙවත් විලාසයන්ගෙන් සහ මෙම යුගයේදී ජාලගත විද්‍යුත් දත්ත පදනම් වැනි මාධ්‍යය පරාසයකින් ඒකාබද්ධ සූචි නිර්මාණය වී ඇත. මුද්‍රිත ඒකාබද්ධ සූචි ආවේණික ග්‍රන්ථ නාමය, කතෘ හෝ විෂය (මේ සඳහා බොහෝවිට පාලිත වදන් සමුදායක් භාවිත කෙරේ.) අනුව සැකසෙයි. විද්‍යුත් ආකාරය විශේෂයෙන් යොමුපද (බීජ පද) සහ බූලියන සෙවුම් කෙරෙහි සහායක් දක්වයි.

## Union Catalogue

A Union Catalogue is a service which aggregates the catalogues of participating libraries to allow users to quickly determine which libraries may have a copy of a particular work. (google scholar)

කිසියම් කෘතියක පිටපතක් ලබාගත හැක්කේ කවර පුස්තකාලයකින්දැයි පාඨකයාහට කඩිනමින් නිර්ණය කළහැකි කමක් ලබාදෙන්නාවූ, දායක පුස්තකාල සූචි සමුච්චයක සේවාව ඒකාබද්ධ සූචිය වේ.

### ඒකාබද්ධ සූචියක ලක්ෂණ හා නිමාව

ඒකාබද්ධ සූචියක ප්‍රමුඛ ලක්ෂණය වනුයේ, එය නිශ්චිත භූගෝලීය කලාපයක්, විෂය ක්ෂේත්‍රයක් හෝ පුස්තකාල විශේෂයක් මුඛ්‍ය ලෙස ගෙන සහභාගීවන පුස්තකාල සංඛ්‍යාවක සම්පත් එකතුන් පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක හා පිළිගත් ග්‍රන්ථ විද්‍යාත්මක ප්‍රමිතිවලට අනුකූලව සැකසූ ප්‍රමාණාත්මක ක්‍රමික ලැයිස්තුවක් ලෙස සැලකිය හැකි වීමයි.

විවිධ විෂයයන් තේමාකොට ගෙන ජාලගතව නිර්මිත පුස්තකාල ජාලයන්හි මධ්‍යගතව සැලසෙන සූචි ඒකාබද්ධ සූචි සඳහා කදිම නිදසුන්ය. කෘෂිකර්මය හා අනුබද්ධ විෂයයන් මූලිකව ඒකරාශී වූ කෘෂිකර්ම තොරතුරු ජාලය හෙවත් ඇග්රිනෙට් ජාලය සම්බන්ධ CARP ආයතනය මගින් ක්‍රියාත්මක වන ඒකාබද්ධ සූචිය මෙහිලා වැදගත්ය.

ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ සූචි හා ජාතික ඒකාබද්ධ සූචි ආරම්භය ගැන විමසීමේදී, එවකට ජාතික විද්‍යා සභාව (National Science Council) යටතේ පැවති ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ තොරතුරු මධ්‍යස්ථානය (SLSTIC) මගින් සැකසුනු SLSTINET නම් විද්‍යා හා තාක්ෂණ තොරතුරු ජාලය මගින් පුරෝගාමීව ඇරඹි UNICAST (Union Catalogue of Science and Technology) ඒකාබද්ධ සූචිය විශේෂයෙන් සඳහන් කළයුතුය. විද්‍යා හා තාක්ෂණය විෂයානුබද්ධ පුස්තකාල ගණනාවක සහයෝගයෙන් 1981 දී ආරම්භ කළ මෙම ඒකාබද්ධ සූචිය නිර්මාතෘ ලෙස එවක එම SLSTIC-තොරතුරු මධ්‍යස්ථානයේ තොරතුරු අධ්‍යක්ෂ වූ එන්. යූ. යාපා මහතා

සිහිපත් කළයුතුය. පත්‍රිකා සූචියක් ලෙස ඇරඹි එම සූචිය 1984දී පමණ CDS/ISIS මෘදුකාංගය උපයෝගී කර ගනිමින් පරිගණකස්ථ ඒකාබද්ධ සූචියක් ලෙස සැකසිනි. ඉන් ඉක්බිති WINISIS මෘදුකාංගය එහි සැකසුම් සඳහා යොදා ගැණිනි. මෙම ඒකාබද්ධ සූචිය එවකට "නිල නොලත්" ජාතික විද්‍යා හා තාක්ෂණ ඒකාබද්ධ සූචිය ලෙස හැඳින්විනි. ජාතික ඒකාබද්ධ සූචියක අවශ්‍යතාවය එම සූචිය මගින් කල්තබා රටට ඉඟි කරන ලද බව විද්වතුන්ගේ අදහසයි.

එසේම, එවැනි ඒකාබද්ධ සූචියක් සඳහා ප්‍රමිත තොරතුරු සංගෘහිත ආකෘතියක් (Format) ලෙස SLSTINET Format නම් ආකෘතිය භාවිත කිරීමත්, CCF හෙවත් Common Communication Fornat නම් පොදු සංනිවේදන ආකෘතිය සමඟ අනුගත වීමත් ISO 2709 නම් තොරතුරු හුවමාරු පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතය අනුව යාමත් මෙහිලා විශේෂයෙන් සඳහන් කළයුතුය.

## ජාතික ඒකාබද්ධ සූචියක වැදගත්කම

කිසියම් රටක ක්‍රියාත්මක සියලුම පුස්තකාලයන්හි පවත්නා සම්පත් එකතුන්ගේ මුළු සම්භාරයම හෝ එහි කොටසක් පිළිබඳව ප්‍රමිත ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත්ව පිළිගත් ප්‍රවීන සූචි ක්‍රමවේදයකට අනුව සැකසුනු අංග සම්පූර්ණ පොදු ලැයිස්තුවක් එහි ජාතික ඒකාබද්ධ සූචියය යයි හැඳින්වේ. ජාතික ඒකාබද්ධ සූචිය නිර්මාණය, පාලනය හා අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වගකිව යුතු වන්නේ එම රටෙහි ජාතික පුස්තකාලයයි. ඒ අනුව, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය යටතේ ක්‍රියාත්මක ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ශ්‍රී ලංකා ජාතික ඒකාබද්ධ සූචිය පිළිබඳ වගකීම දරා සිටියි. ශ්‍රී ලංකා ජාතික ඒකාබද්ධ සූචිය ගොඩනැංවීමේ කටයුතු 1986 වර්ෂයේදී අරඹා (1986.12.01) අදියර පහකින් ක්‍රියාත්මක කළ බව ජානකී ප්‍රනාන්දු (1994) පෙන්වා දෙයි.

ආරම්භයේදී පුස්තකාල (06) හයකින් ස්ථාපිත කළ ජාතික ඒකාබද්ධ සූචිය මේ වනවිට ශ්‍රී ලංකාවේ විවිධ පුස්තකාල සියයකට ආසන්න සංඛ්‍යාවක සහභාගිත්ව දායකත්වයෙන් මෙම ශ්‍රී ලංකා ජාතික ඒකාබද්ධ සූචිය සක්‍රියව පවත්වාගෙන යයි. ආරම්භයේ පත්‍රිකා සූචියක් ලෙස ඇරඹි මෙම මහඟු කර්තව්‍යය පසුව පරිගණකස්ථ වූයේ CDS/ISIS මෘදුකාංගය උපයෝගීකර ගනිමිනි. පසුව WINISIS මෘදුකාංගය ඒ සඳහා යොදා ගැණිනි. 2001 දී පමණ එම කාර්යය සඳහා වාණිජ මෘදුකාංගයක් වූ

Alice for Windows පද්ධතිය භාවිතය මාරුවිය. මේ දක්වා ක්‍රියාත්මක වනුයේ පසුව කී මෘදුකාංග පද්ධතියයි. ශ්‍රී ලංකාවේ පුස්තකාලවල තොරතුරු පරිගණකස්ථ කිරීමේ හා හුවමාරු ක්‍රියාවලියේදී ප්‍රධාන ආකෘති 2ක් භාවිත වේ. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාල ස්වයංක්‍රියකරණයේදී පරිගණකස්ථ සූචිය නිර්මාණය සඳහා IDRC ආයතනය විසින් සකසන ලද ප්‍රකට MIBIS ආකෘතිය භාවිතය පිළිගන්නා ලදී. එවකට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේදී පුස්තකාලයාධිකාරී වූ මහාචාර්ය ඩබ්ලිව්. බී. දොරකුඹුර (පසුකලෙක එම විශ්වවිද්‍යාලයේ උපකුලපති විය) ගේ ප්‍රධානත්වයෙන් 1991 අගෝස්තු මස 16 දින පැවති සාකච්ඡා සභාවේදී මෙම MIBIS ආකෘතිය යම් යම් සංශෝධන සහිතව ක්‍රියාත්මක කිරීමට ගිවිස ගන්නා ලදී.

SLSTIC ආයතනය හා එහි ඒකාබද්ධ සූචියට දායකවන පුස්තකාල විසින් SLSTINET ආකෘතිය පිළිගන්නා ලදී. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය තම ජාතික ඒකාබද්ධ සූචිය සඳහා පිළිගන්නා ලද්දේ SLSTINET ආකෘතියයි. විශ්වවිද්‍යාල පුස්තකාල මගින් WINISIS, Alice for Windows, Libsys, Libsuite, PURNA සහ විශේෂයෙන් KOHA නම් විවෘත මෘදුකාංගය උපයෝගී කොටගෙන නිර්මාණය කළ (නිර්මාතෘ : නිමල් හෙට්ටිආරච්චි මහතා) ISURU යන විවිධාකාර වූ පුස්තකාල මෘදුකාංග තම පරිගණකස්ථ සූචි නිර්මාණය සඳහා භාවිතා කරයි. මේ අනුව ජාතික ඒකාබද්ධ සූචියට දායකවීමේදී යම් යම් සංකූලතා ඇති වුව ද, ඉහත දැක්වූ ආකෘතීන් (Format) දෙක MIBIS හා SLSTINET අනුගත සංලේඛ Reformatting FST යන ක්ෂේත්‍ර තේරීම් වගුවක් හරහා වැඩි ගැටළුවක් නැමැතිව අද ද භාවිත වේ.

## අතථ්‍ය ඒකාබද්ධ සූචියකට ප්‍රවේශවීම

ඒකාබද්ධ සූචියක් කිසියම් මධ්‍යගත ස්ථානයක පවත්වාගෙන යනවා වෙනුවට එම දායක ආයතන (පුස්තකාල) වල සිටම සූචිය පවත්වාගෙන යාමත්, ඕනෑම පාඨකයෙකුට මාර්ගගතව (On-line) ඒ එක් එක් දායක සූචියකට ප්‍රවිෂ්ඨ වීමට ඇති හැකියාවක් නිර්මාණය කිරීම අතථ්‍ය ඒකාබද්ධ සූචියක් ඇති කිරීමේ මුඛ්‍ය පරමාර්ථයයි. ඒ සඳහා විශේෂයෙන් ප්‍රමිත නියමාවලී (Standard Protocols) හා ප්‍රමිත ආකෘති හා තොරතුරු හුවමාරු ප්‍රමිත පවත්වාගෙන යාමත් වැදගත්ය. මෙම කාර්යය සඳහා තොරතුරු හුවමාරු නියමාවලී ලෙස Z3950, ISO 2709 ද MARC Format ආකෘති ද ලොව පුරා ඇති තොරතුරු මධ්‍යස්ථානවල හා පුස්තකාලවල

භාවිත වෙයි. එසේම, ජාතික ඒකාබද්ධ සූචිය අත්‍යාය සන්දර්භයට අනුව පිහිටුවිය යුතුවේ.

## ශ්‍රී ලංකා ජාතික ඒකාබද්ධ සූචියේ ඉදිරි ගමන් මග

අද ලොව සියළුම තොරතුරු ප්‍රභව හා මූලාශ්‍ර පරිගණකස්ථව පවත්වාගෙන යා හැකි විවිධ ආකෘති මූලික දත්ත පදනම් ලෙස ගොඩනගා හෝ ගොඩනැගෙමින් හෝ පවතී. මුල්ම අවදියේ, එනම් ප්‍රාථමික අවධියේ පත්‍රිකා සංලේඛ එකතුවක් ලෙස (1986) ගොඩනැංවුන ශ්‍රී ලංකා ජාතික ඒකාබද්ධ සූචිය පුස්තකාල මෘදුකාංග අනුසාරයෙන් පරිගණකස්ථ ජාතික ඒකාබද්ධ සූචියක් බවට පත්විය. පසුව 1996 දී WINISIS මෘදුකාංගය උපයෝගී කර ගනිමින් පරිගණකස්ථ සූචියක් බවට පත් කෙරිනි. එමගින් දත්ත හුවමාරු හා දත්ත නිවේෂන කාර්යයන් පහසු විය. එය මාර්ගගත OPAC සූචියක් බවට පත්විය. විද්‍යුත් තැපැල හරහා දායක සූචි සංලේඛ ජාතික ඒකාබද්ධ සූචියට එවීමට හැකිවීම මෙහිලා විශේෂයෙන් සඳහන් කළයුතුය. පරිගණක ඩිස්කට්, සීඩී තැටි ස්වරූපයෙන් ද දත්ත සංලේඛ එවීමට හැකිවීම පහසුවක් විය. Alice for Windows මෘදුකාංගයට මාරුවීම ද මෙහිලා කැපීපෙනෙන සන්ධිස්ථානයක් විය. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලීය නිල වෙබ් අඩවිය ප්‍රතිෂ්ඨාපන කිරීම නිසා එහි වෙබ් ඔපැක් (Web OPAC) ස්වරූපයෙන් අන්තර්ජාලය හරහා පාඨකයාට තොරතුරු ලබා ගැනීමට ජාතික ඒකාබද්ධ සූචිය භාවිත කළ හැකිවීම ද කැපීපෙනෙන සන්ධිස්ථානයකි.

තොරතුරු සංඛ්‍යාංකකරණය හෙවත් ඩිජිටලීකරණය නිසා ජාතික ඒකාබද්ධ සූචියේ සියළු සංලේඛ සමරූපී (Analog) තත්ත්වයේ සිට ඩිජිටල් හෙවත් සංඛ්‍යාංකමය ස්වරූපයට පරිවර්තනය විය. පාඨකයාට තම අවශ්‍යතා ඉතා දුරබැහැර සිට අන්තර්ජාලය ඔස්සේ තම පරිගණක වෙත බාගත (Download) කරගැනීමට මෙනයින් ඉඩ ප්‍රස්ථා ඇති විය. තමනට අවශ්‍ය පොත හෝ පොත් රටේ කුමන පුස්තකාලයක තිබේදැයි එම පුස්තකාලයට නොගොස්, එම පුස්තකාල වෙබ් අඩවිගත OPAC වෙත ප්‍රවිෂ්ට නොවී සොයා බැලීමට හෙවත් මාර්ගගත සෙවුමක් (On-lin search) මගින් සොයා ගැනීමට මෙකී ඩිජිටලීකරණ ක්‍රියාවලිය නිසා මග පෑදිණි. ශ්‍රී ලංකා ජාතික ඒකාබද්ධ සූචියට අන්තර්ජාලගතව ප්‍රවිෂ්ට වී සෙවුම් පිටුව විවෘත කර ගැනීමට පහත දැක්වෙන වෙබ් ලිපිනය (URL) මගින් ඉඩ සැලසේ.

http://203.115.24.86/wwwisis/ucat/form.htm

මේ ගවේෂණ මාර්ගය ඔස්සේ, මෙකී ජාතික ඒකාබද්ධ සූචියට දායකවන පුස්තකාල ගණනාවෙන් ඕනෑම පුස්තකාලයක OPAC සූචියට ස්වයංක්‍රීයව ප්‍රවිෂ්ට වී තොරතුරු ලබාගත හැකිය. මෙහිදී සෙවුම් සඳහා බූලියන සෙවුම් (Boolean search) ක්‍රමවේදය ද උපයෝගී කරගත හැකිය.

**ජාතික ඒකාබද්ධ සූචිය නව මගක් කරා**

ශ්‍රී ලංකා ජාතික ඒකාබද්ධ සූචියේ සංලේඛ ස්ථානීයව පරිගණකගත කරනු වෙනුවට අන්තර්ජාලය ඔස්සේ ඒ ඒ දායක පුස්තකාලවල සූචියට එක එල්ලේම ප්‍රවේශ වියහැකි මාර්ගගත වෙබ් පුරුක් (On-line weblink) නාමාවලියක් සකසා ලැයිස්තුගත කොට සංදර්ශනය කිරීම වැදගත් පියවරකි. සෙවුමක් කිරීමේදි වඩා ආයාසයකින් තොරව තොරතුර කරා එළැඹ එය ගොඩබාගත හැකි ස්වයංක්‍රීය ග්‍රහණ ක්‍රමවේදයකට පරිවර්තනය විය යුතුය. ඒ ඒ දායක පුස්තකාලයන්හි සූචි සම්භාර විද්‍යුත් ආකාරයට ඩිජිටලීකරණයව වෙන වෙනම පවත්වාගෙන යායුතු අතර, ජාතික ඒකාබද්ධ සූචියේ ආමුඛය එම සූචි සඳහා බිහිදොරක් (gateway) හෙවත් පෝටලයක් (Partal) බවට ප්‍රවර්තනය වියයුතුය. මේ සඳහා නියමිත ප්‍රමිත නියමාව ලී හා ඩිජිටලීකරණ මෙන්ම අන්තර්ජාල සහ ක්‍රමලේඛ ප්‍රමිති (Protpcols and web standards) භාවිත කළයුතුය. සියළුම ක්ෂේත්‍රාංක (Tag) සහ කේතාංග හැඳිනුම් (Strings) මාර්ක් (Machine Readable Codes) කේතාංක ලෙස හඳුන්වාගත යුතුය. එවිට එම නියමාවලිය දායක පුස්තකාලවලට ද ලබාදිය යුතුය. එසේම තොරතුරු හුවමාරුවේදී Z 39.50 නම් ANSI ප්‍රමිතිය හා ISO 2709 ප්‍රමිතිය භාවිත කළයුතුය. අනෙකුත් දායක පුස්තකාල ද ඒ අනුව දැනුවත් කළ යුතුය. සියළුම දායක සූචි ඩිජිටලීකරණය මගින් සමරූපී තත්වයේ සිට ඉලෙක්ට්‍රොනික තත්වයකට මාරුකොට වෙබ් ඔපැක් ගොනු ලෙස දත්ත පදනම් ගත කළයුතුය. ඒ සඳහා නිශ්චිත වෙබ් ලිපිනයක් (URL) ලබාගත යුතුය. මේ නයින් බලන කළ අනාගත ජාතික ඒකාබද්ධ සූචිය "අතථ්‍ය ජාතික ඒකාබද්ධ සූචියක්" බවට සංවර්ධනය විය යුතුය. හුදෙක් එය දායක පුස්තකාල සූචි සඳහා ජාතික පිවිසුම් මගක් (National gateway) බවට පරිවර්තනය විය යුතුය. එය ජාතික පුස්තකාල වෙබ් අඩවියේ ප්‍රමුඛතාවයකින් යුතුව දිස්විය යුතුය. වෙබ් නාමාවලී සංගුහකරණ (Webliographic development) සංකල්පය හා ක්‍රමවේදය

ද මෙහිලා ආදර්ශයකට ගත හැකිය. මෙසේ සකසනු ලබන අතථ්‍ය ජාතික ග්‍රන්ථනාමාවලිය හුදෙක් ජාතික මට්ටමෙන් විනිර්මුතව (මිදී) විශ්වීය තත්වයට පත්වනු ඇත.

එම අතථ්‍ය ජාතික ග්‍රන්ථනාමාවලිය පිළිබඳ වෙබ් සම්බන්ධක පුරුක (Weblink) ලොව වෙනත් ප්‍රකට සංගෘහිත වෙබ් අඩවි (උදා:- Libwebcat, Libdex) වැනි අඩවිවල තැන්පත්ව තිබිය යුතුය. එවිට ලොව ඕනෑම ස්ථානයක සිට පාඨකයෙකුට ඉතා පහසුවෙන් හා නිමේෂයකින් වැඩි ආයාසයකින් තොරව ශ්‍රී ලංකාවේ මෙකී පද්ධතියට දායක ඕනෑම සූචි දත්ත පදනමකින් තම තොරතුරු අවශ්‍යතාවය ඉටු කරගත හැකි වනු ඇත.

ඒ සඳහා තාක්ෂණ පැත්ත ද සංවර්ධනය වියයුතුය. විශේෂයෙන් අධිවේගී උච්ච ධාරිතාවයකින් යුත් සේවා පරිගණක හෝ පරිගණක ජාල පද්ධතිය තුල ජාතික වශයෙන් ස්ථානගතව පවත්වාගෙන යායුතුය. එම ක්‍රියාවලීන්ට අදාළව මෘදුකාංග ; මෙහෙයුම් මෘදුකාංග, වයිරස ප්‍රතිරෝධී ආරක්ෂක මෘදුකාංග ; බහුමාධ්‍යකරණ මෘදුකාංග ආදිය විටින් විට යාවත්කාල කරමින් පවත්වාගෙන යායුතුය.

මෙහිලා ඉතාම වැදගත් වන්නේ අප රට දත්ත හුවමාරු සංනිවේදන ජාලයයි. අධිවේගී දත්ත සම්ප්‍රේෂණ මාර්ග නොසිඳී පවත්වාගෙන යායුතු අතර එහි දත්ත හුවමාරු වේගය ඉතා ඉහලින් පවත්වාගෙන යායුතුය. තොරතුරු/දත්ත ගලායන Bandwidth නම් පරාසයන් ඉතා ඉහල හා විටින් විට බිඳ නොවැටී අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාවක් ද අවශ්‍යයෙන්ම ජාතික සන්නිවේදන සම්ප්‍රේෂණ ජාලය තුල තිබිය යුතුය.

මේ අයුරින් සලකන කළ මොහොතින් මොහොත වෙනස්වන විශ්ව තොරතුරු ප්‍රවනතා සහ ප්‍රවර්ධනයන් හා එක්ව යාහැකි හසරුතාවක් අප ආයතන සතුව තිබීම බෙහෙවින් වැදගත්ය. අප ජාතික ඒකාබද්ධ සූචිය ද ස්ථානීය ස්ථිතික තත්වයේ සිට ගතික වූ අතථ්‍ය ස්වරූපයට වහාම පරිවර්තනය විය යුතුය. නොඑසේ නම් මුළු මහත් ලොවම "ආලෝක" වේගයෙන් ඉදිරියට යද්දී අපි කණා මැදිරියන් හා පියාසරණ යුගයක අතරමං වන්නෝ වෙමු.

## ආශ්‍රිත ග්‍රන්ථ/ලිපි නාමාවලිය


අමරසිරි, එම්. එස්. යූ. සංස්කාරක සටහන් -
ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සමරු කලාපය.
ශ්‍රී ලංකා ජා. පු. හා ප්‍ර. සේ. ම. 1990. පි. 1-18

යාපා, එන්. යූ. පුස්තකාලය හා පරිගණකය
කොළඹ. ජාතික පුස්තකාලය-1991

ප්‍රනාන්දු, ජානකී. ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනයේලා
ශ්‍රී ලංකාවේ පුස්තකාලවල කාර්ය භාරය
පුස්තකාල ප්‍රවෘත්ති 15/5, 1994 පි. 19-24

Seneviratne, Gihan & Amaraweera, J. A.
A cost – effective automation system for Sri Lankan Libraries, Information Development

Fayen, E. G. The online catalogues : improving Public Access to Library materials
London : Knoweldge Industry, 1983

Coyle, Karen-The virtual Union Catalogue : a comparative study
D-lib Magazine, Vol. 6, No. 3,

URL : http://www.dlib.org/dlib/marchoo/coyle/03coyle.htnl.
(accessed on 02-10-2007)

Wikipedia-Union catalogue
http://en.wikipedia.org/wikipedia/union catalogue.html

goole scholar-union catalogue defenit
www.google.org/scholaw/unicat.asp

# Participatng Libraries of the National Union Catalogue of Sri Lanka

| | | |
|---|---|---|
| ACC | - | Arthur C.Clarke Centre of Modern Technologies |
| ART | - | Agrarian Research & Training Institute |
| BC | - | British Council |
| CB | - | Central Bank of Sri Lanka |
| CDI | - | Centre for Development Information |
| CEA | - | Central Environmental Authority |
| CRI | - | Coconut Research Institute |
| CARP | - | Council for Agricultural Research Policy |
| DAG | - | Department of Attorney General |
| DC | - | Department of Commerce |
| DCB | - | National dangerous Drugs Control Board |
| DCS | - | Department of Census and Statistics |
| DF | - | Department of Forest |
| DL | - | Department of Labour |
| DNM | - | Department of National Museum |
| DOL | - | Department of Official Languages |
| EDB | - | Sri Lanka Export Development Board |
| GSMB | - | Geological Survey of Mines Bureau |
| IB | - | Institute of Bankers |
| IE | - | Institute of Engineers |
| IPS | - | Institute of Policy Studies |
| ITI | - | Industrial Technological Institute |
| IWMI | - | International Water Management Institute |
| JRC | - | J. R. Jayawardena Cultural Centre |

| | | |
|---|---|---|
| KDU | - | Sir John Kothalawala Defence University |
| MAI | - | Marga Institute |
| NAC | - | Nadesan Centre |
| NIBM | - | National Institute of Business Management |
| NIE | - | National Institute of Education |
| NSF | - | National Science Foundation |
| NISS | - | National Sports Science School |
| PCT | - | Brandix College of Clothing Technology |
| PGIAR | - | Postgraduate Institute of Archaeology |
| PLA | - | Public Library - Anuradhapura |
| PLC | - | Public Library - Colombo |
| PLDM | - | Public Library – Dehiwala – Mount Lavinia |
| PLG | - | Public Library - Galle |
| PLGM | - | Public Library - Gampola |
| PLK | - | D. S. Senanayake Memorial Public Library - Kandy |
| PLN | - | Public Library - Negambo |
| PLS | - | Public Library – Seethawakapura |
| PLSJ | - | Public Library – Sri Jayawardenapura |
| RAS | - | Royal Asiatic Society |
| RRI | - | Rubber Research Institute |
| SAF | - | Sri Lanka Air Force Headquarters |
| SDA | - | Sri Lanka Institute of Development Administration |
| SFI | - | Sri Lanka Foundation Institute |
| SLA | - | Sri Lanka Library Association |
| SLS | - | Sri Lanka Standards Institution |
| SRC | - | Sri Lanka Rupavahini Corporation |

| | | |
|---|---|---|
| SLT | - | Sri Lanka Telecom |
| SSA | - | Social Scientists Association |
| TCA | - | Technical College - Anuradhapura |
| TCG | - | Technical College - Galle |
| TCM | - | Technical College – Matara |
| UBB | - | Buddha Sravaka Bhikku University |
| UBP | - | Buddhist & Pali University of Sri Lanka |
| UC | - | University of Colombo |
| UCM | - | Faculty of Medicine - University of Colombo |
| UE | - | Eastern University of Sri Lanka |
| UK | - | University of Kelaniya |
| UM | - | University of Moratuwa |
| UO | - | Open University of Sri Lanka |
| UP | - | University of Peradeniya |
| UR | - | University of Ruhuna |
| URA | - | University of Rajarata |
| URM | - | Faculty of Medicine – University of Ruhuna |
| USA | - | University of Sabaragamuwa |
| USE | - | South Eastern University |
| USJ | - | University of Sri Jayawardenapura |
| VP | - | Vidyalankara Pirivena – Kelaniya |
| WRF | - | Walpola Rahula Foundation Trust |
| WSD | - | National Water Supply & Drainage Board |

National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07
2. Date Scanned : 2017/10/21
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature : 

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : 

Date : 2017/10/21

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*